ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

2021 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ ගිණුම්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

අපගේ දැක්ම

ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසර හිතකාමී සහ තිරසාර පරිසරයක් නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම.

අපගේ මෙහෙවර

ඉහළ නිපුණතා සහ අභිප්‍රේරිත ශ්‍රම බලකායක් මඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා වැසි ජල අපවහනය, තෙත්බිම් කළමනාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ඉංජිනේරු සේවා සැපයීම.

පටුන

	පිටු අංකය
සභාපතිවරයාගේ පණිවුඩය	01
සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවුඩය	02
ආයතනික තොරතුරු	03
අධ්‍යක්ෂ මණ්ඩලය	04
ජ්‍යෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	05
සංවිධාන ව්‍යුහය	06
මෙහෙයුම් සමාලෝචනය	07
විගණන කමිටු වාර්තාව	08-81
මූල්‍ය සමාලෝචනය	82
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	83
විගණකාධිපති වාර්තාව	84
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	85-104
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	105
හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය	106
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය	107
සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	108
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	109-112
අගය එකතු කිරීම පිළිබඳ ප්‍රකාශනය	113-125
සංස්ථාවේ මූල්‍යමය විශේෂතා	126

සභාපතිවරයාගේ පණිවුඩය

2021 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවේ (SLLDC) වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම් ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටක් ගෙන දෙයි. ශ්‍රී ලංකාව 'ආසියාවේ ආශ්චර්යය' බවට පත්කිරීමේ අනිගරු ජනාධිපතිතුමාගේ දැක්ම යථාර්ථයක් බවට පත් කිරීම උදෙසා වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. රට තුළ පැවති වසංගත තත්ත්වයේදී වුවද SLLDC සඳහා ඉතා සාර්ථක වසරක් ප්‍රකාශ කිරීමට ලැබීම සම්බන්ධයෙන් මා සතුටට පත්වන අතර මෙය ඇත්තෙන්ම සතුටු අවස්ථාවකි අනිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ ගරු. වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ මගපෙන්වීම සහ උපාය මාර්ගික නායකත්වය යටතේ සංස්ථාව අභිතකර බාහිර තත්ත්වයන් හමුවේ නොසැලෙමින් බොහෝ අංශවලින් වැඩිදියුණු වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ දැක්ම සමඟ මනාව ගැලපුණු බව මම විශ්වාස කරමි. 2021 මූල්‍ය වර්ෂය සංස්ථාවට සාර්ථක වසරක් වූ බව සටහන් කිරීමට මා සතුටු වන අතර හිටපු සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම යටතේ කොවිඩ්-19 තත්ත්වය යටතේ මනාව ඉටු කරන ලද කාර්යය සඳහා SLLDC හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මම සුබ පතමි.

වර්ෂය තුළදී ලබා දුන් ඔවුන්ගේ වටිනා මගපෙන්වීම සහ දායකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කළමනාකාරීත්වයට ස්තුති කරමින් අවසන් කිරීමට කැමැත්තෙමි. අපගේ සේවකයින්ට සහ විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන්ට ද මම ස්තුතිවන්ත වෙමි, ඔවුන්ගේ කැපවීම නොවන්නට වර්තමාන කාර්ය සාධනය සාක්ෂාත් කළ නොහැකි වනු ඇත. සෑම විටම මෙන්, මම අපගේ ගනුදෙනුකරුවන්ට ස්තුතිවන්ත වන අතර ඉදිරි මූල්‍ය වර්ෂයේදී ඔවුන්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් ඉටු කිරීමට බලාපොරොත්තු වෙමි.

ඉංජි. කොමදෝරු හිරාන් එස්. බාලසූරිය
සභාපති
2022 මාර්තු 31

සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවුඩය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම මගේ සතුටට කරුණකි. සංස්ථාව සිය මෙහෙයුම්වල තිරසර බව සහතික කිරීම සඳහා වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද සිය ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී.

සංස්ථාව මිලියන 6,793 ක ආදායමක් සහ රු. මිලියන 1,023 ක බදු පසු ලාභයක් වාර්තා කරන ලදී. මෙයට සේවාදායක සහ ස්වයං ව්‍යාපෘති එනම් ඇළ මාර්ග හැරීම, ගොඩකිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති, දේශීය කර්මාන්ත සඳහා මුහුදු වැලි විකිණීම සහ පොහොර ව්‍යාපෘතිය හරහා උපයන ආදායම ද මෙයට ඇතුළත් වේ.

මුළු පිරිවැටුම රු. මිලියන 2,351 ක් වූ මුහුදු වැලි කියුබ 317,846.04 ක දක්වා වූ පරිමාවක් විකිණීම සංස්ථාවට ඉහළම අදායම් දායකත්වයක් ලබා දී ඇත.

2012 වර්ෂයේදී ආරම්භ කරන ලද වෙරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ගංවතුර අවම කිරීම, ඇළ මාර්ගවල ගලා බැසීමේ ධාරිතාව, ගංවතුර රඳවාගැනීමේ හැකියාව වැඩි කිරීම සහ ප්‍රධාන වශයෙන් නුගේගොඩ, රත්නපිටිය සහ බොරලැස්ගමුව ප්‍රදේශවල වෙරැස් ගඟ ද්‍රෝණියේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2018 අවසන් වන විට කොළඹ සහ ඒ අවට ගංවතුර අවම කිරීම සඳහා කොළොන්නාව වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කැලණි ගඟේ ගංවතුර ද්‍රෝණියෙහි කොළොන්නාව ප්‍රදේශයේ සහ ඒ අවට බෝක්කු වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරන ලදී. 2021 වර්ෂය තුළ ප්‍රධාන ඇළ මාර්ග තුනක සැලසුම් කටයුතු නිම කරමින් මල්පුර සහ වැලිවල ඇළ ඉවුර වැනි බෝක්කු වැඩිදියුණු කිරීම සිදු කර ඇත. 2021 වර්ෂය අවසානය දක්වා සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මි. 482.57 කි.

කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශාන්ත සෙබස්තියන් උතුරු දියගුළු, ශාන්ත සෙබස්තියන් දකුණු දියගුළු සහ අඹතලේ යන ස්ථානවල පොම්පාගාර ඉදිකිරීම අවසන් කර ඇත. ගොතටුව බැම්මේ සහ කළුපාලමේ ගේට්ටු ව්‍යුහයන් සහිතව කිත්තම්පහුව ඇළ වැඩිදියුණු කිරීම ද අවසන් කර ඇත.

2021 අංක 13 දරන සංස්ථා පනත සංශෝධනය කිරීමත් සමඟ සංශෝධිත පනතේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන පුද්ගලයන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාවට පූර්ණ බලතල පැවරී ඇති බව මෙහිදී ප්‍රකාශ කිරීමේ අයිතිය මා සතු වේ. ඒ අනුව, සංස්ථාව විසින් ගොඩනැගිලි, හෝ ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා, හැරීමට හෝ පිරවීම් ඉවත් කිරීමට සහ ගොඩකිරීමට හෝ ඉදිකිරීම් සඳහා භාවිතා කරන පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීමට, යම්කිසි මෙවලම්, උපකරණ, යන්ත්‍රෝපකරණ යනාදිය සහ එවැනි කටයුතු සඳහා භාවිතා කරන ලියකියවිලි ඇතුළු වාහන රැගෙන යාමට අධිකරණයෙන් නියෝග ලබා ගත හැක. මේ සම්බන්ධයෙන් සංස්ථාව දරන ලද වියදම් සම්පූර්ණයෙන් අයකර ගැනීම සඳහා ද මෙම සංශෝධිත පනතේ ප්‍රතිපාදන සලසා ඇත."
සියලුම ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවලදී සංස්ථාව සිය සමස්ත ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ ලාභදායිත්වය වැඩිදියුණු කර ඇති අතර එමඟින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගෙන ඇත.

මෙම ආයතනයේ විශය පථය තුළ ඉංජිනේරු විශිෂ්ටත්වය සහ සම්පත් භාවිතා කරමින් තිරසර, පරිසර හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උපායමාර්ගික හවුල්කරුවෙකු ලෙස සංස්ථාව රටේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

අවසාන වශයෙන්, 2021 වර්ෂය සඳහා අප සැලසුම් කර තිබූ වැඩකටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ මගපෙන්වීම සහ නායකත්වය ලබා දීම සම්බන්ධයෙන් ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා, ගරු නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යතුමා, ගරු වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා සහ අමාත්‍යාංශයේ සහ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරුන් වෙත මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව 2022 වර්ෂය සඳහා සූදානම් වන අවස්ථාවක, ඔවුන්ගේ වටිනා උපදෙස් සහ අඛණ්ඩ සහයෝගය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ස්තූතිවන්ත වෙමි. අභියෝගාත්මක වසරක් තුළ ඔවුන්ගෙන් අපේක්ෂා කරන ලද ප්‍රතිඵල ලබා දීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ සංස්ථාවේ සියලුම සේවකයින්ට ස්තූති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. අමාත්‍යාංශයේ සහ රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අනෙකුත් ආයතනවල නිලධාරීන්ට, අපගේ සැපයුම්කරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට සහ සමාලෝචිත වර්ෂය සාර්ථක කර ගැනීමට විවිධ ආකාරවලින් අපට උපකාර කළ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ට මගේ කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි.

ඉංජි. ශ්‍රීමතී සේනාධීර
සාමාන්‍යාධිකාරී
දිනය: 2022.03.01

ආයතනික තොරතුරු

නීතිමය තත්ත්වය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පෙර කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම්) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය යනුවෙන් සහ ඉන් පසුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ලෙස හඳුන්වනු ලැබූ) 1968 අංක 15 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කරන ලදී. 1976 අංක 27 දරන සංශෝධන පනතින් සංස්ථාවේ පරමාර්ථ පුළුල් කරන ලදී. 1982 අංක 52 දරන සංශෝධන පනතින් මණ්ඩලයේ නම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් වෙනස් කොට මුළු දිවයිනම ආවරණය වන පරිදි එහි අධිකාරි බලය පුළුල් කරන ලදී. 2006 අංක 35 දරන පනතින් ඉහත කී පනත තවදුරටත් සංශෝධනය කරන ලද අතර අනවසර ගොඩකිරීම් සහ ජල මූලාශ්‍ර දූෂණය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය එමඟින් සංස්ථාව වෙත පවරා ඇත. තවද, 2019 අංක 11 දරන පනතින් සංස්ථාව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ලෙස නැවත නම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලය
අංක 3, ශ්‍රී ජයවර්ධනපුර මාවත
වැලිකඩ
රාජගිරිය.
දුරකථන අංකය: 2867369
ඊ-මේල්: mail@sllrdc.lk
වෙබ් අඩවිය: www.landdevelopment.lk

ප්‍රාදේශීය කාර්යාල

- **උතුරු කොළඹ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අවිස්සාවේල්ල පාර
  ඔරුගොඩවත්ත
  වැල්ලම්පිටිය
  දුරකථන අංකය :2532600

- **නැගෙනහිර කොළඹ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක. 28/10 ඒ කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය; 2863205

- **දකුණු කොළඹ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 19, ස්ටැෆෝඩ් පාර,
  කොළඹ 06
  දුරකථන අංකය: 2589862

- **මුතුරාජවෙල**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 123, කෙළවරපිටිය
  හැඳල, වත්තල.
  දුරකථන අංකය: 3193130

අනුබද්ධික සමාගම්

- සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO)
  අංක 28/10ඒ, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය:2876608
  ඊ-මේල්: lrdcltd1@gmail.com

- එල්.ආර්.ඩී. සර්විසස් (පෞද්.) සමාගම
  අංක 28/10, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය. 2861948
  ඊ-මේල්: info@lrdcservices.com

විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව
බත්තරමුල්ල.

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව

නීති උපදේශකවරුන්
නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
අළුත්කඩේ
කොළඹ 12.

අධ්‍යක්ෂ මණ්ඩලය

නම	**තනතුර**	**කාල පරිච්ඡේදය**
මේජර් ජනරාල්(විශ්‍රාමික) එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා USP psc MSc (Defence))	සභාපති ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	05.12.2019 සිට
ඉංජි. නිහාල් සිරිවර්ධන මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	18.05.2020 සිට මේ දක්වා
යූ.එන්. මල්ලවආරච්චි මහතා	භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය	13.01.2020 සිට මේ දක්වා
එන්.එච්.එන්.එල්. නවරත්න මහතා	අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ කළමනාකරු – සුභසාධන NSB ප්‍රධාන කාර්යාලය	07.01.2020 සිට මේ දක්වා
දිනේෂ් ජයවීර මහතා	අධ්‍යක්ෂ නීතීඥ	07.01.2020 සිට මේ දක්වා
ඩී.පී. නන්දන දිසානායක මහතා	අධ්‍යක්ෂ කථිකාචාර්ය ගිණුම්කරණ සහ රාජ්‍ය මුදල්	25.06.2021 සිට මේ දක්වා
එච්. කේ. චමත් තාරුක අල්විස් මහතා	අධ්‍යක්ෂ සම්බන්ධීකරණ ලේකම්	23.02.2021 සිට මේ දක්වා


2021 වර්ෂය තුළ විශ්‍රාම ගැන් වූ අධ්‍යක්ෂවරුන්

ගෘහ නිර්මාණ ශිල්පී හර්ෂණ ද සිල්වා මහතා	අධ්‍යක්ෂ වරලත් ගෘහ නිර්මාණශිල්පී	23.01.2020 – 28.07.2021
එච්.ජී.සී.ජේ. ජයසිංහ මහතා	අධ්‍යක්ෂ දෘෂ්ටි විශේෂඥ	07.01.2020 - 28.07.2021

ජ්‍යෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

01.	ඉංජි. එම් ඒ එස් එම් කේ සේනාධීර මිය	-	සමාන්‍යාධිකාරී
02.	ඉංජි. ඩබ්ලිව් ආර් සී ප්‍රනාන්දු මයා	-	අතිරේක සමාන්‍යාධිකාරී (සැලසුම් හා නිර්මාණ)
03.	ඉංජි. සී බී අමරසිංහ මයා	-	අතිරේක සමාන්‍යාධිකාරී (ක්‍රියාත්මක කිරීම)
04.	ඉංජි. ඩබ්ලිව් එච් කීර්තිරත්න මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (පර්යේෂණ සහ සැලසුම්)
05.	ජේ ඒ පී කේ ජයසිංහ මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මූල්‍ය)
06.	ඉංජි. එස් පී මුතුමාල මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (ජලාපවහන සහ ගොඩකිරීම්)
07.	ඉංජි. ආර් එම් එන් ඩී රත්නායක මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති)
08.	ඉංජි. ඒ එච් තුෂාරි මිය	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති)
09.	ඉංජි. වයි පී සී ද සිල්වා මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (ඉදිකිරීම්)
10.	ආචාර්ය එන් එස් විජේරත්න මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (තෙත්බිම් කළමනාකරණ)
11.	ආචාර්ය එස් ඩී ධර්මරත්න මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (සැපයුම් සහ ගබඩා)
12.	ඉංජි. එස් ආර් එම් ප්‍රසාද් මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (පිරියත සහ යන්ත්‍රෝපකරණ)
13.	ඉංජි. ඕ වී ඩබ්ලිව් ආර් ගුණතිලක මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන)
14.	හේමන්ත කමලසිරි මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (ඉඩම් සහ අළෙවිකරණ)
15.	මේජර් ජෙනරාල් ඊ කේ ජේ කේ විජයසිරි මයා (විශ්‍රාමික) Lsc, MPA (PIM - USJ)	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ)
16.	ඒ එල් ඒ එස් කේ අඹේගොඩ මයා	-	නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක) - වැඩබලන
17.	එච් කේ කේ ඩබ්ලිව් ඒකනායක මිය	-	ප්‍රධාන නීති නිලධාරී
18.	ඉංජි. පී එම් පී විජේරත්න මිය	-	සහකාර සමාන්‍යාධිකාරී (පර්යේෂණ සහ සැලසුම්)
19.	ඉංජි. එස් එන් ගමගේ මිය	-	සහකාර සමාන්‍යාධිකාරී (පර්යේෂණ සහ සැලසුම්)
20.	ඒ බී එන් සහබන්දු මිය	-	සහකාර සමාන්‍යාධිකාරී (මූල්‍ය)
21.	ඉංජි. කේ එම් එන් කේ රණසිංහ මයා	-	සහකාර සමාන්‍යාධිකාරී (ඉදිකිරීම්)
22.	ඉංජි. එම් එම් එම් මවුෆර් මයා	-	සහකාර සමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති)
23.	ඉංජි. එස් එම් පී ඩී සිරිවර්ධන මයා	-	සහකාර සමාන්‍යාධිකාරී (ජලාපවහන සහ ගොඩකිරීම්)
24.	ඉංජි. එන් ඒ ඒ එස් වී නිශ්ශංක මයා	-	සහකාර සමාන්‍යාධිකාරී (තෙත්බිම් කළමනාකරණ)
25.	ඉංජි. එන් පී එස් ද සිල්වා මයා	-	සහකාර සමාන්‍යාධිකාරී (පර්යේෂණ සහ සැලසුම්)
26.	එල් ත්‍රිමාවිතාන මහතා	-	සහකාර සමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ)
27.	ඉංජි. පී පී විනීතා මිය	-	සහකාර සමාන්‍යාධිකාරී (පර්යේෂණ සහ සැලසුම්)
28.	එන් ඒ වික්‍රමනායක මයා	-	වැඩබලන සහකාර සමාන්‍යාධිකාරී (ඉඩම් සහ අළෙවිකරණ)

සංවිධාන ව්‍යුහය


CHAIRMAN
GENERAL MANAGER
SECRETARY TO THE BOARD
BOARD OF DIRECTORS
ADDITIONAL GENERAL MANAGER (Planning & Design)
ADDITIONAL GENERAL MANAGER (Implementation)
Senior Management Level
Middle Management level
Junior Management level
Associate Officer level
Management Assistant- Technical
Management Assistant- Non-technical
Primary level Skilled/ semi skilled/ un skilled

මෙහෙයුම් සමාලෝචනය

ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය

1. භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

1.1 ඇළ මාර්ග, ජලාශ සහ ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම

2021 වසර සඳහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා කරමින් කොළඹ පුරවර ප්‍රදේශයේ සහ තදාසන්න ප්‍රදේශවල පිහිටි ඇළ මාර්ග, වැව්, ඇවිදීමේ මංතීරු සහ විනෝදාත්මක ප්‍රදේශ නඩත්තු කිරීම සඳහා ජලාපවහන හා ගොඩකිරීමේ අංශය විසින් රු.මි. 607 ක් භාවිතා කර ඇත.

ඇළ මාර්ග නඩත්තු කිරීම:

පරිසර දූෂණයෙන් තොර පිරිසිදු හා ආකර්ෂණීය පරිසරයක් සහතික කිරීම සඳහා කොළඹ මහනගර කලාපය තුළ සහ ඒ අවට;

- කි.මී. 44 ක් දිගින් යුත් ප්‍රධාන ඇළ මාර්ග
- කි.මී. 52 ක් දිගින් යුත් ද්විතියික ඇළ මාර්ග


නඩත්තු කිරීමේ SLLDC නිරතව සිටී.

වැව්/ජලාශ නඩත්තු කිරීම:

- දියවන්නාව (දියත උයන) වැව
- පාර්ලිමේන්තු ජලාශය
- බෙල්ලන්විල වැව
- තලවතුගොඩ වැව
- රම්පලාවත්ත ජල රැඳවුම් පොකුණ
- බෙරේ වැව

අවිදීමේ මංතීරු නඩත්තු කිරීම

- දියත උයන
- ජපන් මිත්‍රත්ව මාර්ගය
- කිඹුලාවල
- මාලඹේ
- බෙල්ලන්විල
- නුගේගොඩ තෙත්බිම් උද්‍යානය
- බොරලැස්ගමුව "කෙළිමඩල"



1.1.1 කොළඹ නගරය තුළ සහ අවට ප්‍රධාන ඇළ මාර්ග, කුඩා ඇළ මාර්ග සහ ද්විතීයික ඇළ මාර්ග නඩත්තු කිරීම

ප්‍රාදේශීය ගංවතුර වැළැක්වීම කොළඹ සහ ඒ අවට ඇළ මාර්ග නඩත්තු කිරීමේ ප්‍රධාන අරමුණ වන අතර ප්‍රාදේශීය ගංවතුර වැළැක්වීම සඳහා කොළඹ මහ නගර සභාව සහ අනෙකුත් අදාළ පාර්ශ්වකාර නියෝජිතායතනවල මැදිහත්වීමෙන් සිදු කර ඇත.

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් දෑ ඇතුලත් විය,

- මතුපිට පිරිසිදු කිරීම.
- ඇළ ඉවුරු නඩත්තු කිරීම සහ කැලෑව ශුද්ධ පවිත්‍ර කිරීම
- ඇළ මාර්ග හෑරීමේ කාර්යයන් සහ භාරා ඉවත් කරනු ලබන දෑ ප්‍රවාහනය කිරීම
- ගේබියන් බිත්ති භාවිතා කරමින් ඇළ ඉවුරු ආරක්ෂා කිරීම
- දියවළ පිරිසිදු කිරීම සහ පැති කාණු පිරිසිදු කිරීම ආදිය

අතින් පිරිසිදු කිරීමට අමතරව, ඇළ ඉවුරු සහ ඒ අවට ප්‍රදේශ හෑරීමට හා පිරිසිදු කිරීමට ඩ්‍රෙජර්, කැණීම් යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර, ට්‍රැක්ටර් සහ ට්‍රක් රථ වැනි බර යාන්ත්‍රික උපකරණ සංස්ථාව විසින් යොදවනු ලැබේ.

මෙහෙයුම් කටයුතු සඳහා, SLLDC විසින් ඔරුගොඩවත්ත (උතුරු කොළඹ), නාවල කිරිමණ්ඩල මාවත (නැගෙනහිර කොළඹ) සහ කිරුළපන (දකුණු කොළඹ) යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල 03ක් පවත්වාගෙන යයි.

1.1.1.අ උතුරු කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග නඩත්තු කිරීම



ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගය



දෙමටගොඩ ඇළ මාර්ගය

- **ප්‍රධාන ගැටලු**

අනෙකුත් ප්‍රදේශවලට වඩා උතුරු කොළඹ ප්‍රදේශවල ඇළ මාර්ග ආසන්නයේ නේවාසික ජනගහනය වැඩි වශයෙන් දක්නට ලැබේ. ඇළ ආශ්‍රිතව ජීවත් වන ජනතාව ඉහළ අධ්‍යාපන මට්ටමක නොසිටින අතර ඇළෙහි සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳ අඩු අවබෝධයක් ඇති අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට වගකිව යුතු පළාත් පාලන ආයතන මෙම ප්‍රදේශවලින් කසළ එකතු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොමැත.
එබැවින් ඔවුන්ගේ පහසුව තකා ඝන අපද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය නල මාර්ග ඇළට බැහැර කිරීම සිදු කරනු ලැබේ. නඩත්තු කිරීම යටතේ ඇළ මාර්ගවල ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම ප්‍රධාන කාර්යයක් විය. ජලයෙහි ඇති අපද්‍රව්‍ය හසුකර ගැනීම සහ එකතු කිරීම දුෂ්කර, පිරිවැය ඵලදායී නොවන ජලාශවලට සහ ඒවායේ ජෛව විවිධත්වයට හානි සිදු වන ක්‍රියාවලියකි.



අසල්වැසියන් විසින් ඇළ මාර්ගයට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම



ඇළ ඉවුරට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම

1.1.1.ආ නැගෙනහිර කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග නඩත්තු කිරීම



හීන් ඇළ මාර්ගය



කෝට්ටේ ඇළ මාර්ගය

1.1.1.ඇ දකුණු කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග නඩත්තු කිරීම



වැල්ලවත්ත ඇළ මාර්ගය



දෙහිවල ඇළ මාර්ගය

- **ප්‍රධාන ගැටලු**

ඇළ ආශ්‍රිතව ජීවත් වන ජනතාව විසින් කැළිකසළ/ඝන අපද්‍රව්‍ය ඇළ මාර්ගවලට බැහැර කිරීම සිදු කරන ලදී. අවසානයේදී මෙම පාවෙන ඝන අපද්‍රව්‍ය දෙහිවල සහ වැල්ලවත්ත පිටවාන හරහා මුහුදට එකතු වීම සිදු විය. වෙරළබඩ පරිසරයේ ජෛව විවිධත්වය පිරිහීම මෙයට හේතු විය හැක. අවම කිරීමේ ක්‍රමය ලෙස, පාවෙන ඝන අපද්‍රව්‍ය වෙන කර ගැනීම සඳහා කසළ බාධක හඳුන්වා දී ඇති අතර එය තරමක් දුරට විසඳුම වනු ඇත. එබැවින්, SLLDC විසින් දිනපතා සිදු කරනු ලබන මතුපිට පිරිසිදු කිරීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකමකි. ජලයෙහි පවතින අපද්‍රව්‍ය හසුකර ගැනීම සහ එකතු කිරීම දුෂ්කර මෙන්ම පිරිවැය ඵලදායී නොවන කාර්යයකි.





2021 වර්ෂය තුළ SLLDC කොළඹ ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීම සඳහා සහභාගී වී ඇති අතර සිදු කර ඇති මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන260 කි.

1.1.2 හැමිල්ටන් ඇළ මාර්ගය නඩත්තු කිරීම

2021 වර්ෂයේදී හැමිල්ටන් ඇළ මාර්ගයේ කැලණි ගඟ අන්තයේ මීගමුව කලපුව දක්වා (දිග කි.මී. 14.3) සහ මහ ඔය අන්තය දක්වා (දිග කි.මී. **7.7**ක) අවශ්‍ය අවස්ථාවල නිරන්තර නඩත්තු කටයුතු සිදු කරන ලදී**.**

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් දෑ ඇතුලත් විය,

- මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුරු නඩත්තු කිරීම
- ඇළ මාර්ග හැරීමේ කාර්යයන් සහ හාරා ඉවත් කරනු ලබන දෑ ප්‍රවාහනය කිරීම
- ගේබියන් බිත්ති භාවිතා කරමින් ඇළ ඉවුරු ආරක්ෂා කිරීම





ඒ අනුව 2021 වර්ෂය සඳහා සිදු කරන ලද නඩත්තු කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 25 කි.


1.1.3 පාර්ලිමේන්තුව සහ ඒ ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශය අවට වැව/ පොකුණු නඩත්තු කිරීම

පාර්ලිමේන්තුව පවා ජලයෙන් යට වූ 2010 නොවැම්බර් 11 වැනි දින පෙර නොවූ විරූ ගංවතුරකට විසඳුමක් ලෙස SLLDC විසින් ජලාපවහන යෝජනා කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. මහා භාණ්ඩාගාර අරමුදල් යටතේ එම ජලාපවහන පද්ධති ගංවතුර සමයේදී පාර්ලිමේන්තුව සහ ඒ අවට ප්‍රදේශ වන චෝටර්ස් එජ්, දියවන්නා උද්‍යානය, රම්පලාවත්ත, තලවතුගොඩ වැනි ප්‍රදේශ ජලයෙන් යටවීමෙන් ආරක්ෂා කිරීම සඳහා නිරන්තරයෙන් නඩත්තු කරන ලදී.

නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් කාර්යයන් ඇතුලත් විය,

- පෝෂණ ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
- ජලාශය මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුර, රක්ෂිත ප්‍රදේශය, සීමා මායිම්, ඇවිදීමේ මාර්ගය සහ විනෝදාත්මක ප්‍රදේශ නඩත්තු කිරීම.
- වැව/පොකුණ හැරීම මඟින් ගංවතුර රඳවා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- වැව්/පොකුණු අනවසරයෙන් අත්පත් කර ගැනීම පාලනය කිරීම
- කිඹුලාවල පිහිටි ඉඩම් කෘෂිකාර්මික ඉඩම් බවට පත් කිරීම

1.1.3. අ වෝටර්ස් එජ් හි වැව – දියවන්නා ජලාශය



1.1.3.ආ කිඹුලාවල පිහිටි වැව්





මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ,

- දැනට පවතින ඇවිදීමේ මාර්ගවලින් අනවසර අත්පත් කර ගැනීම් වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලාශවල ජලයෙහි තත්ත්වය වැඩිදියුණු වීම.

පාර්ලිමේන්තුවේ ඉහළ ජල පෝෂක ප්‍රදේශය සහ ඒ අවට පදිංචිකරුවන්ට විශේෂයෙන් ප්‍රතිලාභ ලැබී ඇති අතර සමස්තයක් ලෙස කොළඹ ප්‍රදේශයටම ගංවතුර ආරක්ෂණයෙන් ප්‍රතිලාභ ලැබී ඇත.

2021 වර්ෂය තුළ පාර්ලිමේන්තුව අවට වැව්/පොකුණු සහ ඒ ආශ්‍රිත ජල පෝෂක නඩත්තු කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 65.78 කි.

1.1.4 බෙල්ලන්විල ප්‍රදේශයේ සූර්ය ආලෝක පද්ධතිය ඇතුළු වැව්/පොකුණු, ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ස්ථාන නඩත්තු කිරීම

බෙල්ලන්විල ප්‍රදේශ, කොළඹ නගරයේ දකුණු ප්‍රදේශය තුළ පිහිටා ඇති ශීඝ්‍රයෙන් සංවර්ධනය වන ප්‍රදේශයක් වේ. මෙම ප්‍රදේශය වැසි කාලයේ නිරන්තරයෙන් ජලයෙන් යට වේ. වේරැස් ගඟ වැසි ජල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශයේ සමාජ හා සංස්කෘතික පසුබිම වැඩිදියුණු කිරීම සඳහා උපකාර වන කෘෂිකාර්මික ඉඩම් සමඟ වැව් සහ ඇළ මාර්ග පද්ධති නිර්මාණය කිරීම වැනි දිගුකාලීන ගංවතුර අවම කිරීමේ යෝජනා ක්‍රියාත්මක කරන ලදී.

ජලාපවහනය ක්‍රියාත්මක කිරීමත් සමඟ බෙල්ලන්විල ඇවිදීමේ මංතීරු සහ පාපැදි ධාවන පථය ජල රැඳවුම් මායිම සඳහා සීමා සලකුණු කිරීමක් ලෙස සංවර්ධනය කරන ලදී. ඇවිදීමේ සහ පාපැදි ධාවන පථයේ ප්‍රධාන අරමුණක් ලෙස තවදුරටත් අවනසරයෙන් අත් පත් කර ගැනීම් වැළැක්වී ඇත. ප්‍රධාන අරමුණට අමතරව මහජනතාවට පහත අතුරු ප්‍රතිලාභ ලැබී ඇත.

නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් කාර්යයන් ඇතුලත් විය,

- ඇවිදීමේ මංතීරු සහ පාපැදි ධාවන පථ නඩත්තු කිරීම
- ජලාශය මතුපිට පිරිසිදු කිරීම
- අවට ප්‍රදේශයෙන් හරිත දර්ශන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා තණබිම් ප්‍රදේශය නඩත්තු කිරීම
- උඩු ගඟ බෙල්ලන්විල කුරුළු අභයභූමිය සඳහා නිර්මාණය කරන ලද පාරිසරික සංවර්ධනයක් නඩත්තු කිරීම සහ නිර්මාණය කිරීම
- විනෝදාස්වාද ස්ථාන නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම

මෙම ගොඩනැගිය හැකි ප්‍රදේශයේ වාර්ෂික නඩත්තු කටයුතු SLLDC විසින් නිර්මාණය කරන ලද හරිත නගරයේ තිරසරභාවය සඳහා ඉතා වැදගත් වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ,

- දැනට පවතින ඇවිදීමේ මාර්ගවලින් අනවසර අත් පත් කර ගැනීම් වැළැක්වීම
- ජලාශය, වාහන නැවැත්වීමේ ස්ථාන සහ සේවා මාර්ගය පිරිසිදු කිරීම මගින් එම ප්‍රදේශය අවට ව්‍යායාම සඳහා ජනතාව පෙළඹවීමෙන් ජනතාවගේ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම.
- ජලාශවල ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.
- ගංවතුර කාලවලදී මාර්ගයේ පස් බාදනය වැළැක්වීම.
- සූර්ය ආලෝක පද්ධතිය භාවිතයෙන් පිරිවැය අවම කිරීම

ඒ අනුව වැඩ කටයුතු සිදු කර ඇති අතර 2021 වර්ෂය සඳහා සිදු කරන ලද නඩත්තු කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 41.66 කි







1.1.5 සූර්ය ආලෝක පද්ධතිය ඇතුළුව ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ස්ථාන නඩත්තු කිරීම

වාණිජ අගනුවර සහ එහි තදාසන්න ප්‍රදේශවල පරිසර හිතකාමී හරිත පරිසරයක් නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීමේ අරමුණින් කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දියත උයන උද්‍යානය, වැව, නාවල තෙත්බිම් උද්‍යානය, ජපන්-ශ්‍රී ලංකා මිත්‍රත්ව මාර්ගය, රම්පලාවත්ත වැව සහ කිඹුලාවල ප්‍රදේශය සංවර්ධනය කිරීම වැනි ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කර ඇත.

මෙම ව්‍යාපෘති යටතේ ජපාන මිත්‍ර මාර්ගය, වෝටර්ස් ඒජ්, කිඹුලාවල, චන්ද්‍රිකා කුමාරණතුංග මාවත වැනි ජල රැඳවුම් ප්‍රදේශවලට යාබද ප්‍රධාන මාර්ග සහ අනෙකුත් වැදගත් ස්ථාන ජල තරංගවලින් සිදු වන බාදනය වීමෙන් ආරක්ෂා කිරීම සඳහා පරිසර හිතකාමී තණ පිඬැලි අල්ලන ලද ද්විතියික ඇළ ඉවරු, නිර්මාණය කරන ලද රැඳවුම් පොකුණු හඳුන්වා දී ඇත. එසේම ඉඩම් අනවසරයෙන් අත් පත් කර ගැනීම වැළැක්වීම සඳහා ඇවිදීමේ මාර්ග හඳුන්වා දී ඇත.

මෙම උද්‍යාන නඩත්තු කිරීම SLLDC විසින් සිදු කර ඇත

- ජලාශ පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම අවට හරිත පරිසරයක් නිර්මාණය කරමින් තණ පිඩලි අල්ලන ලද ප්‍රදේශය නඩත්තු කිරීම
- සංවර්ධිත නාගරික භූමි අලංකරණය සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම (ඉවුර ඔස්සේ ගස් සිටුවීම)
- සමාජ ක්‍රියාකාරකම් සඳහා නිර්මාණය කරන ලද ස්ථාන නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම
- සංචාරක පාදක ව්‍යාපාර මඟින් නව රැකියා අවස්ථා ඇති වීම සහ අලංකාර දර්ශනක් ඇති වීම

1.1.5. අ වෝටර්ස් එජ් හි ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම





1.1.5. ආ කිඹුලාවල ඇවිදීමේ මංතීරුව නඩත්තු කිරීම





ජපන්-ශ්‍රී ලංකා මිත්‍රත්ව මාර්ගයට යාබද ඇවිදීමේ මංතීරුව





කිඹුලාවල ඇවිදීමේ මංතීරුව

1.1.5. ඇ නැගෙනහිර කොළඹ ප්‍රදේශයේ ඇවිදීමේ මංතීරුව නඩත්තු කිරීම





පාගොඩ තෙත්බිම් උද්‍යානය

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ,

- දැනට පවතින ඇවිදීමේ මාර්ගවලින් අනවසර අත් පත් කර ගැනීම් වැළැක්වීම
- ජලාශය, වාහන නැවැත්වීමේ ස්ථාන සහ සේවා මාර්ගය පිරිසිදු කිරීම මගින් එම ප්‍රදේශය අවට ව්‍යායාම සඳහා ජනතාව පෙළඹවීමෙන් ජනතාවගේ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම.
- ජලාශවල ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.
- සූර්ය ආලෝක පද්ධතිය භාවිතයෙන් පිරිවැය අවම කිරීම

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 67.78 කි

1.2 වර්ෂා කාල/ගංවතුර කාලවලදී ඇළ මාර්ග, වැව් සහ ජලාපවහන ව්‍යුහයන් පිරිසිදු කිරීම (SLLDC විෂය පථයට අයත් නොවන ඇළ මාර්ග, වැව් සහ ජලාපවහන ව්‍යුහයන්)

කිසිදු ආයතනයක විෂය පථය යටතට නොගැනෙන බොහෝ ද්විතියික ඇළ මාර්ග කිසිදු ආයතනයක් විසින් නඩත්තු කිරීමක් සිදු නොකරමින් පවති. වගකිව යුතු නොවන බැවින් සෑම ආයතනයක්ම මෙම කාර්යයෙන් ඉවත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇළ මාර්ග පළල අඩුවීම සහ ඇළ මාර්ග අවහිර වීම හේතුවෙන් සුළු ගංවතුර ගැටලු රාශක් ඇති විය. මෙම ගැටලුව අවම කිරීම සඳහා මෙම ද්විතියික ඇළ මාර්ග සහ සම්බන්ධක ඇළ මාර්ග වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. එබැවින් මෙම ද්විතියික ඇළ මාර්ග නඩත්තු කිරීමද SLLDC විසින් සිදු කරඇත. එසේම පවතින ද්විතියික ඇළ මාර්ග වැඩිදියුණු කිරීම හේතුවෙන් ගංවතුරෙන් තොර පරිසරයක් ඇති වේ.

මෙම ව්‍යාපෘතියේන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ,

- ඇළ මාර්ග හා එහි රක්ෂිත අනවසරයෙන් අත් පත් කර ගැනීමෙන් වැළැක්වීම
- නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවේශ මාර්ග ලබා දීම
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, මලාපවහන බැහැර කිරීම පාලනය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ,

- ප්‍රාදේශීය ගංවතුර හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතාවයන් වැළැක්වීම
- සම්පූර්ණ ඇළ පද්ධතියේ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම
- මුළු පරිසරයම පිරිසිදුව හා අලංකාරව තබා ගැනීම

ඒ අනුව 2021 වසර සඳහා මෙම ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 9.68 කි.

පැලියගොඩ මැනිං වෙළඳපොළේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන්.





1.3 ආපදා තත්ත්වයකදී ඉල්ලා සිටින විට පොදු ස්ථානවල ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ ගංවතුර සම්බන්ධ ගැටලු සඳහා පිළියම් යෙදීම

නිරන්තර ගංවතුර ශ්‍රී ලංකාවේ ස්වාභාවික උවදුරුවල වඩාත්ම විනාශකාරී ආකාරයයි. ජීවිත හානි සහ දේපළ හානි යන දෙකටම අදාළව මෙය සත්‍යයකි. එය ස්වභාවික උපද්‍රවවල වඩාත් ප්‍රචලිත ආකාරය ද වේ. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සාමාන්‍ය ජනතාවට බලපාන ගැටලු නිරාකරණය කර ගැනීමට පිළියම් යෙදිය යුතු වේ.

පසුගිය වසර කිහිපය තුළ බස්නාහිර පළාතේ පිහිටි පොදු ස්ථාන, සමිති සහ ආගමික ස්ථාන විසින් මාකේවිට ප්‍රදේශයේ පර්යන්ත ඇළ මාර්ගය එළිපෙහෙළි කිරීම, සපුගස්කන්ද වගුරු බිම් ප්‍රදේශය එළිපෙහෙළි කිරීම, දික්ඕවිට අගුළු ගේට්ටුව සහ ඒ අවට පරිසරය පිරිසිදු කිරීම, ගංවතුර අවම කිරීමේ කටයුතු සඳහා වැලි කොට්ට සැපයීම සහ බොරලැස්ගමුව ප්‍රදේශයේ ඇළ මාර්ග පිරිසිදු කිරීම වැනි ඔවුන්ගේ පරිශ්‍රයේ සහ ඒ අවට ඇති ජලාපවහන ගැටලු විසඳීමට අපගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

සිදු කරන ලද ඉල්ලීම්,

- ගංවතුර පවතින විට ඇළ මාර්ගවල අවහිරතා පිරිසිදු කිරීම
- ගංවතුරට නිදහස් ගලායාමට සැලැස්වීම සඳහා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම.
- ජලයෙන් බෝවන රෝග අවම කිරීම සඳහා ඇළ මාර්ග පිරිසිදු කිරීම ආදිය.

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 1.32 කි.

- සපුගස්කන්ද වගුරු බිම් ප්‍රදේශයේ එළිපෙහෙළි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග





- බොරලැස්ගමුව ප්‍රදේශයේ ඇළ මාර්ග අවහිරතා ඉවත් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග.







- දික්ඔවිට අඟුළු ගේට්ටුව සහ එහි අවට පිරිසිදු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග.





- මාකේවිට ප්‍රදේශයේ ද්විතියික ඇළ මාර්ග පිරිසිදු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග.



1.4 කළු ඔය ද්‍රෝණියේ ඇළ මාර්ග නඩත්තු කිරීම

කළු ඔය ද්‍රෝණියේ නේවාසික හා කර්මාන්ත අංශයේ අඛණ්ඩ වර්ධනයක් අත්කර ගෙන තිබේ. ඉඩම් මිල අඩු වීම හේතුවෙන් එය නව පදිංචිකරුවන් ආකර්ෂණය කරගෙන ඇත. කොළඹ ජනගහනය වර්ධනය වනවිට එය අනාගත නාගරික ව්‍යාප්තිය සඳහා ප්‍රමුඛතා ප්‍රදේශයක් ලෙස දැන් ඉලක්ක කර ඇත. මෙම වේගවත් සංවර්ධනයත් සමඟ ස්වාභාවික උවදුරුවලට ලක් වීමේ අවදානම අවම කිරීම සඳහා වැසි ජල අපවහන ඇතුළු නාගරික යටිතල පහසුකම් කෙරෙහි වැඩි අවධානයක් අවශ්‍ය වේ.

SLLDC විසින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ගවල ඇළ මාර්ග හැරීම, මඩ ඉවත් කිරීම සහ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් සිදු කරනු ලැබේ.

ව්‍යාපෘතියේ අරමුණු පහත පරිදි වේ,

- වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමෙන් ගංවතුර හානිය අවම කිරීම
- ගංවතුර අවදානම අඩු කිරීමෙන් (හෝ කළමනාකරණය කිරීමෙන්) ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- ප්‍රජාව සඳහා සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම
- සමාජ හා වාණිජ කටයුතුවලට සිදු වන බාධා අවම කිරීම
- පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය අවදානම අඩු කිරීම
- වඩාත් ආකර්ෂණීය නාගරික පරිසරයක් නිර්මාණය කිරීම

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 15.18 කි.



1.5 ඇළ මාර්ග ඔස්සේ නව සහ නිවැරදි කිරීමේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් (ගේබියන් කාර්යයන්, පෝරු ටැඹ, RRM බැම්ම ආදිය)

මෙම භාණ්ඩාගාර අරමුදල් වෙන්කිරීම යටතේ කොළඹ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියෙහි ජලාපවහන අවශ්‍යතා සපුරාලීම පිණිස ඇළ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලදී.

වර්ෂ 1992 සිට 1998 දක්වා කාලය තුළ ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ කාර්යයන් ආදිය සමඟින් කොළඹ සහ ඒ අවට ඇළ මාර්ග පද්ධතිය සංවර්ධනය වූ අතර විවිධ මානව ක්‍රියාකාරකම් සහ ඇළ ඉවුරු ස්වාභාවික බාදනය හේතුවෙන් මේ වනවිට ඇළ ඉවුරුවලින් කොටසක් හානියට ලක් වී ඇත.

ඉහත කරුණු සලකා බලා ඇළ ඉවුරු සේදී යෑම හා කඩා වැටීමෙන් වැළැක්වීම සඳහා උතුරු කොළඹ ප්‍රදේශය, දකුණු කොළඹ ප්‍රදේශය සහ නැගෙනහිර කොළඹ ප්‍රදේශය සහ එහි තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ඇළ මාර්ගවල ඉවුරු ආරක්ෂා කිරීමටත්, පවත්වා ගත හැකි උපරිම පළල පවත්වා ගැනීම සඳහා ඇළ ඉවුරු නිසි පරිදි සීමා නිශ්චය කිරීමටත් යෝජනා කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශවල පහත සංවර්ධන කටයුතු සිදු කර ඇත

- හැමිල්ටන් ඇළ-මුතුරාජවෙල (උස්වැටකෙයියාව ප්‍රදේශය ආසන්නයේ) තෝරාගත් ප්‍රදේශවල ගේබියන් රැඳවුම් බැම්ම ඉදිකිරීම.
- හැමිල්ටන් ඇළ-මුතුරාජවෙල (කඩලාවල ප්‍රදේශයට ආසන්නයේ) තෝරාගත් ප්‍රදේශවල ගේබියන් රැඳවුම් බැම්ම ඉදිකිරීම
- දෙහිවල විහාර පටුමග දිගේ යෝජිත දම්වැල් වැටක් ඉදිකිරීම
- විහාර පටුමගෙහි දෙහිවල ඇළ මාර්ගයෙහි ගේබියන් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු. මිලියන 20.03 කි















1.6 ඇළ මාර්ග සහ වැව ඔස්සේ නඩත්තු මාර්ගය පුනරුත්ථාපනය කිරීම

කොළඹ පුරවර කලාපයේ ඇළ මාර්ග ඔස්සේ නඩත්තු මාර්ග ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ප්‍රතිසංස්කරණය කර ඇත.

නඩත්තු මාර්ගය වැඩි දියුණු කිරීම මඟින් සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රතිඵල

- බර යන්ත්‍රසූත්‍ර සඳහා පහසු ප්‍රවේශයක් ලබා දීම
- ට්‍රිපර් සහ ලොරි රථ සඳහා අවශ්‍ය ඉඩකඩ ලබාදීම
- යන්ත්‍රෝපකරණ යෙදවීම සහ ඉවත් කිරීමට අවශ්‍ය ඉඩකඩ ලබා දීම.
- ඇළ මාර්ග හා එහි රක්ෂිතයන් අනවසරයෙන් අත් පත් කර ගැනීම වැළැක්වීම.
- ඇළ මාර්ගවලට අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම.

තවද, මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම තුළින් කොළඹ නගරය තුළ නව අතුරු මාර්ගයක් නිර්මාණය වන අතර එය දැනට පවතින වාහන තදබදය අවම කිරීමට උපකාරී වනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශවල පහත සංවර්ධන කටයුතු සිදු කර ඇත

- බෙල්ලන්විල ගල්තාර ඇතිරීමේ කාර්යයන්

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු. මිලියන 1.00 කි.









1.7 ලුනාව ඇළ මාර්ග පද්ධතියේ N1, N1-iii, S1 සහ S2 ඇළ මාර්ග හැරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සහ ලුනාව වැව හා එහි අවට නාගරික භූමි අලංකරණ

උතුරින් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශයේ සිට දකුණින් මොරටුව මහ නගර සභා බලප්‍රදේශය දක්වා කිලෝමීටර් 6.15 ක් ආවරණය වන පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ දකුණින් ලුනාව වැව පිහිටා ඇත. කලපුව ව්‍යසනය කරා ගමන් කරමින් සිටියදී 2000 ජූලි මාසයේදී රජය විසින් ජාත්‍යන්තර අරමුදල් යොදා ගනිමින් ලුනාව පරිසරය වැඩිදියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය දියත් කරන ලදී.

යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළ උතුරේ සිට දකුණට විහිදෙන පහත් බිම් හරහා ගොස් ලුනාව වැවට ගලා බසින ප්‍රධාන ඇළ මාර්ගය ලුනාව ඇළ මාර්ගය වේ. මෙම ද්‍රෝණිය කුඩා ද්‍රෝණි රැසකින් සමන්විත වන අතර එමඟින් වැවේ බටහිර සහ දකුණු ප්‍රදේශවල වැසි ජලය කෙලින්ම වැවට ගලා යයි. ලුනාව වැව, අභූලාන දුම්රිය ස්ථානයට දකුණින් පිහිටි දුම්රිය පාලම යටින් මුහුදට සම්බන්ධ වේ.

වාර්ෂිකව SLLDC ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටස නඩත්තු කිරීම සිදු කරයි. කලපු ප්‍රදේශය හා ඒ අවට සහ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටසක ද හැරීම් සහ සමහර පුනරුත්ථාපන කටයුතු සිදු කළ යුතු වේ. ඒ අනුව සමාජ වගකීමක් ලෙස මහජනතාවට ප්‍රසන්න

පරිසරයක් නිර්මාණය කිරීම සඳහා SLLDC ප්‍රධාන ඇළ පද්ධතියේ පිරිසිදු කිරීමේ සහ හැරීම් කටයුතු සඳහා සහභාගී වී ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල වන්නේ,

- ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය සඳහා නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පරිසරයක් නිර්මාණය කිරීම සහ වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් නගරයේ ගෞරවය ඉහළ මට්ටමක තබා ගැනීම.
- අධ්‍යාපනය ඇතුළු ආර්ථික හා සංස්කෘතික කටයුතු සඳහා බොහෝ විට බාධා ඇති වන ව්‍යාපෘති ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීම.
- නාගරික ප්‍රදේශයෙන් වැසි ජලය එක් රැස් වන ඇළ මාර්ගවල සහ මුහුදු ජලයේ තත්ත්වය වැඩිදියුණු කිරීම.
- ප්‍රධාන ඇළ පද්ධතියේ කොටසක් හැරීම, පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම මඟින් ප්‍රසන්න පරිසරයක් ඇති කිරීම.
- රොන්මඩ ඉවත් කිරීම මඟින් ඇළ මාර්ගයේ ජලය රැගෙන යාමේ ධාරිතාව වැඩි කිරීම.
- වැවට සහ ඇළ මාර්ග පද්ධතියට එක් වන අපද්‍රව්‍ය පාලනය කිරීම.
- ඇළ මාර්ග සහ කලපු සඳහා වෙන්කර ඇති භූමිය අනවසරයෙන් අත්පත් කර ගැනීම සහ එහි සිදු වන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම.

ඒ අනුව 2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 12.23 කි

1.8 කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (CKE) ඔස්සේ පැරණි ඕලන්ද ඇළ මාර්ගය සහ ඊට සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීම

CKE අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී අභ්‍යන්තර ගොඩබිම් ප්‍රදේශයෙන් ගලා එන ජලය හේතුවෙන් අවට ප්‍රදේශය දැඩි ලෙස ජලයෙන් යට විය. පසුව ගංවතුර අවදානම අවම කිරීම සහ ගොඩබිම ජලය සම්බන්ධිත ගැටලු අවම කිරීම සඳහා වැසි ජලයට නිදහස් ප්‍රවාහයක් සැපයීම පිණිස පැරණි ඕලන්ද ඇළ මාර්ග සහ සම්බන්ධිත ජලාශ වැඩිදියුණු කරන ලදී.





ඒ අනුව, පැරණි ඕලන්ද ඇළ මාර්ග සහ සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීමෙහි SLLDC නිරතුරුව නිරත වන අතර 2021 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 14.11 කි.

ගංවතුර අවම කිරීමේ ක්‍රියාමාර්ග

1.9 පැලියගොඩ පවතින පොම්පාගාරය වැඩිදියුණු කිරීම සහ එහි වාර්ෂික නඩත්තු හා මෙහෙයුම්

කැලණි ගඟේ පහළ කොටසෙහි ඉහළ ගංවතුර මට්ටම්වලදී පැලියගොඩ ප්‍රදේශයේ වැසි ජලය පොම්ප කිරීම සඳහා පැලියගොඩ දැනට පවතින පොම්පාගාරය ඉදි කරන ලදී. එය මේ වනවිට SLLDC විසින් නඩත්තු කරනු ලබන සිරස් අක්ෂීය පොම්ප (විදුලියෙන් ධාවනය වන) 2 කින් සමන්විත වේ.

2021 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින්, SLLDC දැනට පවතින පැලියගොඩ පොම්පාගාරය සහ ඒ වෙත ගලා එන ඇළ මාර්ග නඩත්තු කිරීම සඳහා සහභාගී වී ඇත.

ප්‍රධාන අරමුණු වූයේ,

- පවතින පොම්පාගාරය සහ එහි පෝෂණ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
- වාර්ෂික මෙහෙයුම් සහ නඩත්තු කාර්යයන්





ඉහත ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 3.22 කි.

1.10 බස්නාහිර පළාත තුළ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිවලට අදාළ ජලාපවහනය වැඩි දියුණු කිරීම

නිරන්තර ගංවතුර හේතුවෙන් සිදුවන ජීවිත හා දේපළ හානි අවම කිරීම සඳහා ජලාපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන් සිදු කරන ලදී. එය ශ්‍රී ලංකාවේ ස්වභාවික උවදුරුවල වඩාත්ම විනාශකාරී ස්වරූපයයි. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සාමාන්‍ය ජනතාවට බලපාන ගැටලු නිරාකරණය කිරීමට පිළියම් යෙදීමට සිදු විය.

ඉහත කාර්යය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සිදු කරන ලදී:

- සීදුව ප්‍රදේශයේ පිහිටි ඇළ මාර්ගයේ ජලාපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන්







- හුණුපිටිය නාථ ඇළ මාර්ගයේ ජලාපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යයන්







ඒ අනුව 2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයේ මුළු වටිනාකම රු. මිලියන 2.89 කි.

1.11 කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ජලාපවහනය වැඩිදියුණු කිරීමේ සහ නාගරික භූමි අලංකරණ ව්‍යාපෘති

ගංවතුර අවදානම අවම කිරීම සඳහා ප්‍රධාන නගරවල සහ කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ස්ථානවල වැව් ප්‍රතිසංස්කරණය කිරීම, අනවසර අත් පත් කර ගන්නන් විසින් සිදු කරන ලද අනවසර ගොඩ කිරීම් සහ රොන්මඩ ඉවත් කිරීම සහ හැරීම, වැව් බැම්ම ඔස්සේ ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම, පරිසරය පිරිසිදුව තබා ගැනීම සහ සංවර්ධනයට අදාළ ඇළ මාර්ග පද්ධතිය වඩාත් හොඳින් සම්බන්ධ කිරීම ආදිය මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

2021 වර්ෂය තුළ පහත සඳහන් පිරිසිදු කිරීමේ කාර්යයන්වලට සහභාගී වී ඇත;

- මුදුන් ඇළ මාර්ගය පිරිසිදු කිරීම
- ටයර් සංස්ථාව අසල ඇළ මාර්ගය පිරිසිදු කිරීම
- හේනේමුල්ල ඇළට සම්බන්ධ ඇළ මාර්ගය පිරිසිදු කිරීම
- ශාන්ත සෙබස්තියන් නැහෙනහිර ඇළ මාර්ගයට සම්බන්ධ ඇළ මාර්ගය පිරිසිදු කිරීම
- හෙට්ටිගේ ඇළ මාර්ගය හැරීම

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ,

- නගර සංවර්ධනයේ වෙනස්වීම් හේතුවෙන් දැනට පවතින ඇළ මාර්ග සහ වැව් වැඩිදියුණු කිරීම
- වැවේ ධාරිතාව වැඩි කිරීම
- අවට ප්‍රදේශය තවදුරටත් අනවසරයෙන් අත් පත් කර ගැනීමෙන් ආරක්ෂා වීම
- විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ජලාශ ආශ්‍රිතව අලංකාර කිරීමේ කටයුතු

හෙට්ටිගේ ඇළ මාර්ගයෙහි ජලාපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන්





2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයේ මුළු වටිනාකම රු. මිලියන 8.69 කි

1.12 පාර්ලිමේන්තු ඉහළ ජල පෝෂක ප්‍රදේශයක් වන බත්තරමුල්ල සහ එහි අවට ප්‍රදේශයේ ජලාපවහනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ කාර්යයන්

හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩිදියුණු කිරීම මඟින් පාර්ලිමේන්තු පරිශ්‍රය සහ ඒ අවට ගංවතුර අවම කිරීම සහ ඉහළ ජල පෝෂක ප්‍රදේශවල තෙත්බිම් සංරක්ෂණය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.


මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ,

- රඳවාගැනීමේ ධාරිතාව වැඩි කිරීම සහ නාගරික භූමි අලංකරණය මඟින් ගංවතුරෙන් තොර, පරිසර හිතකාමී හරිත පරිසරයක් නිර්මාණය කිරීම
- අනවසර ඉඩම් අත් පත් කර ගන්නන් විසින් සිදු කරන ගොඩකිරීමේ ක්‍රියාකාරකම් වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වීම
- ජලාපවහන වැඩිදියුණු වීම
- නාගරික භූමි අලංකරණය

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යන්වල මුළු වටිනාකම රු. මිලියන 3.93 කි

2. බේරේ වැවෙහි ජලයෙහි තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම – යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (162-02-03-45-2560-11) - බේරේ වැවේ ජලාශයෙහි සහ ඒ අවට නඩත්තු කටයුතු

බේරේ වැව කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර බේරේ වැවේ විශාලත්වය හෙක්ටයාර් 65.4 කි. බේරේ වැව ප්‍රධාන කොටස් හතරකින් එනම්; නැගෙනහිර වැව (හෙක්ටයාර 43.3), ගාලු මුවදොර වැව (හෙක්ටයාර 2.6), බටහිර වැව (හෙක්ටයාර් 6.1) සහ නිරිතදිග වැව (හෙක්ටයාර 11.4) සමන්විත වේ. ශාන්ත සෙබස්තියන් ඇළ නැගෙනහිර බේරේ වැවට සම්බන්ධ වන අතර ප්‍රධාන වශයෙන් ගාලුමුවදොර වැවේ සිට මුහුදු දක්වා ජලය පිටාර ගලනු ලැබේ.



ශාන්ත සෙබස්තියන් ඇළ හරහා එන ජලය සහ නාගරීකරණය වූ මෙම ජල පෝෂකය හරහා එන ජලය බේරේ වැවට එක් රැස් වේ. එබැවින් වැව දූෂණය වීමට තුඩු දෙන නාගරික හා කාර්මික අපද්‍රව්‍ය සහ අපජලය සාමාන්‍යයෙන් වැව ජලයට එක් වේ. ඒ අනුව බේරේ වැවේ ඇති විය හැකි භායනය අවම කිරීම සඳහා බේරේ වැවේ ජලාශය සහ ඒ අවට අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කිරීමට SLLDC සම්බන්ධ විය.







2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 30.09 කි

3. අතිරේක ප්‍රතිපාදන - 411-02-03-2509 - කැලණිය ප්‍රදේශයේ ගංවතුර පාලනය කිරීම සඳහා ඇළ මාර්ග සහ වැව් පිරිසිදු කිරීම

ගංවතුර යනු ශ්‍රී ලංකාවේ ස්වභාවික උවදුරුවල වඩාත්ම විනාශකාරී ආකාරය වන අතර එමඟින් ජීවිත හානි මෙන්ම දේපළ හානි සිදු වේ. පවතින භූගෝලීය තත්ත්වය, අධික වර්ෂාපතනය සහ කාණු පද්ධතිය නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් කැලණිය/කිරිබත්ගොඩ සහ ඒ ආශ්‍රිත බොහෝ ප්‍රදේශ නිරන්තරයෙන් ජලයෙන් යට වේ.

කැලණිය ප්‍රදේශයේ අධික වර්ෂාපතනය සාමාන්‍යයෙන් කැලණි ගඟේ ඉහළ ජල මට්ටම් සමඟ සමපාත වීම තවත් ගැටලුවකි; මෙම තත්ත්වය යටතේ පැලියගොඩ පොම්පාගාරයේ පෝෂක ඇළවල නිදහස් ගලායාම අවහිරයකින් තොරව කළමනාකරණය කළ යුතුය.

ඒ අනුව, SLLDC අපගේ විෂය පථයෙන් ඔබ්බට ගොස් ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ පෝෂක ඇළවල් පිරිසිදු කිරීම සඳහා සහභාගී වන අතර අධික වර්ෂාවකදී ගංවතුර අවදානම අවම කිරීම සඳහා හැරීම මඟින් වැවේ රැඳවුම් ප්‍රදේශ වැඩිදියුණු කර ඇත. දූෂිත ඇළ මාර්ගය හේතුවෙන් ප්‍රධාන ඇළ මාර්ගවල පෝෂණ ඇළ පද්ධතිය අවහිර වීම සිදු වේ. එබැවින් කුඩා වර්ෂාපතනයක් ඇති වුවද ගංවතුර ඇතිවීමේ වැඩි හැකියාවක් පවතී.

මෙම තත්ත්වය යටතේ කැලණිය/කිරිබත්ගොඩ ප්‍රදේශවල ඇළ මාර්ග පිරිසිදු කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් වත්මන් විෂය පථයෙන් ඔබ්බට ගොස් SLLDC විසින් පිරිසිදු කළ යුතු ඇළ මාර්ග කිහිපයක් හඳුනාගෙන ඇත.







කැළණිය දිප්පිටිගොඩ ප්‍රදේශයේදී නාථ ඇළ මාර්ගයේ ජලාපවාහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන්



වෙදමුල්ල සම්බන්ධක ඇළ මාර්ගයේ ජලාපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන්



වෙදමුල්ල ඇළ මාර්ගය I සහ II හි ජලාපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන්

2021 වර්ෂය සඳහා සිදු කරන ලද වැඩවල මුළු වටිනාකම රු. මිලියන 25.02 කි.

අ. සේවාදායක ව්‍යාපෘති

1. **ගාල්ල මොරගොඩ ඇළ ප්‍රධාන ඇළ මාර්ගය සහ පන්සල මහහැරයෑමේ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ නිවැරදි කිරීමේ කාර්යයන්. (අදියර 01)**

සේවාදායකයා : උපායමාර්ගික ව්‍යාපෘති සංවර්ධන ව්‍යාපෘති (SCDP)
ආරම්භක දිනය : 17.07.2019
ව්‍යාපෘති තත්ත්වය : 31.12.2021 දින නිම කර ඇත
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 661.35 (**අවිනිශ්චිතතා සහ VAT හැර**)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන් : රු.මිලියන 493.92

කාර්යයන්වල විෂය පථය

- ගේබියන් බැම් නිවැරදි කිරීම ඉදිකිරීම
- රෙනෝ මෙට්ට ඉදිකිරීම
- මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කාර්යයන්
- ඇළ මාර්ගය ඔස්සේ හෑරීම (O+000 m to 4+200 m)
- දම්වැල් දැල් වැට සහ ආරක්ෂක අත්වැට ඉදිකිරීම

මුළු ඇළ මාර්ග දිග : කි.මී. 1.85 (0+000 m සිට 1+850 m දක්වා දම්වැල් වැට ආරම්භ වේ)















කෝට්ටේ අපේ ගම සහ ජපන් මිත්‍රත්ව මාර්ගයට යාබදව ඉඩමෙහි අනුස්මරණ උද්‍යානයක් (සඳුන් උයන) ඉදිකිරීම – අදියර I

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
ආරම්භක දිනය : 2020.07.09
ව්‍යාපෘති තත්ත්වය : 2021.12.31 දින නිම කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 132.33
(අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 119.86

කාර්යයන්වල විෂය පථය

- වේදිකාව, පඩිපෙළ ඉදිකිරීම
- ගැඹුරු පොකුණු 02 ක්
- කැස්කේඩ් බිත්ති 12 ක් ඉදි කිරීම
- නොගැඹුරු පොකුණු 12ක් ඉදිකිරීම
- වැසි ජල අපවහන පද්ධතියක් ඉදිකිරීම
- බිම ටෙරාසෝ ඇතිරීම සමඟ ප්ලාසා ප්‍රදේශය ඉදිකිරීම
- විදුලි ස්ථාපනයන්
- "U" කාණු ඉදිකිරීම - දිග මීටර් 150 (පිවිසුම් ප්‍රදේශයේ)





2. කෝට්ටේ අපේ ගම සහ ජපන් මිත්‍රත්ව මාර්ගයට යාබදව ඉඩමෙහි අනුස්මරණ උද්‍යානයක් (සඳුන් උයන) ඉදිකිරීම – අදියර II

සේවාදායකයා : නාගරික සංවර්ධන අධිකාරිය
ආරම්භක දිනය : 2020.11.28
ව්‍යාපෘති තත්ත්වය : 2021.03.28 දිද නිම කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 162.39
(අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 132.58

කාර්යයන්වල විෂය පථය

- බෝක්කු සහ වැසි ජල අපවහන පද්ධතියක් සහිත වාහන නැවැත්වීමේ ප්‍රදේශය ඉදිකිරීම
- වේදිකාව වෙත මංතීරු අංක 03ක් ඉදිකිරීම
- වතුර මල් පද්ධතියක් ඉදිකිරීම
- භූමි අලංකරණය සමඟ තණ පිඩලි ඇල්ලීම
- බිම ටෙරාසෝ ඇතිරීම සමඟ ප්ලාසා ප්‍රදේශය ඉදිකිරීම
- විදුලි ස්ථාපනය
- "U" කාණු ඉදිකිරීම - දිග මීටර් 105 (පිවිසුම් ප්‍රදේශයේ)








3. යාපනය පොකුණු ඉවුරු සංරක්ෂණය කිරීමේ සහ පොකුණු දෙකක රොන්මඩ ඉවත් කිරීමේ නියමු වැඩසටහන (අදියර - 1 - රොන්මඩ ඉවත් කිරීම)



සේවාදායකයා: උපායමාර්ගික ව්‍යාපෘති සංවර්ධන ව්‍යාපෘති (SCDP)
ආරම්භක දිනය : 2020.08.10
ව්‍යාපෘති තත්ත්වය: 2021.10.31 දින නිම කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 102.76 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 88.15

කාර්යයන්වල විෂය පථය

තේවාරි කුලම් පොකුණ (හෙක්ටයාර් 1.120/11200 m2)

- ඉවුරු හා සම්බන්ධ කැණීම් සහ සංවර්ධනය කිරීම්
- අඩි පාර, ඇවිදීමේ මාර්ගය සහ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි පහන් කණුවක් ඉදිකිරීම
- බෝක්කුව සහ මායිම් බැම්ම ඉදිකිරීම
- ඉඩම් ආවරණ කටයුතු



පුල්ලෙයාර් කුලම් කෝවිල පොකුණ (හෙක්ටයාර් 0.6192/6,19 2m2)

- ඉවුරු හා සම්බන්ධ කැණීම් සහ සංවර්ධනය කිරීම්
- අඩි පාර සහ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ආලෝක කණු ඉදිකිරීම
- භූමි අලංකරණ කටයුතු, රැඳවුම් බිත්තියේ නිවැරදි කිරීමේ කටයුතු





4. යාපනය අරියකුලම් පොකුණුවල යෝජිත සංවර්ධන කාර්යයන්

සේවාදායකයා : නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ
ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ආරම්භක දිනය : 2021.05.01
ව්‍යාපෘති තත්ත්වය : 2021.12.31 දින නිම කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 8.80 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 7.45

කාර්යයන්වල විෂය පථය

- යෝජිත පොකුණ හැරීම
- පොකුණ ඔස්සේ සංවර්ධන කාර්යයන්





5. දෙනියාය යෝජිත වාහන අංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

සේවාදායකයා : නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ආරම්භක දිනය : 2021.03.22
ව්‍යාපෘති තත්ත්වය : 2021.07.23 දින නිම කරන ලදී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 9.22 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 11.39

කාර්යයන්වල විෂය පථය

- භූමිය කැපීම සහ සමතලා කිරීම
- පස් කාණු සෑදීම
- ඉඩම පිරවීම සහ මට්ටම් කිරීම (විශාලත්වය -2R, 30P)
- කොන්ක්‍රීට් කාණුවක් ඉදිකිරීම (පිවිසුම සඳහා)







6. ජා-ඇළ, කොටුගොඩ රන්නාක්ක වැවෙහි යෝජිත පුනරුත්ථාපන කාර්යයන්

සේවාදායකයා : නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ආරම්භක දිනය : 2021.07.05
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරගෙන යනු ලැබේ
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 160.40 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 65.09

කාර්යයන්වල විෂය පථය

- පොකුණ කැණීම (විශාලත්වය 72,843 m2- ගැඹුර 1m දක්වා)

- ඇවිදීමේ මංතීරු සකස් කිරීම
- යකඩ පාලම ඉදිකිරීම (විශාලත්වය 6m x3m)
- තටු බිත්ති සහිත කුඹහ නල බෝක්කු ඉදිකිරීම
- පෙරැදි ආසන ඒකක සැපයීම සහ සවි කිරීම
- බැම්ම සකස් කිරීමේ කාර්යයන් සහ දියමංකඩ සහ වාන් දොරටුව ඉදිකිරීම
- ක්‍රීඩාංගණය සකස් කිරීම
- රථගාල ඉදිකිරීම
- සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි පහන් කණුව ස්ථාපනය කිරීම











7. ගාල්ල, හෝලුවාගොඩ යෝජිත පරිසර කෘෂි උද්‍යානය

සේවාදායකයා : නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ආරම්භක දිනය : 26.01.2021
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 341.96 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 57.32

කාර්යයන්වල විෂය පථය

- වැව හැණීම (60,570 m3)
- යෝජිත දූපත සකස් කිරීම
- ඇවිදීමේ මාර්ගය සහ බැම්ම











8. මොරගොඩ ඇළ මාර්ගයෙහි ඇවිදීමේ මංතීරුව සංවර්ධනය කිරීම

සේවාදායකයා : නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ආරම්භක දිනය : 26.08.2021
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 34.58
(අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 21.52

කාර්යයන්වල විෂය පථය

- සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි පහන් කණුව ස්ථාපනය කිරීම
- පෙරැදි ආසන ඒකක සහ මල් පෝච්චි සැපයීම සහ සවි කිරීම





ආ. වෙනත් ව්‍යාපෘති

1. අතුරුගිරිය යෝජිත රේඛීය උද්‍යානය- අදියර I

ආරම්භක දිනය : 15.12.2020
ව්‍යාපෘති තත්ත්වය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 370 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 දක්වා සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 199.27

කාර්යයන්වල විෂය පථය

- ඇළ මාර්ගය සකස් කිරීම
- ඇවිදීමේ මංතීරුව සහ පාපැදි ධාවන පථය සකස් කිරීම (කිලෝමීටර් 3.4)
- ගැටි බැම්ම සකස් කිරීම (මීටර් 13,540)
- කුඹහ නල බෝක්කු (6ක්) සහ සතරැස් බෝක්කු (2ක්) ඉදිකිරීම
- අඩි පාලම ඉදිකිරීම (6ක්)
- රථගාල් සකස් කිරීම (2ක්)
- සාප්පු පෙදෙස් සහ වැසිකිලි සංකීර්ණ ඉදිකිරීම
- ජාල මනුකරණ පද්ධතිය ස්ථාපනය කිරීම











වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

හැඳින්වීම

කොළඹ සහ තදාසන්න නගරවල සිදු වන සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් සැලසුම් නොකළ ඉඩම් ගොඩකිරීම් සහ ඇළ මාර්ග අනවසරයෙන් අත් පත් නර ගැනීම් ඉහළ ගොස් ඇත. සෑම වසරකම පාහේ වර්ෂා කාලයේදී නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල සහ වේරහැර යන ප්‍රදේශවල ඇති වන දැවැන්ත ගංවතුර තත්ත්වය අත්විඳිමින් පවතී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) ජපන් අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහාය ඇතිව කොළඹ පුරවර කලාපය සඳහා විස්තීර්ණ ප්‍රධාන අපවහන සැලැස්මක් සකස් කරන ලදී. අධ්‍යයනයේ නිර්දේශයන්ට අනුව, වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2011 වර්ෂයේදී දියත් කරන ලදී.

ඉහත සඳහන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් SLLDC විසින් ආරම්භ කිරීම සඳහා 2013 අගෝස්තු 30 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ප්‍රධාන ගංවතුර පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට සම්පූර්ණ සැලසුම් කටයුතු සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ඉදිකිරීමට සිදු වී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 11,050 කි.

අරමුණු

පවතින ඇළ මාර්ග පද්ධතිය තවදුරටත් පුළුල් කිරීමෙන් ගංවතුර අවම කිරීම, ඇළ ඉවුරු ආරක්ෂණය, ජල රඳවුම් ප්‍රදේශය සංරක්ෂණය කිරීම සහ වැව් නිර්මාණය කිරීම, පවතින බෝක්කු සහ පාලම් වැඩිදියුණු කිරීම, නව ව්‍යුහ ඉදිකිරීම, අත්හැර දැමූ කුඹුරු නැවත වගා කිරීම ඉහළ නැංවීම, ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ අත්තිඩිය කුරුළු පරාදීසය ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ගංවතුර අවම කිරීම සඳහා ඉලක්ක කර ඇති බැවින්, ගංවතුර හානිය, මදුරුවන් මඟින් බෝ වන රෝග සහ මී උණ රෝගයෙන් අවම කිරීම මඟින් ප්‍රදේශවාසීන්ට සහ මුළු දිවයිනටම සහ ප්‍රතිලාභ අත් වේ. ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු ප්‍රදේශයේ ඉඩම් වටිනාකම සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.


වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ දේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් ගංවතුරෙන් තොර ඇළ මාර්ග පද්ධතියක් නැනීම සඳහා දේශීය ඉංජිනේරු තාක්ෂණික ධාරිතාව භාවිතා කරනු ලබන ජාතිය සඳහා කෙරෙන ආයෝජනයකි.

2021 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු. මිලියන 10,104 කි.

ව්‍යාපෘති ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදුවන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද කොටස්වලින් මහජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබේ

ව්‍යාපෘතියේ ඵලදායී ජල පෝෂක ප්‍රදේශය

වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ජල පෝෂක ප්‍රදේශය වර්ග කිලෝමීටර් 55.5 පමණ වේ



රූපය 1: **ඵලදායී ජල පෝෂක ප්‍රදේශය**

සම්පූර්ණ ජල පෝෂක ප්‍රදේශය කලාප හයකට බෙදා ඇති අතර මේ වනවිට ඉදිකිරීම් සිදු කරමින් පවතී.

2021 වර්ෂය අවසානය වනවිට සම්පූර්ණ කර ඇති ඉදිකිරීම් කාර්යයන්

ව්‍යුහගත වැඩිදියුණු කිරීම්





මීටර් 40**ක් දිග කරදියාන පාලම**

මහ ඇළ හරහා කරදියාන මාර්ගය ඔස්සේ කොන්ක්‍රීට් කුළුනු පදනමක් සහිතව ගල්තාර මාර්ග ප්‍රවේශයන් සහිතව මීටර් **40**ක වානේ පාලමක් ඉදිකර ඇත.

ජල රඳවුම් ප්‍රදේශ වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ජලය රඳවාගැනීමේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා හෙක්ටයාර 40 ක පමණ භූමි ප්‍රමාණයක් පොකුණු, වැව් සහ වගුරු බිම් ලෙස සංවර්ධනය වෙමින් පවතී.

ඒ අනුව, ඇවිදීමේ මංතීරුව සහ ළමා ක්‍රීඩා ප්‍රදේශය, විවෘත ව්‍යායාම ශාලාව වැනි විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම ආදිය සමඟ ජලය රඳවා ගැනීමේ ධාරිතාවය වැඩිදියුණු කර ඇත.

a. *මානෙල් මාවත වැව*







වෙල පාර වැව







වේරහැර වැව



සූරියමල් මාවත වැව







පැපිලියාන වැව



වෙල මාවත වැව




රබර් වත්ත වැව





කට්ටිය හංදිය





වෙරැස් ගඟ වගුර නඩත්තු කිරීම

නිදහස් ජල ප්‍රවාහය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය විටදී පිටවැල්ල පාලම සහ කොස්පලාන පාලම අතර වෙරැස් ගඟ වගුරු බිම (ආසන්න වශයෙන් හෙක්ටයාර් 88) පිරිසිදු කිරීම සිදු කර ඇත.





පර්යේෂණ සහ සැලසුම් අංශය

උපදේශන සේවාවන්

හැඳින්වීම

පර්යේෂණ සහ සංවර්ධන අංශය පහත සඳහන් අංශවලින් සමන්විත වේ,

1. ඉංජිනේරු අංශය.
2. වාස්තු විද්‍යාත්මක අංශය.
3. ප්‍රමාණ සමීක්ෂණ අංශය.
4. ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂණාගාරය.

ඉංජිනේරු අංශය

ඉංජිනේරු අංශය පහත දැක්වෙන පරිදි ඉංජිනේරුවන් 11 දෙනෙකුගෙන් සමන්විත වේ.

1. ප්‍රධාන ඉංජිනේරු - 1
2. වැඩ බලන ප්‍රධාන ඉංජිනේරු - 1
3. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු - 1
4. ඉංජිනේරුවන් - 8

මෙම ඉංජිනේරු අංශය පහත ක්ෂේත්‍ර සඳහා ඉංජිනේරු සේවාවන් සපයයි.

1. ජල විද්‍යාත්මක සහ ද්‍රාවවිද්‍යාත්මක නිර්මාණය
2. ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා ව්‍යුහාත්මක සැලසුම්
3. නාගරික ජලාපවහන නිර්මාණ
4. ගොඩනැගිලි සේවා

ගෘහනිර්මාණ අංශය

අංශය ගෘහ නිර්මාණ ශිල්පීන් 6 දෙනෙකුගෙන් සමන්විත වන අතර සහකාර සාමාන්‍යාධිකාරී (ගෘහනිර්මාණ) අංශයෙහි ප්‍රධානියා වේ. ගෘහනිර්මාණ අංශය පහත සඳහන් ක්ෂේත්‍රයේ සේවය සපයයි,

1. ගොඩනැගිලි ව්‍යාපෘතිය සඳහා ගෘහනිර්මාණාත්මක සැලසුම්
2. භූ දර්ශන කාර්යයන්

ප්‍රමාණ සමීක්ෂණ අංශය

පහත සඳහන් පරිදි නිලධාරීන් 14 දෙනෙකුගෙන් මෙම අංශය සමන්විත වේ. ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක (CQS අංශයේ ප්‍රධානියා වේ.

1. ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක (CQS)- වරලත් සුදුසුකම්.
2. ප්‍රමාණ සමීක්ෂක (QS)- 1
3. සහකාර ප්‍රමාණ සමීක්ෂක (AQS)- 13

SLLDC විසින් භාර ගනු ලබන සියලුම ව්‍යාපෘති සඳහා ප්‍රමාණ සමීක්ෂණයට අදාළ සියලුම සේවාවන් මෙම අංශය මඟින් සපයනු ලැබේ.

ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරය

ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂණාගාරය SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය යටතේ ක්‍රියාත්මක වේ. පස්, කොන්ක්‍රීට්, ජලය දක්වා විවිධ ද්‍රව්‍ය පරීක්ෂණ සිදු කිරීමට EMT පරීක්ෂණාගාරය හැකියාව ඇත.

SLLDC වෙනුවෙන්, පර්යේෂණ සහ සැලසුම් අංශය (R&D) පහත සඳහන් ක්ෂේත්‍රවල උපදේශන සේවාවන් සපයයි.

- ජල විද්‍යාත්මක සහ ද්‍රාව විද්‍යාත්මක ඉංජිනේරු විද්‍යාව
- ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා ගෘහ නිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම්
- නාගරික ජලාපවහනය
- ප්‍රමාණ සමීක්ෂණය
- මැනුම් කටයුතු
- ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂණ සිදු කිරීම

සාමාන්‍යයෙන් ඉහත සඳහන් කළ සේවාවන් පහත පාරිභෝගිකයන් සඳහා සපයනු ලැබේ.

1. අභ්‍යන්තර ගනුදෙනුකරුවන්
   - සියලුම අභ්‍යන්තර අංශවලට

2. බාහිර ගනුදෙනුකරුවන්
   - නාගරික සංවර්ධන අධිකාරිය
   - මාර්ග සංවර්ධන අධිකාරිය
   - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
   - පළාත් පාලන ආයතන සහ අනෙකුත් රාජ්‍ය ආයතන

3. පෞද්ගලික අංශය

2021 වසර සඳහා, R&D පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති වර්ග සඳහා සේවා සපයන ලදී,

- භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති
- සේවාදායක ව්‍යාපෘති
- ස්වයං ව්‍යාපෘති

2021 වර්ෂයේදී අංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති

2021 වර්ෂය සඳහා R&D අංශය රුපියල් මිලියන 524.66 ක සේවාවන් සැපයීමට සැලසුම් කරන ලද, ඒවා පහත පරිදි වේ.

අංකය	ව්‍යාපෘතිය	Q1		Q2		Q3		Q4		මුළු සැලසුම් කළ	මුළු සත්‍ය	ප්‍රතිශතය
		සැලසුම් කළ	සත්‍ය	සැලසුම් කළ	සත්‍ය	සැලසුම් කළ	සත්‍ය	සැලසුම් කළ	සත්‍ය			
1	භාණ්ඩාගාර අරමුදල්	9.97	9.97	11.03	11.03	6.96	5.6	9.63	7.1	37.59	33.7	90%
2	සේවාදායක & ස්වයං ව්‍යාපෘති	59.33	59.33	63.74	63.74	94.45	94.45	269.55	137.52	487.07	355.04	73%
	එකතුව	69.3	69.3	74.77	74.77	101.41	100.05	279.18	144.62	524.66	388.74	74%

ඇවිදීමේ මංතීරු නිර්මාණය සහ ඉදිකිරීම

2021 අයවැය යෝජනා යටතේ නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය දිවයින පුරා ඇවිදීමේ මංතීරු සහ පොදු පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

ඉහත යෝජනාව යටතේ පහත සඳහන් ව්‍යාපෘති SLLDC විසින් සිදු කරන ලදී. ගෘහ නිර්මාණාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ව්‍යාපෘති ඇස්තමේන්තු පර්යේෂණ සහ සංවර්ධන අංශය විසින් සිදු කරන ලදී.

1. යක්කල, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සඳහා යෝජිත ඇවිදීමේ මංතීරුව
2. ගම්පහ ඔරුතොට ඇවිදීමේ මංතීරුව ප්‍රතිසංස්කරණය කිරීම
3. ගම්පහ, හෙනරත්ගොඩ ඇවිදීමේ මංතීරුව ප්‍රතිසංස්කරණය කිරීම
4. බෙලිඅත්ත, අම්පිටිය වැවේ යෝජිත ඇවිදීමේ මංතීරුව සහ භූ දර්ශන වැඩිදියුණු කිරීම.
5. මාතර කඹුරුගමුව වැවේ යෝජිත ව්‍යායාම මංතීරුව සහ භූ දර්ශන වැඩිදියුණු කිරීම
6. ගාල්ල, මොරගොඩ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා යෝජිත ව්‍යායාම මංතීරුව
7. බලපිටිය, කිරිල්ල ඇළ ව්‍යායාම මංතීරුව ඉදිකිරීම
8. ජා-ඇළ, කොටුගොඩ රන්නාක්ක වැව යෝජිත සංවර්ධනය


9. අම්බලන්ගොඩ ශ්‍රී සංඝරාජ මාවතේ පොදු ස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (නෙළුම් පොකුණ පුනරුත්ථාපනය කිරීම).


ව්‍යාපෘති විස්තර

ගම්පහ ව්‍යායාම මංතීරු ව්‍යාපෘති

1. යක්කල, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සඳහා යෝජිත ඇවිදීමේ මංතීරුව-අදියර 1

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ඉංජිනේරු සැලසුම් කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය
ව්‍යුහාත්මක සැලසුම් +ඇස්තමේන්තු කිරීම ක්‍රියාත්මක කිරීම	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 65.0 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2021 වර්ෂය සඳහා සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම	2021 : රු.මිලියන 43.55
උපදේශන ගාස්තුව	රු.මිලියන 2





මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. ව්‍යායාම මංතීරු ඉදිකිරීම
2. රථගාල ඉදිකිරීම
3. පොකුණ හැරීම
4. එළිමහන් ව්‍යායාම ශාලාවක් ඉදිකිරීම






2. ගම්පහ, ඔරුතොට ඇවිදීමේ මංතීරුව ප්‍රතිසංස්කරණය කිරීම - අදියර 1

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ඉංජිනේරු සැලසුම් කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය
ව්‍යුහාත්මක සැලසුම් +ඇස්තමේන්තු	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 54.28 (අවිනිශ්චිතතා සහ VAT හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 1.7

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. ව්‍යායාම මංතීරුව සහ භූ දර්ශනය ප්‍රතිසංස්කරණය කිරීම
2. ගේබියන් බැම්ම ඉදිකිරීම






3. ගම්පහ, හෙනරත්ගොඩ ඇවිදීමේ මංතීරුව ප්‍රතිසංස්කරණය කිරීම –අදියර 1

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	නාගරික සංවර්ධන අධිකාරිය
ව්‍යුහාත්මක සැලසුම් +ක්‍රියාත්මක කිරීම	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 23.11 (අවිනිශ්චිතතා සහ VAT හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 0.7

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. පවතින ව්‍යායාම මංතීරුව ප්‍රතිසංස්කරණය කිරීම
2. නව ව්‍යායාම මංතීරුවක් ඉදිකිරීම (දිග මීටර් 150)





4. බෙලිඅත්ත, අම්පිටිය වැව යෝජිත ඇවිදීමේ මංතීරුව සහ භූමි දර්ශනය වැඩිදියුණු කිරීම

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	නාගරික සංවර්ධන අධිකාරිය
ව්‍යුහාත්මක සැලසුම් +ක්‍රියාත්මක කිරීම	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 79.56 (අවිනිශ්චිතතා සහ VAT හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 2.38

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්-

1. වැව ප්‍රතිසංස්කරණය කිරීම
2. ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම
3. කාණු පද්ධතිය වැඩිදියුණු කිරීම




5. මාතර, කඹුරුගමුව වැව යෝජිත ව්‍යායාම මංතීරුව සහ භූ දර්ශනය වැඩිදියුණු කිරීම

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	නාගරික සංවර්ධන අධිකාරිය
ව්‍යුහාත්මක සැලසුම් +ක්‍රියාත්මක කිරීම	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 50.0 (අවිනිශ්චිතතා සහ VAT හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 1.5 (ව්‍යාපෘති පිරිවැයෙන් 3%)

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම
2. ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම







6. මොරගොඩ ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා යෝජිත ව්‍යායාම මංතීරුව

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	නාගරික සංවර්ධන අධිකාරිය
කොන්ත්‍රාත්කරු	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 34.60 (අවිනිශ්චිතතා සහ VAT හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 1.0 (ව්‍යාපෘති පිරිවැයෙන් 3%)

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම
2. ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම







7. බලපිටිය, කිරළ ඇළ ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	නාගරික සංවර්ධන අධිකාරිය
කොන්ත්‍රාත්කරු	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 38.83 (අවිනිශ්චිතතා සහ බදු හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 1.16 (ව්‍යාපෘති පිරිවැයෙන් 3%)

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම
2. ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම






8. යෝජිත ජා-ඇළ, කොටුගොඩ රන්නාක්ක වැව සංවර්ධනය කිරීම

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
කොන්ත්‍රාක්කරු	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 160.40 (අවිනිශ්චිතතා සහ බදු හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන 9.62 (ව්‍යාපෘති පිරිවැයෙන් 3%)

ව්‍යාපෘති කාර්යයන්වලට පොකුණ හැරීම, ඇවිදීමේ මංතීරුව, බෝක්කු, කාණු සහ රථ ගාල ඉදිකිරීම ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම්

1. ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම
2. කාණු පද්ධතිය වැඩිදියුණු කිරීම
3. බෝක්කු ඉදිකිරීම
4. රථගාල ඉදිකිරීම






9 . අම්බලන්ගොඩ, රන්දොඹේ ශ්‍රී සංඝරාජ පන්සල සඳහා පොදු ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (නෙළුම් පොකුණ ප්‍රතිසංස්කරණය කිරීම)

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි සහ ජනාධිපතිවරයාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 04 වන පරිච්ඡේදය එනම් ඵලදායී පුරවැසියෙකු සහ ප්‍රීතිමත් පවුලක් යන්නට අනුකූලව, දිවයින පුරා පරිසර හිතකාමී භෞතික සහ මානසික විවේක උද්‍යාන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) වෙත පවරා ඇත. මෙම වැඩසටහන යටතේ දකුණු පළාතේ, අම්බලන්ගොඩ දිස්ත්‍රික්කයේ රන්දොඹේ ශ්‍රී සංඝරාජ විහාරස්ථාන පරිශ්‍රයේ ක්‍රියාත්මක වන එවැනි එක් ව්‍යාපෘතියකි.


සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ ශිල්පී	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
කොන්ත්‍රාක්කරු	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
ව්‍යාපෘති පිරිවැය	61.25 (අවිනිශ්චිතතා සහ බදු හැර)
උපදේශන ගාස්තුව	රු.මිලියන.3.7 (ව්‍යාපෘති පිරිවැයෙන් 6 %)
2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්	රු.මිලියන3.33

මෙම ව්‍යාපෘතිය යටතේ පහත ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

- පවතින පොකුණ ප්‍රතිසංස්කරණය කිරීම
- ව්‍යායාම මංතීරුවක් ඉදිකිරීම
- පොදු විවේක ස්ථානය, ළමා ක්‍රීඩාංගණය, විවෘත ව්‍යායාම ශාලාව සහ වාහන අංගනය ඉදිකිරීම.
- අවට අන්තර් සම්බන්ධිත ක්ෂුද්‍ර ජලාපවහන ජාලය වැඩිදියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෘක්ෂලතාදිය වැඩිදියුණු කිරීම



රූපය:-... වින්‍යාස සැලැස්ම



රූපය:-... ඉදිකිරීම් නිර්මාණ ඇඳීම

2021 නොවැම්බර් දක්වා ව්‍යාපෘතියේ ඉදිකිරීම් තත්ත්වය





10) ගාල්ල, හෝලුවාගොඩ යෝජිත පරිසර කෘෂි උද්‍යානය

සේවාදායකයා	වැවිලි කර්මාන්ත සහ කර්මාන්ත අමාත්‍යාංශය
ගෘහනිර්මාණ උපදේශනය	නාගරික සංවර්ධන අධිකාරිය
ඉංජිනේරු උපදේශනය	SLLDC
අරමුදල් ප්‍රභවය	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 342 (බදු සහ අවිනිශ්චිතතා හැර)
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව	රු.මිලියන 8.46 (අවිනිශ්චිතතා සහ බදු හැර)
කාණ්ඩය	සේවාදායක ව්‍යාපෘති (උපදේශන)

ව්‍යාපෘති විෂය පථය:


1. වැව හැරීම මඟින් ප්‍රදේශයේ ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම.

2. ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ රැඳවුම් පොකුණක් නිර්මාණය කිරීම තුළින් ගංවතුර අවම කිරීම සඳහා විසඳුම් නිර්මාණය කිරීම මඟින් ප්‍රජාව සමාජීය හා ආර්ථික වශයෙන් නගා සිටුවීම.
3. පරිසර කෘෂිකාර්මික ගොවිතැන සහ ඒ හා සම්බන්ධ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා නගරවාසීන් සහ සංචාරකයින් දිරිමත් කිරීම මඟින් ප්‍රාදේශීය ගොවි ප්‍රජාව සඳහා වෙළඳපොළක් නිර්මාණය කිරීම
4. වැවේ සුන්දරත්වය සහ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැව වටා ව්‍යායාම මංතීරුවක් ඉදිකිරීම.
5. ළමුන් සඳහා ක්‍රීඩා ප්‍රදේශයක් ඉදිකිරීම

ඒ අනුව, SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය ඉංජිනේරුමය ඇඳීම් සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කර මේ වනවිට ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සඳහා සම්බන්ධ වී ඇත.



හෝලුවාගොඩ යෝජිත පරිසර කෘෂි උද්‍යානය.



හරස්කඩ විස්තර



රූපය : ව්‍යාපෘතියේ වින්‍යාස සැලැස්ම

11) රාගම යෝජිත පේරලන්ද තෙක් බිම් උද්‍යානය- අදියර II


සේවාදායකයා	නාගරික සංවර්ධන අධිකාරිය.
අරමුදල් ප්‍රභවය	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය.
ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 203.7 (බදු සහ අවිනිශ්චිතතා හැර).
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව	රු.මිලියන 6.1 (අවිනිශ්චිතතා සහ බදු හැර).
කාණ්ඩය	සේවාදායක ව්‍යාපෘති (උපදේශන).


ව්‍යාපෘති විෂය පථය:

1. මඩ හැරීම සහ රොන්මඩ ඉවත් කිරීම මඟින් වැවේ රඳවාගැනීමේ ධාරිතාව වැඩි කිරීම.
2. ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම සඳහා සහ විසඳුම් ලබා දීම.
3. වැව ආශ්‍රිත අනවසර අත් පත් කර ගැනීම් වැළැක්වීම.
4. අපද්‍රව්‍ය සහ අපජලය ජලාශයට බැහැර කිරීම වැළැක්වීම.
5. වැවේ සුන්දරත්වය සහ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැව වටා ව්‍යායාම මංතීරුවක් ඉදිකිරීම.

ඒ අනුව SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය ඉංජිනේරුමය ඇඳීම් සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කර නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කර දැනට ඉදිකිරීම් අධීක්ෂණ කාර්යයන් සඳහා සම්බන්ධ වේ.

2021 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම - 90%





12) යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය – ශ්‍රී දළදා මාළිගාව- අදියර V

අමාත්‍යාංශ ව්‍යාපෘතිය

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
පරිශීලක	ශ්‍රී දළදා මාළිගාව
උපදේශනය	SLLDC
ඉදිකිරීම	ශ්‍රී ලංකා යුද හමුදාව
ව්‍යාපෘති පිරිවැය	රු. 102,005,671.30
උපදේශන ගාස්තුව	රු.මිලියන 5.5 VAT හැර

SLLDC විසින් පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී දළදා මාලිගාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කර ඇත. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් කිහිපයක් ඇතුළත් වන පැකේජ හතරක් යටතේ වර්ගීකරණය කර ඇති අදියර V ව්‍යාපෘතිය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී SLLDC වෙත ප්‍රදානය කරන ලදී.

1. **පැකේජය 1 - VIP පිවිසුමෙහි යෝජිත සංවර්ධනය**
   - ශ්‍රී දළදා මාලිගාවේ ප්‍රභූ පිවිසුම් ප්‍රදේශය සඳහා යෝජිත උළු සෑකෙස්ම සහ වහලය දිගු කිරීම

2. **පැකේජය 2 - භූමි අලංකරණය සහ පොදු පහසුකම් යෝජිත සංවර්ධනය**
   - හේමමාලා සහ දන්තකුමරු පිළිරුව සඳහා යෝජිත අවට ප්‍රදේශය අලංකාර කිරීම
   - අනගාරික ධර්මපාල ප්‍රතිමාව සඳහා යෝජිත අවට ප්‍රදේශය අලංකාර කිරීම
   - ශ්‍රී දළදා මාලිගාවේ යෝජිත පාවහන් රාක්ක


3. **පැකේජය 3 - යෝජිත ජලාපවහන වැඩිදියුණු කිරීම**
   - විෂ්ණු දේවාලය අසල ජලාපවහනය වැඩිදියුණු කිරීම
   - ලෝක බෞද්ධ කෞතුකාගාරය අසල ජලාපවහනය වැඩිදියුණු කිරීම
   - උඩවත්ත කැලේ මාර්ගය වැඩිදියුණු කිරීම

4. **පැකේජය 4 - යෝජිත සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය**
   - විදේශිකයන් සඳහා වන වැසිකිසි සංකීර්ණයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම


සියලුම පැකේජ සඳහා ගෘහනිර්මාණාත්මක ඇඳීම්, දෙමහල් වැසිකිලි සංකීර්ණය (පැකේජය 4) සඳහා සහ පැකේජ 1 සහ 2 සඳහා ව්‍යුහාත්මක සැලසුම් සහ 3 පැකේජය සඳහා ජලාපවහන ඇඳීම් ('උඩවත්ත කැලේ පාර වැඩිදියුණු කිරීම' හැර) සහ සියලුම පැකේජවල ප්‍රමාණ සමීක්ෂණ පත්‍ර (BOQ) ඉදිරිපත් කර ඇත.

'උඩවත්ත කැලේ පාර වැඩිදියුණු කිරීම' සඳහා NBRO වෙතින් ලබාගත් නිර්දේශයට අනුව, මාර්ගයේ කඩා වැටෙන පැති බෑවුම් ස්ථාවර කිරීම සඳහා විශාල රැඳවුම් බැම්මක් හෝ පාංශු ඇණ ගැසීමේ ශිල්පීය ක්‍රම භාවිතා කළ යුතුය. එබැවින් මෙම කොටස සඳහා සැලසුම් නිර්මාණය කිරීම සඳහා NBRO වෙතින් ඉල්ලා සිටින ලද අතර ඔවුන්ගේ ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටී.


පැකේජය 3 – විෂ්ණු දේවාලය අසල ජලාපවහනය වැඩිදියුණු කිරීම



පැකේජය 3 – කෞතුකාගාරය අසල ජලාපවනය වැඩිදියුණු කිරීම



පැකේජය 3 – උඩවත්ත කැලේ මාර්ගය වැඩිදියුණු කිරීම



13.) UDA ව්‍යාපෘති

යෝජිත නගර සංවර්ධන ව්‍යාපෘති – මාතර දිස්ත්‍රික්කය
ව්‍යාපෘති යෝජක: නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මාතර දිස්ත්‍රික්කයේ නගර සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒවාට පොදු පහසුකම් වැඩිදියුණු කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම, වාහන නැවැත්වීමේ ස්ථාන, ක්‍රීඩාංගණ ආදිය ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘති සඳහා පවරා ගන්නා ලද ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් කුඹුරු සහ වගුරු බිම් වලින් සමන්විත වේ. මෙම ඉඩම් ගොඩකිරීමෙන් ස්වභාවික වැසි ජල අපවහන පද්ධතියට බාධා ඇති වේ. එබැවින් මෙම ව්‍යාපෘති සඳහා ජලාපවහන සැලසුම් සකස් කරන මෙන් SLLDC වෙතින් ඉල්ලා සිටින ලදී. එම ව්‍යාපෘති පහත විස්තර කර ඇත.

කුඹුරුපිටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය


සේවාදායකයා	UDA
ව්‍යාපෘති යෝජක	UDA
SLLDC හි විෂය පථය	වැසි ජල අපවහන පද්ධතිය
උපදේශන ගාස්තුව රු.	රු.මිලියන 4.7 (VAT හැර)
අරමුදල් ප්‍රභවය	භාණ්ඩාගාර අරමුදල් (2021 ඔක්තෝබර් පැවති සාකච්ඡාව ප්‍රකාරව)

ආරම්භ කළ දිනය -2021.02.03
කාලසීමාව - තාවකාලිකව අත්හිටුවන ලදුව 2021 නොවැම්බර් මස නැවත ආරම්භ කරන ලදී

ව්‍යාපෘති ප්‍රමාණය අක්කර 30ක් පමණ වන අතර ඉන් අක්කර 9ක් කුඹුරු ඉඩම්වලින් සමන්විත වන අතර එය වාහන නැවැත්වීමේ පහසුකම් සහ ක්‍රීඩාගාරයකින් සමන්විත මීටර් 400 ධාවන පථයකින් යුත් ක්‍රීඩාංගණය වැනි යෝජිත ව්‍යාපෘති සඳහා ගොඩකර වැඩිදියුණු කළ යුතුය.

යෝජිත සංවර්ධනයට අදාළ ඉහළ ජල පෝෂක ප්‍රදේශය අක්කර 2600ක් පමණ වන අතර පිළිවෙලින් කිලෝමීටර් 3.5ක් සහ කිලෝමීටර් 4.5ක් දිග ප්‍රධාන ඇළ මාර්ග දෙකක් හරහා ජලය ගලා යයි. ප්‍රධාන වාරි ඇළෙහි පහළ කොටස ඔස්සේ කිලෝමීටර 2.5 ක් පමණ දුරට ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කළ යුතු වේ.

SLLDC විසින් ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම සහ මූලික ජල විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කර 2021 දී කෙටුම්පත් සංකල්පීය සැලැස්ම UDA වෙත ඉදිරිපත් කර ඇත. මූලික අධ්‍යයනයන්ට අනුව, පහළ කොටසෙහි ප්‍රධාන බෝක්කු 12 ක් පමණ වැඩි දියුණු කිරීම සහ ප්‍රධාන වාරි ඇළ මාර්ගය පුළුල් කිරීම අවශ්‍ය වේ.



රූපය 1 – UDA යෝජනාව සමඟ යෝජිත සංකල්පීය ජලාපවහන සැලැස්ම

රු. මිලියන 4.7 ක (වැට බද්ද හැර) උපදේශන ගාස්තුවක් UDA වෙතින් ඉල්ලා සිටින නමුත් මේ වන තෙක් ලැබී නොමැත. 2021 ඔක්තෝම්බර් 18 වන දින අමාත්‍යවරුන් සහ SLLDC සභාපතිවරයා සමඟ පැවති රැස්වීමේදී ලැබුණු උපදෙස් අනුව, UDA අරමුදල් ලැබීම සහිතව/රහිතව ජලාපවහන සැලසුම් කිරීම අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබේ. එබැවින් 2021 දෙසැම්බර් මස මැනුම් කටයුතු ආරම්භ කරන ලද අතර අවශ්‍ය ප්‍රදේශයෙන් අඩක් පමණ ආවරණය කර ඇත.

2. කිරින්ද නගර සංවර්ධනය

සේවාදායකයා	UDA
ව්‍යාපෘති යෝජක	UDA
SLLDC Scope	වැසි ජල අපවහන සැලැස්ම


උපදේශන ගාස්තුව රු.	රු.මිලියන 2.5 (VAT හැර)
අරමුදල් ප්‍රභවය	UDA

ආරම්භ කළ දිනය -2021.03.05
කාලසීමාව-අරමුදල් ලැබීම මත රඳා පවතී.

ව්‍යාපෘතියේ ප්‍රමාණය අක්කර 15ක් පමණ වන අතර මුළු ප්‍රදේශයම කුඹුරු ඉඩමක් වන බැවින් එය වාණිජ ගොඩනැගිලි, නිවාස සංකීර්ණ, කාර්යාල, ක්‍රීඩාංගණ සහ වාහන නැවැත්වීමේ පහසුකම් වැනි යෝජිත ව්‍යාපෘති සංරචක සඳහා ගොඩකර වැඩිදියුණු කළ යුතුය.

යෝජිත සංවර්ධනයට අදාළ ඉහළ ජල පෝෂක ප්‍රදේශය අක්කර 2000ක් පමණ වන අතර කිලෝමීටර 5.0ක් පමණ දිග ප්‍රධාන ඇළ මාර්ග දෙකක් හරහා ජලය ගලා යයි. ප්‍රධාන වාරි ඇළ මාර්ගයේ පහළ කොටසේ කිලෝමීටර 1.5 ක පමණ දුරට ජල විද්‍යාත්මක අධ්‍යයනයට ලක් කෙරේ.

SLLDC විසින් ස්ථාන පරීක්ෂාව, දත්ත එකතු කිරීම සහ මූලික ජල විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කර ඇති අතර කෙටුම්පත් සංකල්පීය සැලැස්ම 2021 දී UDA වෙත ඉදිරිපත් කර ඇත. මූලික අධ්‍යයනයන්ට අනුව, පහළ කොටසෙහි ප්‍රධාන බෝක්කු 4ක් පමණ වැඩිදියුණු කළ යුතුය. කෙසේවෙතත්, 2021 ඔක්තෝම්බර් මාසයේදී UDA විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාරික ආකෘතියක් සඳහා යාමට සැලසුම් කරන ලද බැවින් වින්‍යාස සැලසුම් සංශෝධනය කරන ලදී. අවසාන සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා සමීක්ෂණ දත්ත ඉල්ලා මැනුම් පිරිවිතර UDA වෙත යවා ඇත.



රූපය 2 – UDA පළමු යෝජනාව සමඟ යෝජිත සංකල්පීය ජලාපවහන සැලැස්ම


3. **දෙවිනුවර නගර සංවර්ධනය**

සේවාදායකයා	UDA
ව්‍යාපෘති යෝජක	UDA
SLLDC විෂය පථය	වැසි ජල අපවහන සැලස්ම
උපදේශන ගාස්තුව රු.	රු. මිලියන 2.25 (VAT හැර)
අරමුදල් ප්‍රභවය	UDA

ආරම්භ කළ දිනය -2021.02.12
කාලසීමාව - අරමුදල් ලැබීම මත රඳා පවතී.

දෙවුන්දර නගරයේ විසිරී ඇති සියලුම රජයේ කාර්යාල එක් ස්ථානයකට රැස් කර මහජනතාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ විෂය පථය වේ. ව්‍යාපෘතිය සඳහා කුඹුරු අක්කර 39ක් පමණ පවරා ගැනීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය කාර්යාල සංකීර්ණ, වාණිජ සංවර්ධන, බස් නැවතුම්පොළ ඉදිකිරීම් ආදියෙන් සමන්විත වේ

සම්පූර්ණ ව්‍යාපෘතිය කුඹුරු ඉඩමක පිහිටා ඇති බැවින් වැසි ජල අපවහන සැලසුම සිදු කරන ලෙස SLLDC වෙතින් ඉල්ලා සිටියේය. යෝජිත සංවර්ධනය අක්කර 12 කින් පමණ පුළුල් කර ඇති යාවත්කාලීන වින්‍යාස සැලැස්ම 2021 දෙසැම්බර් මාසයේදී ලැබීමට පෙර SLLDC විසින් 2021 වර්ෂයේදී ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම සහ මූලික ජල විද්‍යාත්මක අධ්‍යයන සිදු කරන ලදී. මේ වනවිට අපගේ සංකල්පීය සැලසුම් යෝජනාව සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටිනු ලැබේ. මූලික අධ්‍යයනයන්ට අනුව, පහළ කොටසෙහි ප්‍රධාන බෝක්කු 2ක් පමණ වැඩි දියුණු කිරීමට නියමිතය. අවසාන සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා සමීක්ෂණ දත්ත ඉල්ලා මැනුම් පිරිවිතර UDA වෙත යවා ඇත.




රූපය 3 – යෝජිත සංකල්පීය ජලාපවහන සැලැස්ම (නව UDA වින්‍යාස සැලැස්ම ලැබීමට පෙර)

4. **වැවුරුකන්නල පූජා භූමි සංවර්ධනය**

සේවාදායකයා	UDA
ව්‍යාපෘති යෝජක	UDA
SLLDC විෂය පථය	වැසි ජල අපවහන සැලස්ම
උපදේශන ගාස්තුව රු.	රු.මිලියන 2.1 (VAT හැර)
අරමුදල් ප්‍රභවය	UDA

ආරම්භ කළ දිනය -2021.02.12
කාලසීමාව - අරමුදල් ලැබීම මත රඳා පවතී.

වැවුරුකන්නල රජමහා විහාරයට පැමිණෙන බෞද්ධ බැතිමතුන් සඳහා කඩ කාමර සහ විවේක ස්ථාන සමඟ ප්‍රමාණවත් පහසුකම් සැලසීම ව්‍යාපෘතියේ විෂය පථය වේ. මෙම ව්‍යාපෘතිය සඳහා විහාරස්ථානය ආසන්නයේ අක්කර 20ක පමණ වගුරු බිමක් අත්පත් කර ගැනීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වැසි ජල අපවහන සැලැස්ම සිදු කරන ලෙස SLLDC වෙතින් ඉල්ලා සිටින ලදී.



රූපය 4 – UDA වින්‍යාස සැලැස්ම

SLLDC විසින් 2021 වර්ෂයේදී ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම සහ මූලික ජල විද්‍යාත්මක අධ්‍යයන සිදු කර ඇත. මූලික අධ්‍යයනයන්ට අනුව, ප්‍රධාන බෝක්කු 6ක් පමණ වැඩිදියුණු කළ යුතු

අතර මාර්ග දෙපස කාණු සකස් කළ යුතුය. අවසාන සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා සමීක්ෂණ දත්ත ඉල්ලා මැනුම් පිරිවිතර UDA වෙත යවා ඇත.

ව්‍යාපෘතිය	උපදේශන ගාස්තුව රු.මිලියන (VAT හැර)	2021 දෙසැම්බර් දක්වා ප්‍රගතිය	සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන
කඹුරුපිටිය නගර සංවර්ධනය	4.7	ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම, මූලික අධ්‍යයනය සහ මැනුම් කටයුතු.	1.14
කිරින්ද නගර සංවර්ධනය	2.5	ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම, මූලික අධ්‍යයනය සහ අවසන් සැලසුම් ඉදිරියට ගෙන යාමට අරමුදල් බලාපොරොත්තු වේ	0.24
දෙවිනුවර නගර සංවර්ධනය	2.25	ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම, මූලික අධ්‍යයනය සහ අවසන් සැලසුම් ඉදිරියට ගෙන යාමට අරමුදල් බලාපොරොත්තු වේ	0.27
වැවුරුකන්නල පූජා භූමිය සංවර්ධනය	2.1	ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම, මූලික අධ්‍යයනය සහ අවසන් සැලසුම් ඉදිරියට ගෙන යාමට අරමුදල් බලාපොරොත්තු වේ	0.72
හක්මන නගර සංවර්ධනය	4.15	ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම, මූලික අධ්‍යයනය සහ අවසන් සැලසුම් ඉදිරියට ගෙන යාමට අරමුදල් බලාපොරොත්තු වේ	1.03
ඇල්පිටිය නගර සංවර්ධනය	4.63	ස්ථාන පරීක්ෂාව, දත්ත රැස් කිරීම, මූලික අධ්‍යයනය සහ අවසන් සැලසුම් ඉදිරියට ගෙන යාමට අරමුදල් බලාපොරොත්තු වේ	1.16

14) බණ්ඩාරගම නගර සංවර්ධන ව්‍යාපෘතිය.

සේවාදායකයා	වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය / නාගරික සංවර්ධන අධිකාරිය
ව්‍යාපෘති වර්ගය	සේවාදායක ව්‍යාපෘති (උපදේශනය)
ආරම්භ කළ දිනය	01.09.2021
ඇස්තමේන්තුගත උපදේශන ගාස්තුව	රු. මිලියන 2.2 (බදු සහ අවිනිශ්චිතතා හැර)

ප්‍රගතිය:

බණ්ඩාරගම නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඉඩම් ලබාදීම මඟින් අවට ප්‍රදේශවල පදිංචිකරුවන්ට ඔවුන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීම අරමුණු කරයි.

"නයිදෙණිය කුඹුර", අක්කර 12.5 ක භූමි ප්‍රදේශයක් නගර සංවර්ධනය සඳහා ස්ථානය ලෙස තෝරා ගන්නා ලදී. එය 01 රූපයේ දැක්වෙන පරිදි බණ්ඩාරගම-හොරණ මාර්ගයේ බණ්ඩාරගම හන්දියේ සිට කිලෝමීටර් 2 ක් දුරින් පිහිටා ඇත.




රූපය 01: බණ්ඩාරගම නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩම.

තෝරා ගත් ඉඩම අතහැර දැමූ කුඹුරු යායක් බැවින් අධික ගංවතුර අවස්ථාවලදී ජලය රැඳවුම් ප්‍රදේශයක් ලෙස ක්‍රියා කරයි. එබැවින්, එවැනි දේපලක් සංවර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක ජල විද්‍යා සැලසුම් අවශ්‍ය වන අතර, ජලාපවහන කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම SLLDC වෙත ප්‍රදානය කරන ලදී.

කාර්යය	**තත්ත්වය**
වර්ෂාපතන දත්ත සහ සිතියම් එකතු කිරීම	නිම කර ඇත
පවතින ජලාපවහන රටාව හඳුනාගැනීම සඳහා UDA සමඟ ස්ථාන පරීක්ෂා කිරීම.	නිම කර ඇත
මැනුම් කාර්යයන්	මැනුම් පිරිවිතර UDA වෙත යවා ඇත.
ජල විද්‍යාත්මක හා ජල ගතික ආකෘති සංවර්ධනය	සමීක්ෂණ දත්ත නොමැති වීම හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇත.

SLLDC හි පර්යේෂණ හා සැලසුම් අංශය විසින් ඉහත පැවරුම් සිදු කරනු ලැබේ. 2021 වර්ෂයේ ව්‍යාපෘතියේ ප්‍රගතිය මෙහි දක්වා ඇත.

මිනින්දෝරු පිරිවිතරයන් සකස් කර මිනින්දෝරු කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලද අතර ඉන් අනතුරුව මට්ටම් දත්ත සහ වින්‍යාස සැලැස්ම ඉදිරිපත් කරන ලදී. කෙටුම්පත් සංකල්පීය ජලාපවහන සැලැස්ම සකස් කර ඇති අතර UDA වෙතින් මැනුම් දත්ත ලැබීමෙන් පසු ඉදිරි සැලසුම් කටයුතු කරගෙන යනු ඇත.



රූපය 02: පවතින ජලාපවහන ජාලය

15) අකුරැස්ස නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජිත වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම

සේවාදායකයා	වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය / නාගරික සංවර්ධන අධිකාරිය
අරමුදල් ප්‍රභවය	වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
කාණ්ඩය	භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති (ක්‍රියාත්මක කිරීම)
ඇස්තමේන්තුගත ක්‍රියාත්මක කිරීමේ ගාස්තුව	රු.මිලියන 278.8 (බදු සහ අවිනිශ්චිතතා හැර)
2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම	රු.මිලියන 8.34 (ඉංජිනේරු සංරචකය- රු. මිලියන 4.17, ගෘහනිර්මාණාත්මක සංරචකය- රු. මිලියන 2.78, ප්‍රමාණ සමීක්ෂණ සංරචකය- රු. මිලියන 1.39)

"අකුරැස්ස නගර සංවර්ධන ව්‍යාපෘතිය" යටතේ අකුරැස්ස නගරය සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් වගුරු බිමක් තෝරාගෙන ඇත.

කෙසේවෙතත්, මෙම අතහැර දැමූ වගුරු බිම ප්‍රාදේශීය ගංවතුර හේතුවෙන් නිරන්තරයෙන් ජලයෙන් යට වේ.


එබැවින් ආශ්‍රිත ජලාපවහන පද්ධතිය වැඩිදියුණු නොකර මෙම වගුරු බිම සංවර්ධනය කිරීම නිර්දේශ කළ නොහැක. එබැවින් SLLDC විසින් මෙම ප්‍රදේශය පිළිබඳ ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී.

SLLDC විසින් මෙම ජලාපවහන සැලැස්ම 2017 වර්ෂයේදී සකස් කරන ලදී. UDA මෙම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන තිබුණි. කෙසේවෙතත් යෝජිත වැව් ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු නොලැබුණි. පසුව නාගරික සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන විසින් මෙම ජලාපවහන සැලැස්ම රාජ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටි අතර, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතියද කල් ඉකුත් විය.


ජලාපවහන යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021.08.16 දින පාර්ශ්වකරුවන්ගේ රැස්වීම පවත්වන ලදී. රැස්වීමේ තීරණයට අනුව SLLDC **විසින්** NPD අනුමැතිය ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදී. ප්‍රධාන ඇළේ පහළ කොටස 2021 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපෘති ප්‍රදේශයේ ජලාපවහන තත්ත්වය තක්සේරු කිරීම සහ ඉහත සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති විය හැකි ජල විද්‍යාත්මක හා ජල ගතික බලපෑම් ඇගයීම මෙම ජලාපවහන අධ්‍යයනයේ අරමුණ වේ. තාක්ෂණික දත්ත හා ඉදිකිරීම් ඇදීම් යාවත්කාලීන කිරීම සහ ජලාපවහන වැඩිදියුණු කිරීමේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමෙන් මෙම අධ්‍යයනය සමන්විත වේ.

NPD අනුමැතිය ලැබීමෙන් පසු ව්‍යාපෘතිය අදියර තුනකින් (වසර දෙකක් ඇතුළත) ක්‍රියාත්මක කෙරේ. අදියර-I වැව් හැරීම සහ බැම්ම සකස් කිරීමෙන් සමන්විත වේ, අදියර-II පර්යන්ත ඇළ මාර්ග සහ නඩත්තු මාර්ගය (ඇවිදීමේ මංතීරු) ඉදිකිරීමෙන් සමන්විත වේ, අදියර-III අවසාන වෙනස් කිරීම් සහ අලංකරණ කටයුතුවලින් සමන්විත වේ. ව්‍යාපෘති කාලසීමාව අරමුදල් ලැබීම මත රඳා පවතී.




ජලාපවහන වින්‍යාසය



හරස්කඩ


16) RDA ව්‍යාපෘති

1. රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**.- 01** කොටස



ව්‍යාපෘති වටිනාකම	රු.මිලියන 18 + 10% අවිනිශ්චිතතා + බදු		
ආරම්භ කළ දිනය	2021 මැයි	**නිම කිරීමට අපේක්ෂිත දිනය**	2022 මාර්තු
ව්‍යාපෘතියේ විෂය පථය			
ක්‍රියාකාරකම 01	ස්ථාන පරීක්ෂාව, ගංවතුර අවදානම් ප්‍රදේශ හඳුනාගැනීම, දත්ත රැස්කිරීම (වර්ෂාපතනය, ඉඩම් පරිහරණය ආදිය) - **නිම කර ඇත**		
ක්‍රියාකාරකම 02	ඇළ මාර්ග ජාලය මැනීම - **නිම කර ඇත**		
ක්‍රියාකාරකම 03	ජල විද්‍යාව අධ්‍යයනය, ජල ගතික විද්‍යා ආකෘති නිර්මාණ කාර්යයන් - **නිම කර ඇත**		
ක්‍රියාකාරකම 04	අධිවේගී මාර්ගය සඳහා ඉහළ ගංවතුර මට්ටම් සහ හරස් ජලාපවහන වියුහ නිශ්චය කිරීම		
ක්‍රියාකාරකම 05	ජලාපවහන සැලසුම් සහ ජල විද්‍යා අධ්‍යයන වාර්තාව සකස් කිරීම		
භෞතික ප්‍රගතිය	80%	**මූල්‍ය ප්‍රගතිය**	20%

2. රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**- 02 & 03** කොටස්



ව්‍යාපෘති වටිනාකම	රු.මිලියන 25 + 10% අවිනිශ්චිතතා + බදු		
ආරම්භ කළ දිනය	2021 ජනවාරි	**නිම කිරීමට අපේක්ෂිත දිනය**	2022 ජූලි
ව්‍යාපෘතියේ විෂය පථය			
ක්‍රියාකාරකම 01	ස්ථාන පරීක්ෂාව, ගංවතුර අවදානම් ප්‍රදේශ හඳුනාගැනීම, දත්ත රැස්කිරීම (වර්ෂාපතනය, ඉඩම් පරිහරණය ආදිය)		
ක්‍රියාකාරකම 02	ඇළ මාර්ග ජාලය මැනීම		
ක්‍රියාකාරකම 03	ජල විද්‍යාව අධ්‍යයනය, ජල ගතික විද්‍යා ආකෘති නිර්මාණ කාර්යයන්		
ක්‍රියාකාරකම 04	අධිවේගී මාර්ගය සඳහා ඉහළ ගංවතුර මට්ටම් සහ හරස් ජලාපවහන වියුහ නිශ්චය කිරීම		
ක්‍රියාකාරකම 05	EIA පාරිසරික බලපෑම් තක්සේරුව සඳහා ජල විද්‍යා අධ්‍යයන සකස් කිරීම		
ක්‍රියාකාරකම 06	ජලාපවහන සැලසුම් සහ ජල විද්‍යා අධ්‍යයන වාර්තාව සකස් කිරීම (සවිස්තරාත්මක සැලසුම)		
භෞතික ප්‍රගතිය	2%	**මූල්‍ය ප්‍රගතිය**	0%

17) වෙනත් සේවාදායක ව්‍යාපෘති

ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරයෙහි කටුකිතුල්ඔය දුම්රිය බොක්කුවෙහි රොන්මඩ ඉවත් කිරීම

සේවාදායකයා	ලංකා විදුලිබල මණ්ඩලය
කොන්ත්‍රාත්කරු	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC)
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 22.73 (අවිනිශ්චිතතා සහ VAT නොමැතිව)
2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්	රු.මිලියන 11.37

- බෝක්කු පොකුණ සහ ප්‍රධාන පොකුණේ කොටසක් ඇතුළුව දුම්රිය බෝක්කුවේ රොන්මඩ ඉවත් කිරීම
- ඉවත් කරන ලද රොන්මඩ කසල අංගනයට බැහැර කිරීම





18) යක්කල, වැරැල්ලවත්ත ප්‍රදේශයේ යෝජිත මැදි ආදායම් නිවාස යෝජනා ක්‍රමය සඳහා වැසි ජල කළමනාකරණ කාණු සැලැස්ම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) විසින් යක්කල, වැරැල්ලවත්ත ප්‍රදේශයේ මැදි ආදායම් නිවාස සංවර්ධන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. යෝජිත සංවර්ධනය සඳහා සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර 2.4ක් පමණ වන අතර නිවාස යෝජනා ක්‍රමය බහු මහල් ගොඩනැගිලි, අභ්‍යන්තර මාර්ග ජාලය, වාහන නැවැත්වීමේ පහසුකම්, උපයෝගිතා පහසුකම්, විනෝදාස්වාද කලාප යනාදියෙන් සමන්විත වේ. NHDA හි ඉල්ලීම මත මේ සඳහා වැසි ජල අපවහන කළමනාකරණය සහ ඉඩම් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා විස්තීරණ ජලාපවහන අධ්‍යයනය සඳහා උපදේශන කාර්යය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සිදු කර ඇත.

උපදේශන කාර්යය සඳහා සේවාදායකයා : - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA)
උපදේශන ගාස්තුව : - රු.මිලියන 2.2 (VAT හැර)

මෙම උපදේශන කාර්යය යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ව්‍යාපෘති ප්‍රදේශය සහ අන්තර් සම්බන්ධිත වැසි ජල අපවහන ජාලය පිළිබඳ සවිස්තරාත්මක භූ විෂමතා සමීක්ෂණය.
- ජල විද්‍යාත්මක හා ජල ගතික විශ්ලේෂණය.
- වැසි ජල අපවහන කළමනාකරණ සැලැස්ම සකස් කිරීම.
- ගංවතුර ආරක්ෂිත පිරවුම් මට්ටම් සැපයීම.
- වැසි ජල අපවහන පද්ධතියේ සැලසුම් ඇඳීම් සකස් කිරීම.
- යෝජිත වැසි ජල අපවහන කළමනාකරණ සහ ඉඩම් සංවර්ධන සැලැස්ම සඳහා BOQ සකස් කිරීම



රූපය: යෝජිත වැසි ජල අපවහන කළමනාකරණ සැලැස්ම

19) කළුතර- බිඳුණු ඇළ සඳහා යෝජිත වැසි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ සැලැස්ම

සේවාදායකයා	වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය / නාගරික සංවර්ධන අධිකාරිය
සැලසුම් සහ ඉදිකිරීම	SLLDC
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 771
2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම	රු.මිලියන 1.97

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව, SLLDC විසින් කළුතර දිස්ත්‍රික්කය සඳහා ගංවතුර අවම කිරීමේ යෝජනාවක් සැකසීමට කටයුතු කර ඇත. බිඳුණු ඇළ අවට සැලසුම් රහිත සංවර්ධනය හා නාගරීකරණය හේතුවෙන් මෝසම් කාලය තුළ අවට ප්‍රදේශයේ නිරන්තර ගංවතුර ඇතිවීමට හේතු වී ඇත. ගංවතුර අවම කිරීම සඳහා බිඳුණු ඇළ ප්‍රතිසංස්කරණය කර වී වගාව යථා තත්ත්වයට පත් කර ප්‍රදේශයේ සමාජ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.


ස්ථානීය සංචාරයන් කිහිපයක් සිදු කර දැනට පවතින ස්ථානීය තත්ත්වයන් පිළිබඳ තොරතුරු රැස් කර ඇත. ජල විද්‍යා අධ්‍යයන සහ විශ්ලේෂණය තුළින්, හරස් බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමෙන් වසර 10 ක කාලයක් පවතින ලෙස අවහිරතා ඉවත් කිරීමට සැලසුම් කරන ලදී. නිවාස සහ දේපල නැවත ස්ථානගත කිරීම අවම කිරීම සඳහා පවතින ඇළ මාර්ගය ඔස්සේ ඇළ මාර්ග එල්ලය සැකසීම සිදු කරන ලදියි. ඇළ මාර්ග පත්ලෙහි ස්ථායිතාවය සැලකිල්ලට ගනිමින් වත්මන් ඇළ මාර්ග පැතිකඩ හැකිතාක් තබා ගනිමින් ඇළ මාර්ග පැතිකඩ සැකසීමට නියමිතය.

ව්‍යාපෘති කාලසීමාව වසර හතරක් ඇතුළත අදියර දෙකකින් සමන්විත වේ. අදියර–I දී, සංවේදී ප්‍රදේශවල ගංවතුර හානි අවම කිරීමට පුරෝකථනය කරන අතර II වන අදියරේදී තෙත් බිම් ප්‍රතිසංස්කරණය කරන අතරම ප්‍රදේශයට නිරසර මිශ්‍ර සංවර්ධනයක් හඳුන්වාදීමෙන් තෙත් බිම් ආරක්ෂා කිරීමට බලාපොරොත්තු වේ. පහත දැක්වෙන පරිදි ආයතනවල නිර්දේශ සහ අනුමැතිය සහිතව අනුමැතිය සඳහා අප විසින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙත ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කර ඇත,

අංකය	ආයතනය	ලිපියේ අංකය සහ දිනය
01	ජාතික සැලසුම් අමාත්‍යාංශය	NPD/PUT/URD/PP/2020/01 20/02/2021
02	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	NBRO/LRRMD/KT/21/01-i 2021/04/02
03	නාගරික සංවර්ධන අධිකාරිය - කළුතර	05/05/10/03/02/02/Gen-2019 2021/04/06
04	ජල සම්පත් මණ්ඩලය	DGM(R&D)/TG/INSP/2021 2021/05/18
05	මධ්‍යම පරිසර අධිකාරිය	WE/KT/08/08/05/2021 2021/05/20
06	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	DI/Dr&FS/Gen/Col(iii) 2021/07/16
07	ගොවි කටයුතු සංවර්ධන දෙපාර්තමේන්තුව	DAD/KL/L/02/Gen/02/1/2021 2021/09/06
08	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	2021/09/15

භාණ්ඩාගාර අරමුදල් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට NPD විසින් අනුමැතිය ලබා දෙන ලදී. සේවාදායකයා වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය / නාගරික සංවර්ධන අධිකාරිය ලෙස වෙනස් කරන ලදී.

ව්‍යාපෘති යෝජනාව: අදියර 01 සහ අදියර 02.



භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය විසින් මෙහෙයවනු ලබන සියලුම භාණ්ඩාගාර අරමුදල් ලැබූ කාර්යයන් සඳහා ජලාපවහන සැලසුම් පර්යේෂණ සහ සැලසුම් අංශය විසින් සකස් කර ඇත. පහත සඳහන් ව්‍යාපෘති සඳහා ගෘහනිර්මාණ සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සඳහා පර්යේෂණ සහ සැලසුම් අංශයට භාර දෙන ලදී,

20) ජල මට්ටම් සහ විසර්ජන මැනුම්

2021 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය – රු. මිලියන 4.3

2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාරයයන්වල වටිනාකම – රු. මිලියන 3.93

අනාගත අවස්ථා සඳහා ගංවතුර හානිය අවම කිරීම සඳහා ප්‍රධාන ජලාපවහන අධ්‍යයනය සිදු කිරීම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවේ එක් ප්‍රධාන අරමුණක් වේ. ප්‍රධාන ජලාපවහන අධ්‍යයනයේ ප්‍රතිඵලය දැනට පවතින තත්ත්වය, ජලාශවල හැසිරීම, වැව් සහ ප්‍රධාන ඇළ මාර්ග මත පදනම් වේ. අධ්‍යයනයේ ඉහළ නිරවද්‍යතාවයක් ලබා ගැනීම සඳහා ජල මට්ටම සහ විසර්ජන මැනීම් ඉතා වැදගත් වේ.

මේ වනවිට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 01 වන වගුවේ දක්වා ඇති පරිදි ද්‍රෝණි 7ක් තුළ ස්ථාන 134ක් හඳුනාගෙන ඇත. ස්ථාන 60ක් ක්‍රියාත්මක වෙමින් පවතී. ස්ථාන 74ක් අනාගතයේදී නවීන තාක්ෂණයෙන් සංවර්ධනය කිරීමට නියමිතය.

මැනුම් මධ්‍යස්ථානයට ඉතා ආසන්නව වෙසෙන ජනතාවගේ සහාය ඇතිව අතින් මැනුම් කියවීම් ක්‍රමය භාවිතා කරමින් සකස් කළ දත්ත සමුදායක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සතුව ඇත. දත්ත රැස් කිරීමට කාලය ගත වන අතර සමහර ස්ථානවල අඛණ්ඩ දත්ත වාර්තා නොමැත. දත්ත රැස් කිරීම ප්‍රමාද වීම සහ දත්ත අතුරුදහන් වීම වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව ස්වයංක්‍රීය ජල මට්ටම් මැනුම් සහ පරිගණක ආදර්ශ පද්ධතිය හඳුන්වා දීමෙන් මෙම පද්ධතිය වැඩිදියුණු කිරීමට සැලසුම් කරයි. ජලාපවහන අධ්‍යයනයන් සඳහා මෙන්ම අනෙකුත් අදාළ ආයතන සඳහා වඩාත් විශ්වාසදායක දත්ත සමුදායක් සැපයීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට හැකි වනු ඇත.

1 වගුවට අනුව මෙම පද්ධතිය (2018 - 2021 කාලසීමාව) සංවර්ධනය කිරීමට සහ කායික කියවීමේ ක්‍රමය ස්වයංක්‍රීය යාවත්කාලීන කියවීමේ ක්‍රමයට පරිවර්තනය කිරීමට සංස්ථාව සැලසුම් කරයි.

2003 වර්ෂයේ සිදු කරන ලද කොළඹ මහනගර කලාපය සඳහා වැසි ජල අපවහන සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා SLLDC සහ JICA හි විශේෂඥ කණ්ඩායම අතර 2017 දෙසැම්බර් මාසයේදී ගිවිසුමක් අත්සන් කරන ලදී.

එබැවින්, ඉහළ නිරවද්‍යතාවයකින් යුත් වැඩි දත්ත ප්‍රමාණයක් රැස් කිරීම සඳහා අපගේ ප්‍රමුඛතාවය ලබා දී ඇත. එබැවින් පර්යේෂණ සහ සංවර්ධන අංශය උපකරණ කිහිපයක් සහ ස්වයංක්‍රීය ජල මට්ටමේ දත්ත සටහන් යන්ත්‍ර මිලදී ගැනීමට තීරණය කරන ලද අතර ඒ සඳහා වැය කරන ලද මුළු මුදල රු. මිලියන 6ක් පමණ විය.


SLLDC ස්වයංක්‍රීය ජල මට්ටම් මිනුම් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරන නමුත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එය සාර්ථක කර ගැනීමට නොහැකි විය.

ඉක්මන	**ද්‍රෝණිය**	**ස්ථාන සංඛ්‍යාව**	**මේ වනවිට සිදු කරනු ලබන**	**2018**	**2019**	**2020**	**2021**
B – 1	බොල්ගොඩ ද්‍රෝණිය	53	29	-	√	√	√
J – 2	ජා-ඇළ ද්‍රෝණිය	22	19	√	√	-	√
M -3	මුදුන් ඇළ ද්‍රෝණිය	23	18	√	-	-	√
K - 4	කළු ඔය ද්‍රෝණිය	16	11	-	-	-	√
G – 5	මහ කොළඹ ද්‍රෝණිය	39	32	-	-	√	√
Ko-6	කොලොන්නාව ද්‍රෝණිය	20	17	√	√	-	√
Be- 7	බරවා ද්‍රෝණිය	06	0	-	-	-	√
	කොළඹින් පිට	03	03			√	√
	එකතුව	**182**	**129**				

හානියට පත් මිනුම් ස්ථානයේ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

2021 වර්ෂය දක්වා ප්‍රගතියේ සාරාංශය

ඉක්මන	ද්‍රෝණිය	ස්ථාන සංඛ්‍යාව	මේ වනවිට සිදු කරනු ලබන	හානි වූ	2019 නව	2019 අලුත්වැඩියා කළ	2019 ස්වයංක්‍රීය මට්ටම	2020 නව	2020 අලුත්වැඩියා කළ	2020 ස්වයංක්‍රීය මට්ටම	2021 නව	2021 අලුත්වැඩියා කළ	2021 ස්වයංක්‍රීය මට්ටම
B-1	බොල්ගොඩ ද්‍රෝණිය	53	29	5	5	4	4	10	9	0	4	8	
I-2	ජා-ඇළ ද්‍රෝණිය	22	19	10	7	4	2			0		2	
M-3	මුදුන් ඇළ ද්‍රෝණිය	23	18	12	0	5	2	2	8	0		1	
K-4	කළු ඔය ද්‍රෝණිය	16	11	8	0	4	3		3	0		4	1
G-5	මහ කොළඹ ද්‍රෝණිය	39	32	7	1	9	1	5	6			13	2
KO-6	කොලොන්නාව ද්‍රෝණිය	20	7	8	0	2	0				4	7	
BR-7	බරවා ද්‍රෝණිය	6	0	0	0	0	0				6	-	
	කොළඹින් පිට	3	3					3		0	3	-	
	මුළු ස්ථාන සංඛ්‍යාව	**182**	**119**	**50**	**13**	**28**	**12**	**20**	**26**	**0**	**17**	**35**	**3**









21) පැලියගොඩ මුදුන් ඇළ ද්‍රෝණියෙහි සවිස්තරාත්මක ජලාපවහන අධ්‍යයන.

2021 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය :රු. මිලියන 9.10
වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම:


2019	2020	2021
රු.මිලියන 3.0	රු.මිලියන 5.0	රු.මිලියන 9.2

මුදුන් ඇළ ද්‍රෝණිය කැලණිය සහ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරට වැටෙන ඉතා සමතලා පහත් දිය බස්නා ප්‍රදේශයකි. එහි පහත් ස්වභාවය නිසා එය බොහෝ විට ගංවතුරට ලක් වේ. මෙය කොළඹ අගනුවරට ආසන්නව ඉතා නාගරීකරණය වූ ප්‍රදේශයකි

එහි දහස් ගණනක් ජනතාව ජීවත් වීම, ජීවනෝපාය සඳහා පැමිණීම හෝ ගංවතුර ඇති ප්‍රදේශ හරහා ගමන් කිරීම සිදු කරයි. මුදුන් ඇළ උතුරින් කළු ඔයටත් දකුණින් සහ බටහිරින් කැලණි ගඟටත් ගලා බසී. කැලණි ගඟේ දකුණු ඉවුරේ ඇති ගංවතුර බැම්ම කැලණි ගංවතුරෙන් ප්‍රදේශය ආරක්ෂා කරන නමුත් කැලණි ගංවතුර ජලය ඇතුළුවීම වැළැක්වීම සඳහා ගේට්ටු වැසීම හේතුවෙන් ප්‍රාදේශීය ජලාපවහනය අවහිර වේ. කැලණි ජල මට්ටම් ඉවුර මට්ටමට වඩා බෙහෙවින් පහළ මට්ටමක පවතින විට පවා අධික වර්ෂාව පවතින විට පහත් බිම් ප්‍රදේශ පුරා ගංවතුර ඇති වේ. එමඟින් පවතින ජලාපවහන පද්ධතිය කෙතරම් ප්‍රමාණවත් නොවන්නේද යන්න පෙන්නුම් කරයි. පැලියගොඩ දැනට පවතින පොම්පාගාරයේ ඇති සීමිත ධාරිතාව හේතුවෙන් ජල අපවහනය සිදු කළ හැක්කේ කුඩා ප්‍රදේශයක පමණි.

එබැවින් මහජනතාවට තවදුරටත් අපහසුතාවයක් නොවන පරිදි ගංවතුර අවම කිරීමට SLLDC සැලසුම් කර ඇත. මේ වනවිට ඔලියමුල්ල ප්‍රදේශයේ 30 m3/s ක ස්ථාපිත ධාරිතාවකින් යුත් පොම්පාගාරයක් ඉදිකරමින් පවතින අතර එමඟින් සමස්ත මුදුන් ඇළ ජලාපවහන පද්ධතියට ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, මෙම පොම්පාගාරයට ජලාපවහන සම්බන්ධතාවය තවමත් තක්සේරු කර නොමැති අතර අනෙකුත් ගංවතුර අවම කිරීමේ ක්‍රියාමාර්ගවල ශක්‍යතාවය ඇගයීමට ලක් කර නොමැත. එබැවින් මෙම අධ්‍යයනය මෙම හිඩැස් පිළිබඳව අවධාරණය කරන අතර ඉදිවෙමින් පවතින පොම්පයට වඩා හොඳ සම්බන්ධතාවයක් සඳහා පවතින ඇළ පද්ධතියට කළ යුතු වැඩිදියුණු කිරීම් සොයා ගැනීම සහ පොම්පයට ඇතිවන භාරය අඩු කිරීම කෙරෙහි ඵලදායී ලෙස බලපාන අනෙකුත් ගංවතුර අවම කිරීමේ මැදිහත්වීම්වල ශක්‍යතාව පරීක්ෂා කිරීම අරමුණු කර ඇත.

මෙම අධ්‍යයනයේදී සලකා බලන ලද සැලසුම් ප්‍රතිලාභ කාලය වසර 25 කි. MIKE 11 පදනම් වූ ගංවතුර ආකෘතියක් සංවර්ධනය කරන ලද අතර විවිධ ගංවතුර අවම කිරීමේ අවස්ථා පරීක්ෂා කිරීමේ ප්‍රධාන මෙවලම ලෙස භාවිතා කරන ලදී.



22.) පැලියගොඩ නගර සංවර්ධන ප්‍රදේශයේ ජලාපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන්

2021 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය - රු. මිලියන 9.1.
වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම

2019	2020	2021
රු.මිලියන 3.0	රු.මිලියන 7.48	රු.මිලියන 9.1

පැලියගොඩ නගරය කොළඹ පරිපාලන ප්‍රදේශය තුළ පිහිටි තදාසන්න නගරවලින් එකකි. එබැවින් එය සංවර්ධනය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. පවතින නගරය දැනටමත් තදබදයෙන් පිරී ඇත. එබැවින් අතහැර දමා ඇති කුඹුරු ඉඩමක් සංවර්ධනය කර බස් නැවතුම්පොළ, වෙළඳපොළ යනාදිය එම ස්ථානයට ගෙන යාමෙන්

නගරය පුළුල් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇත. කොළඹ-හොරණ මාර්ගයේ රථවාහන තදබදය වළක්වා ගැනීමට සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි පැලියගොඩ සිට කැස්බෑව හන්දිය දක්වා දිවෙන විකල්ප මාර්ගයක් දැනටමත් ඉදිකර ඇත.


මේ වනවිට විකල්ප මාර්ගය සහ පැලියගොඩ නගරයද ඇතුළුව පුරවා ඇති භූමි ප්‍රමාණය අක්කර 40 ක් පමණ වේ. ස්ථානීය ගංවතුර අවම කිරීම සහ විකල්ප මාර්ගය දෙපස නීති විරෝධී ඉඩම් පිරවීම වැළැක්වීම පිණිස සහ ඉහත ඉඩම් පිරවීමේ බලපෑම පියවීම සඳහා සහ ජල අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා මීටර් 10 ඇළ මාර්ගයක් සහ ජල රැඳවුම් ප්‍රදේශයක් හැරීමට යෝජනා කෙරේ.

2019 – 2021 කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 993ක මුළු පිරිවැයක් සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

ගංවතුර අවම කිරීම පිණිස බෝක්කු දෙකක් ඉදිකිරීම සඳහා සවිස්තර සැලසුම් කාර්යයන් 90% ක් සම්පූර්ණ කර RDA සහ UDA සමඟ සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත. පවතින ඇළේ පහළ කොටසේ පිරිසිදු කිරීමේ සහ හැරීමේ කටයුතු අවසන් කර ඇත. ඇළ පහළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර ඇත. උපයෝගිතා සේවා හඳුනාගෙන අදාළ ආයතන දැනුවත් කර ඇත.කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ කටයුතු කරගෙන යාමට නොහැකි විය

සවිස්තර සැලසුම් කිරීමේ කටයුතුවලින් 95% ප්‍රතිශතයක් සම්පූර්ණ කර ඇති අතර මැනුම් කටයුතු සහ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරගෙන යෑමට තිබේ. උපයෝගිතා සේවා බෝක්කු ඉදිකිරීම සඳහා නැවත ස්ථානගත කිරීමේ කටයුතු සමඟ SLLDC සම්බන්ධීකරණ වී ඇත. කොවිඩ් වසංගත සමයේදී මහහැරයෑමේ මාර්ගය ඔස්සේ අනවසර ඉදිකිරීම් කිහිපයක් සිදු කර ඇත.

SLLDC විසින් අනාගත වැඩිදියුණු කිරීම් සහ කාලය දීර්ඝ කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. CEA අනුමැතිය ලැබීමෙන් පසු, SLLDC විසින් NPD වෙතින් කාලය දීර්ඝ කිරීමේ අනුමැතිය සඳහා අයදුම් කරනු ඇත.





23.) කොළඹ සහ පිටත ප්‍රදේශ සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම.

2021 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය – රු.මි. 14
වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම – රු. මි. 14.14

ගංවතුර අවම කිරීම සඳහා දත්ත රැස් කිරීම, මැනුම් කටයුතු සහ කොළඹ සහ පිටත ප්‍රදේශ සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. ප්‍රධාන ජලාපවහන යෝජනා 15ක් අවසන් කර ඇත. තවත් යෝජනා 18ක් සිදු කරමින් පවතී. ඉහත ව්‍යාපෘති 33 ක ලැයිස්තුව පහත සඳහන් වේ.

අංකය	ව්‍යාපෘතිය	සටහන්
1	රාජගිරිය වැලිකඩවත්ත පාලම අසල යෝජිත ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.	නිම කර ඇත
2	252/අ, ගොරකපොල, පානදුර සඳහා ගංවතුර අවම කිරීමේ යෝජනාව.	නිම කර ඇත
3	දෙනියාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජලාපවහන සැලැස්ම.	නිම කර ඇත
4	ඒකල, ඇලෙක්සැන්ද්‍රා ඉඩම සඳහා ගංවතුර අවම කිරීමේ යෝජනාව.	නිම කර ඇත
5	අම්බලන්ගොඩ ශ්‍රී සංඝරාජ විහාරස්ථානයේ යෝජිත "නෙළුම් පොකුණ" සංවර්ධනය සඳහා ජලාපවහන සහ ඉඩම් වැඩිදියුණු කිරීමේ කටයුතු (මූලික කාර්යයන්).	නිම කර ඇත
6	බෝගහගොඩ ඉමුවු ජලාපවහන කළමනාකරණ සැලැස්ම.	නිම කර ඇත
7	ඒකල මධ්‍ය හන්දිය සඳහා ගංවතුර අවම කිරීමේ යෝජනාව.	නිම කර ඇත
8	නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය අසල ජලාපවහන සැලැස්ම.	නිම කර ඇත
9	MOD අකුරගොඩ දකුණු පිවිසුම සඳහා ජලාපවහන සැලැස්ම.	නිම කර ඇත
10	මාලඹේ,චන්ද්‍රිකා කුමාරණතුංග මාවත දීර්ඝ කිරීම	නිම කර ඇත
11	බොල්ගොඩ ඇළ මාර්ගයේ ඉවුරු ආරක්ෂණ කාර්යයන්.	නිම කර ඇත
12	මුතුරාජවෙල තෙත්බිම් සංරක්ෂණය.	නිම කර ඇත
13	වැකඩ, පානදුර සඳහා ජලාපවහන යෝජනාව.	නිම කර ඇත
14	කලුදේවල, රෝහිණිවත්ත, "පැණිඅඹේ කුඹුරු යාය" සංවර්ධන ව්‍යාපෘතිය	නිම කර ඇත
15	නාවල අංගම්පිටිය මාර්ගය (RDA) සඳහා ජලාපවහන සැලැස්ම සකස් කිරීම සහ අනුමැතිය ලබා දීම.	නිම කර ඇත
16	මහජනකාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලා ඇති පොල්ගස්ඕවිට (කහතුඩුව) ප්‍රදේශයේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ යෝජනාවක් සකස් කිරීම. (පිළියන්දල හොරණ පාර ඔස්සේ).	මූලික සැලසුම් නිම කර ඇත
17	මොරගොඩ ඇළ උප ද්‍රෝණියේ ගාල්ල මහනගර සභා ප්‍රදේශයේ ගංවතුර අවම කිරීමේ අධ්‍යයනය.	ශක්‍යතා අධ්‍යයනය සඳහා මූලික අධ්‍යයනය.
18	මීගමුව, නිබිරිගස්කොටුව ප්‍රදේශයේ ජල අපවහන ගැටලුව	සැලසුම් කිරීම නිම කර ඇත. ක්‍රියාත්මක කිරීම සිදු කරමින් පවතී
19	ලේක් ගාර්ඩන් ජලාපවහන ගැටලුව සඳහා යෝජිත ජලාපවහන සැලැස්ම	මූලික සැලසුම් නිම කර ඇත
20	අකුරැස්ස නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජලාපවහන වැඩිදියුණු කිරීමේ යෝජනාව	ජලාපවහන සැලැස්ම නිම කර ඇත.NPD

අංකය	ව්‍යාපෘතිය	සටහන්
		අනුමැතිය ඉල්ලා ඇත.
21	බිඳුණු ඇළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය.	ක්‍රියාත්මක කිරීම සඳහා NPD අනුමැතිය ලබා ගැනීම.
22	මීගමුව, දූනගල්පිටිය සඳහා තාවකාලික ජලාපවහන සැලැස්මක් සකස් කිරීම.	කාර්යයන් සිදු කරමින් පවතී
23	කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ගංවතුර සඳහා වැසි ජල අපවහන යෝජනා සකස් කිරීම. (දෙහිවල, බුත්ගමුව, කළුබෝවිල, රාජගිරිය, කළුබෝවිල අවසන් කර ඇත, මන්නාරම 50% අවසන් කර ඇත.)	කාර්යයන් සිදු කරමින් පවතී
24	ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ගංවතුර සඳහා වැසි ජල අපවහන යෝජනා සකස් කිරීම.(ඇලෙක්සැන්ඩ්‍රාවත්ත-ඒකල, වැලිසර ඩිස්පෙන්සරි පාර සහ ගනේමුල්ල-කුසුවත්ත අවසන් කර ඇත.	කාර්යයන් සිදු කරමින් පවතී
25	වස්කඩුව සඳහා යෝජිත ජලාපවහන වැඩිදියුණු කිරීමේ සැලැස්ම.	කාර්යයන් සිදු කරමින් පවතී
26	වස්කඩුව, දෙදියවෙල ගංවතුර අවම කිරීමේ යෝජනාව.	කාර්යයන් සිදු කරමින් පවතී
27	නාවලපිටිය සඳහා ජලාපවහන යෝජනාව.	කාර්යයන් සිදු කරමින් පවතී
28	කොරලවැල්ල ප්‍රදේශය සඳහා ජලාපවහන යෝජනාව.	කාර්යයන් සිදු කරමින් පවතී
29	මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම - බුත්තල නගරය.	කාර්යයන් සිදු කරමින් පවතී
30	රක්වාන සහ ඕපනායක ගංවතුර ගැටලුව.	කාර්යයන් සිදු කරමින් පවතී
31	සීදුව, මහින්ද රාජපක්ෂපුර ජලාපවහන වැඩි දියුණු කිරීමේ යෝජනාව	කාර්යයන් සිදු කරමින් පවතී
32	පානදුර, පන්විල ඇළ මාර්ගය සඳහා ජලාපවහන යෝජනාව.	කාර්යයන් සිදු කරමින් පවතී
33	මාලඹේ නගර සංවර්ධන ව්‍යාපෘතිය.	කාර්යයන් සිදු කරමින් පවතී

24. රත්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය

සේවාදායකයා	SLLDC
සැලසුම් සහ ඉදිකිරීම්	SLLDC
මුළු උපදේශන ගාස්තුව	රු.මිලියන 8
ආරම්භ කළ දිනය	2021 නොවැම්බර් 17

ජාතික ප්‍රතිපත්ති රාමුව මඟින් හඳුන්වා දුන් භෞතික අවකාශය භාවිතය සඳහා නව ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමේදී; නාගරික සංවර්ධන අධිකාරිය විසින් "රත්ගම" නව නගර සංවර්ධන ව්‍යාපෘතියක් යෝජනා කර ඇත. යෝජනාවේ අරමුණු අනුව, සේවා මධ්‍යස්ථාන ලෙස ගාලු නගරයේ තදාසන්න ප්‍රදේශ සංවර්ධනය කිරීම, SLLDC විසින් ජලාපවහන පහසුකම් වැඩි දියුණු කිරීම සහ පාරිසරික තිරසරභාවය ආරක්ෂා කිරීම සමඟින් ජල පෙරටු තිරසර නගරයක් යෝජනා කර ඇත.

අරමුණු

රථවාහන තදබදය, යටිතල පහසුකම්, ප්‍රජාව සහ විවෘත අවකාශයන් පිළිබඳ නැඟී එන ගැටලු විසඳමින්, නගරය භාවිතා කරන්නන්ට සුවපහසුව සහ පහසුව වැඩිදියුණු කිරීම සඳහා තිරසර සහ අනාගත නගරයක් ලෙස රත්ගම සංවර්ධනය කිරීම.

කාර්යයෙහි විෂය පථය

- ජල විද්‍යාත්මක සහ ජල ගතික අධ්‍යයන.
- ජල විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම. විශේෂ ව්‍යාපෘති අංශය විසින් සිදු කරන ලදී
- ව්‍යාපෘතිය සඳහා පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීම.
- තිරසර නගර සංවර්ධනයේ ප්‍රධාන සංකල්පීය සැලැස්ම සකස් කිරීම.
- සංකල්පීය කලාපකරණ යෝජනාව සකස් කිරීම සහ කලාප සැලැස්ම විස්තර කිරීම
- ඇවිදීමේ මංතීරු, ජල පෙරටු උද්‍යාන සහිත විවෘත පොදු අවකාශයන් සකස් කිරීම, සහ සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම.
- ඉඩම් සංවර්ධන කිරීම සහ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම.

ප්‍රධාන සැලැස්ම



25. අකුරල ඒකාබද්ධ පරිසර උද්‍යානය සංවර්ධනය කිරීම.

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
සැලසුම් සහ ඉදිකිරීම්	SLLDC
මුළු උපදේශන ගාස්තුව	සිදු කරමින් පවතින කාර්යයන් ඇස්තමේන්තු කරමින් පවතී
2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම	-
ආරම්භ කළ දිනය	-
නිම කළ දිනය	-

දකුණු වෙරළ තීරය සංචාරක ගමනාන්තයක් ලෙස හඳුනාගැනීම, සහ හික්කඩුව සහ ගාල්ල අතර පිහිටා ඇති අකුරල සංචාරක ගමනාන්තයක් ලෙසත් දේශීය ගමනාන්තයක් ලෙසත් ක්‍රියා කිරීමට හැකියාව ඇත. පාරිසරික, සමාජීය හා ආර්ථික විභවයන් යන දෙකම සැලකිල්ලට ගනිමින් SLLDC විසින් පොදු හරිත අවකාශයක් ලෙස ක්‍රියා කිරීම සඳහා ඒකාබද්ධ පාරිසරික සංවර්ධන ව්‍යාපෘතියක් යෝජනා කරන ලදී.

මෙම ස්ථානය විවිධ ක්‍රියාකාරකම් (විවේක උද්‍යානය, පරිසර හිතකාමී ක්‍රියාකාරකම් සහ පරිසර නිකේතන) සමඟින් දවසක් ගත කළ හැකි ස්ථානයක් ලෙස ස්ථානයේ පාරිසරික ස්වභාවය ආරක්ෂා කරමින් සහ වැඩිදියුණු කරමින් සංවර්ධනය කරනු ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් තෙත්බිම් පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නංවන අතරම පාරිසරික සංචාරක ව්‍යාපාරය මෙන්ම තිරසර ජීවන රටා කරා යොමු වීමද ප්‍රවර්ධනය කරනු ඇත.

අරමුණු

නූතන නාගරික ජීවිතයේ ඉල්ලුමට සරිලන පරිදි පොදු හරිත අවකාශය වැඩි කිරීම සහ තෙත් බිම්වල ප්‍රධාන ප්‍රතිලාභ සහ වටිනාකම් පිළිබඳව දැනුම්වත් කිරීම සහ අවබෝධය වැඩි කිරීම. සියලුම අමුත්තන් සඳහා විවේක හා විනෝදාස්වාද පහසුකම් සපයන අතරම ස්වභාවධර්මයේ ජීව ගුණය සහ විවිධත්වය පිළිබඳ දැනුම වැඩි කිරීම සඳහා, තිරසර ප්‍රවේශයකට ක්‍රියා කිරීම සහ ජීවන රටා ගැලපීම් දිරිමත් කිරීම.

කාර්යයෙහි විෂය පථය

- ස්ථානය මැනීම සහ අනුමත කිරීම්.
- ජල විද්‍යාත්මක හා ජල ගතික විද්‍යා අධ්‍යයන.
- සංකල්පීය සැලසුම් යෝජනාව සකස් කිරීම.
- සැලසුම් විස්තර සහ ඉදිකිරීම් ඇඳීම් සකස් කිරීම.
- ඉදිකිරීම් අධීක්ෂණය.

26.) පූජ්‍ය සමන්ත භද්‍ර භික්ෂූන් සඳහා කිඹුලාවල "ස්වභාවික ආහාර මධ්‍යස්ථානය"

සේවාදායකයා	පූජ්‍ය සමන්ත භද්‍ර භික්ෂූන්

සැලසුම් සහ ඉදිකිරීම්	SLLDC
මුළු උපදේශන ගාස්තුව	රු. මිලියන 2
2021 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම	රු. මිලියන 1.5
ආරම්භ කළ දිනය	2021 අගෝස්තු 10

පූජ්‍ය සමන්ත හද්‍ර හිමියන් විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව SLLDC විසින් දේශීය ස්වභාවික ආහාර සඳහා වෙළඳපොළ අවකාශක් ලබා දීම දෙමින් පූජ්‍ය සමන්ත හද්‍ර හිමියන් සඳහා කිඹුලාවල "ස්වාභාවික ආහාර මධ්‍යස්ථානය" යෝජනා කරන ලදී.


තිරසර ප්‍රවේශයක් සහිත නවීන ඉදිකිරීම් සංකල්ප භාවිතා කරමින් සැහැල්ලු ව්‍යුහයක් ලෙස සැලසුම යෝජනා කර ඇත.

අරමුණු

නවීකරණය කරන ලද අවකාශ සංවර්ධන කරා පුරවැසියන් ආකර්ෂණය කර ගන්නා අතරම ඔවුන්ගේ සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සඳහා නාගරික අවකාශයක් තුළ ස්වභාවික ආහාර ප්‍රවර්ධනය කරමින් ස්වභාවික ආහාර සඳහා වෙළඳපොළක් ලෙස නවීන තිරසර අවකාශයක් නිර්මාණය කිරීම.

කාර්යයේ විෂය පථය

- ස්ථානය මැනීම සහ අනුමත කිරීම්.
- සංකල්පීය සැලසුම් යෝජනාව සකස් කිරීම.
- සැලසුම් විස්තර සහ ඉදිකිරීම් ඇඳීම් සකස් කිරීම.
- ඉදිකිරීම් අධීක්ෂණය.



වින්‍යාස සැලැස්ම





ඉදිකිරීමෙන් පසු දිස්වන ආකාරය

27.) කිරිමණ්ඩල මාවත තත්‍ය-කාල ගංවතුර පාලන (RTC) මධ්‍යස්ථානය

කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP) යටතේ ලෝක බැංකු ආධාර මත, තත්‍ය-කාල ගංවතුර පාලන මධ්‍යස්ථාන (RTC) ගොඩනැඟිලි නිර්මාණය නව ඉදිකිරීම් සහ දුව්‍ය තාක්ෂණය භාවිතයෙන් ආරම්භ කරන ලදී. යෝජිත ගොඩනැගිල්ල මහල් 12 කින් සමන්විත ගොඩනැගිල්ලක් වන බැවින් ඒ අනුව සැලසුම් සකස් කර සම්පූර්ණ බරට ඔරොත්තු දෙන පරිදි අත්තිවාරම් ව්‍යුහයන් ඉදිකිරීම සිදු කෙරේ. පළමු අදියර ලෙස කොළඹ පුරවර දෝණියේ තත්‍ය-කාල පාලන පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ ජල කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම පිණිස මහල් පහක් ඉදිකරනු ලැබේ.

සේවාදායකයා	SLLDC
ගෘහනිර්මාණ උපදේශන	SLLDC
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 750
මුළු උපදේශන ගාස්තුව	රු.මිලියන 30
ආරම්භ කළ දිනය	17/12/2017
ව්‍යාපෘති තත්ත්වය	සිදු කරමින් පවතී




28.) අතුරුගිරිය රේඛීය උද්‍යානයේ යෝජිත අලකරණ සහ සංවර්ධන කාර්යයන්:

අතුරුගිරියේ අධිවේගී පිවිසුමට යටින් ඇති රේඛීය උද්‍යානයෙහි පවතින තත්ත්වය කොතලාවල පිටවීම දක්වා බොහෝ දුරක් වැඩිදියුණු කිරීම මෙම අලංකරණ ව්‍යාපෘතියේ අරමුණ වේ.

මානව අන්තර්ක්‍රියා සමඟින් සමාජ-සංස්කෘතික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ දේශීය හා විදේශීය සංචාරකයින් පරිසරයට ආකර්ෂණය කර ඒ ඒ ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ද අරමුණු කර ඇත.

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ උපදේශන	SLLDC
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 630.5
මුළු උපදේශන ගාස්තුව	රු.මිලියන 25.2
ආරම්භ කළ දිනය	11/12/2020
ව්‍යාපෘති තත්ත්වය	සිදු කරමින් පවතී



ප්‍රධාන සැලැස්ම

29.) වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා යෝජිත භූ දර්ශනය සංවර්ධනය කිරීම.

මෙම ව්‍යාපෘතිය 2013 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද අතර, නුගේගොඩ, රත්තනපිටිය සහ බොරලැස්ගමුව ඇතුළු වේරස් ගංගා ද්‍රෝණිය මෙම ව්‍යාපෘතිය සඳහා සලකා බලන ලද ප්‍රදේශය වන අතර ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම්, ආහාර අංගනය, එළිමහන් ව්‍යායාම ශාලාව, ළමා ක්‍රීඩා ප්‍රදේශය වැනි පරිසර හා සම්බන්ධ සේවාවන් ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ඇත.

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ උපදේශන	SLLDC
ව්‍යාපෘති පිරිවැය (භූ දර්ශනය)	වෙල පාර වැව - රු.මිලියන 24 වේරහැර වැව - රු.මිලියන 47 රබර් වත්ත වැව - රු.මිලියන 20 සූරියමල් මාවත වැව - රු.මිලියන 26
ආරම්භ කළ දිනය	2013 අප්‍රේල්
ව්‍යාපෘති තත්ත්වය	සිදු කරමින් පවති

<u>වෙල පාර වැව</u>



වේරහැර වැව



රථ ගාල



රථ ගාල



එළිමහන් ව්‍යායාම අංගනය



ළමා ක්‍රීඩා පෙදෙස

සූරියමල් මාවත



ආහාර අංගනය



රබර් වත්ත වැව



රථ ගාල




ළමා ක්‍රීඩා පෙදෙස


30.) කුරුණෑගල සිට අනුරාධපුරය සහ මොනරාගල දක්වා වැව් සහ ඒ අවට යෝජිත අලංකරණ සහ සංවර්ධන කාර්යයන්.

කෘෂිකාර්මික කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා පවතින තත්ත්වය වැඩිදියුණු කිරීම සහ එම ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතරම දේශීය හා විදේශීය සංචාරකයින් ගම් මට්ටමට ආකර්ෂණය කර ගැනීම මෙම අලංකරණ ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය ග්‍රාමීය කුඹුරු, ප්‍රාදේශීය සංවර්ධන කමිටු සහ ග්‍රාමීය ගොවි සංවිධාන ආශ්‍රිත වැව්, ජලාශ සහ වාරි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ව්‍යායාමයක් ලෙස සිදු කෙරේ.

සේවාදායකයා	නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය
ගෘහනිර්මාණ උපදේශන	SLLDC
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 805
මුළු ගෘහනිර්මාණ උපදේශන ගාස්තුව	රු.මිලියන 32.2
ආරම්භ කළ දිනය	22/05/2021
ව්‍යාපෘති තත්ත්වය	සිදු කරමින් පවතී

- කුරුණෑගල, මැල්සිරිපුර පාලම්මුල්ල වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- ඉබ්බාගමුව, කලගස්වැව වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- ගලේවෙල, කලහකැලේ වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- ගල්කුලම වැව සංවර්ධන ව්‍යාපෘතිය ගල්කුලම.
- කැකිරාව, මාලව වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- මහනුවර, වටපුළුව, වටපුළුව වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- මොනරාගල, මඩුල්ල නෙළුම් වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- මහනුවර, කිරිබත්කුඹුර භූ දර්ශන සංවර්ධනය.
- පුවක්පිටිය වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- ගලපිට වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- කුඩා වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- ඉබ්බන්කටුව, ඉබ්බන්කටුව වැව අසල සංවර්ධන ව්‍යාපෘතිය
- දඹුල්ලේ සළුඅපුල්ලන වැව සංවර්ධන ව්‍යාපෘතිය
- තිබ්බටු වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- උලංකුලම වැව සංවර්ධන ව්‍යාපෘතිය.
- අනුරාධපුර, තිරප්පනේ වැව සංවර්ධන ව්‍යාපෘතිය
- ගලේවෙල, කලහකැලේ වැව සංවර්ධන ව්‍යාපෘතිය.





ගලේවෙල, කලහකැලේ වැව සංවර්ධන ව්‍යාපෘතිය



මොනරාගල නෙළුම් වැව සංවර්ධන ව්‍යාපෘතිය



කැකිරාව, මාලව වැව සංවර්ධන ව්‍යාපෘතිය

31.) නුවරඑළිය යෝජිත සංචාරක බංගලාව.

සේවාදායකයා	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
ගෘහනිර්මාණ උපදේශන	SLLDC
ව්‍යාපෘති පිරිවැය	රු.මිලියන 100
මූළු ගෘහනිර්මාණ උපදේශන ගාස්තුව	රු.මිලියන 4
ආරම්භ කළ දිනය	08/10/2021
ව්‍යාපෘති තත්ත්වය	සවිස්තරාත්මක සැලසුම්කරණ අදියර

දැනට පවතින තනි මහල් සංචාරක බංගලාව මේ වනවිට යල්පැන ගොස් ඇති අතර ඒ සඳහා නිවාඩු කාලය තුළ අමුත්තන්ගේ ඉහළ ඉල්ලුමක් නොමැත. එබැවින් දැනට පවතින මෙම ගොඩනැගිල්ල කාමර ධාරිතාවය ඉහළ නැංවීමට, අලුත්වැඩියා කිරීමට සහ වැඩිදියුණු කිරීමට යෝජනා කර ඇත. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යුහය ශක්තිමත් කරමින් පවතින මහලට නව ඉහළ මහලක් එක් කරනු ඇත. තවද, හානියට පත් කොටස් වැඩිදියුණු කිරීම සහ අවශ්‍ය පරිදි යල් පැන ගිය ව්‍යුහයන් ඉවත් කිරීම සිදු කරනු ලැබේ.





ප්‍රධාන මාර්ගයට දිස් වන ආකාරය

ප්‍රමාණ සමීක්ෂණ අංශය

මෙම අංශය SLLDC හි පර්යේෂණ සහ සැලසුම් අංශය යටතේ ස්ථාපිත කර ඇත. එය ඉතා වැදගත් වන අතර ප්‍රමාණ මැනුම් කටයුතු විශාල ප්‍රදේශයක් ආවරණය කරයි. මෙම අංශය පහත සඳහන් ව්‍යාපෘති වැනි ව්‍යාපෘතිවල පෙර කොන්ත්‍රාත් සහ පසු කොන්ත්‍රාත්තු ක්‍රියාකාරකම්වල නිරත වේ.

1. ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති ඉදිකිරීම්වල සියලුම ප්‍රමාණ ලබා ගැනීම
2. SLLDC මඟින් සිදුකරන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීම
3. සංස්ථාවට ඉදිකිරීම්, ගොඩකිරීම් සහ ජලාපවහන ආශ්‍රිත කාර්යයන් ලබා ගැනීම සඳහා විවෘත ටෙන්ඩර් සඳහා ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගී වීම
4. SLLDC විසින් සිදු කරන ලද ව්‍යාපෘතිවල අන්තර්කාලීන තක්සේරු කිරීම් සහ අවසාන ඇගයීම් සකස් කිරීම
5. විවලන ඇණවුම් සකස් කිරීම
6. හිමිකම් සකස් කිරීම
7. ද්‍රව්‍ය අවශ්‍යතා සකස් කිරීම
8. ටෙන්ඩර් ලේඛන සකස් කිරීම
9. ලංසුකරුගේ පූර්ව සුදුසුකම් ඇගයීම.
10. ටෙන්ඩර් ඇගයීම
11. ටෙන්ඩර්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිවැය සකස් කිරීම, සාකච්ඡා කිරීම සහ විශ්ලේෂණය කිරීම
12. පෙර ලංසු රැස්වීම් සහ ලංසු විවෘත කිරීමේ රැස්වීම් සඳහා සහභාගී වීම
13. නිතිපතා වැඩබිම්වල සංචාරය කිරීම
14. කොන්ත්‍රාත්කරුගේ අන්තර් සහ අවසාන ගෙවීම් සහතික පරීක්ෂා කිරීම සහ සහතික කිරීම
15. කොන්ත්‍රාත්කරුගේ විවලන සහ හිමිකම් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම
16. සේවාදායකයන්, උපදේශකයින් සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ මිල ගණන් සාකච්ඡා කිරීම
17. ව්‍යාපෘති ආශ්‍රිත රැස්වීම් සඳහා සහභාගී වීම
18. කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීම

අපගේ ප්‍රමාණ සමීක්ෂණ අංශය 2021 වර්ෂයේදී SLLDC විසින් භාර ගනු ලැබූ ප්‍රධාන ව්‍යාපෘති සඳහා සේවා සපයන ලදී. ප්‍රමාණ සමීක්ෂණ සේවා සපයන ලද ව්‍යාපෘති සමහරක් පහත ලැයිස්තුගත කර ඇත.

අයිතම අංකය	විස්තරය
1	ගාල්ල, මොරගොඩ ඇළ ප්‍රධාන ඇළ මාර්ගය සහ පන්සල මහහැර යෑමේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිවැරදි කිරීමේ කාර්යයන් කොන්ත්‍රාත්තුව.
2	වෙරළ් ගඟ වැසි ජල, ජලාපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
3	කොළොන්නාව කුණාටු ජල, ජලාපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
4	ඔලියමුල්ල වැසි ජල, ජලාපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
5	යෝජිත බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම
6	උඩවත්ත පාරේ වෙල ප්‍රදේශය සඳහා යෝජිත ව්‍යායාම මංතීරුව
7	කඹුරුගමුව, කඹුරුගමුව වැව යෝජිත ඇවිදීමේ මංතීරුව සහ භූ දර්ශන වැඩිදියුණු කිරීම.
8	කෙරවලපිටිය යෝජිත කසල උද්‍යානය - කොම්පෝස්ට් බලාගාරය අදියර I
9	ගොතටුව ප්‍රදේශයේ තෙත්බිම් අනවසරයෙන් අත් පත් කර ගැනීම වැලැක්වීමේ ව්‍යාපෘතිය.
10	අතුරුගිරිය යෝජිත රේඛීය උද්‍යානය අදියර I සහ II
11	පානදුර ව්‍යාපෘතිය සඳහා යෝජිත ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය.
12	අකුරැස්ස නගර සංවර්ධන ව්‍යාපෘතිය.
13	ශ්‍රී දළදා මාලිගාව සඳහා යටිතල පහසුකම් අදියර V.
14	කොටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 1.
15	රාගම, ජේරලන්ද වැව ප්‍රතිසංස්කරණය කිරීම අදියර 1.
16	බෙලිඅත්ත, අම්පිටිය වැව යෝජිත ඇවිදීමේ මංතීරුව සහ භූ දර්ශනය වැඩිදියුණු කිරීම.
17	ගම්පහ, හෙනරත්ගොඩ හානියට පත් ධාවන පථය නිවැරදි කිරීමේ කටයුතු - අදියර I
18	ගම්පහ, ඔරුතොට ව්‍යායාම මංතීරුව ප්‍රතිසංස්කරණය කිරීම - අදියර I
19	යක්කල, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සඳහා යෝජිත ඇවිදීමේ මංතීරුව.- අදියර I
20	ජා-ඇළ කොටුගොඩ රන්නාක්ක වැව ප්‍රතිසංස්කරණය කිරීම.
21	කොළඹ මැනින් වෙළෙඳපොළේ යෝජිත සංවර්ධන කටයුතු.
22	මන්නාරම කොටුව අවට අගලෙහි රොන්මඩ ඉවත් කිරීම.
23	පැලියගොඩ නිවාස ඒකක 600 ක සැලසුම්, ඉදිකිරීම් සහ මූල්‍ය කටයුතු සඳහා ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
24	මාදිවෙල-බටහිර නාගරික කෘෂිකාර්මික හා පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I සහ II).
25	ගාල්ල, හෝලුවාගොඩ යෝජිත පාරිසරික කෘෂි උද්‍යානය - අදියර I
26	''වාරි සෞභාග්‍ය'' ව්‍යාපෘතිය යටතේ ශ්‍රාමීය වැව් සංවර්ධනය.
27	කොටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 1 සහ II.
28	පිළියන්දල නගර සංවර්ධනය සහ මහහැර යෑමේ මාර්ගය සංවර්ධනය සඳහා ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර I සහ II.
29	තේවාරි කුලම් පොකුණ සහ පිල්ලෙයාර් කෝවිල් කුලම් පොකුණේ යෝජිත රොන්මඩ ඉවත් කිරීමට කාර්යයන්.
30	ග්‍රෙගරි වැවේ ඇවිදීමේ මංතීරුව - තුවරළිය - අදියර I.
31	ගාල්ල, මොරගොඩ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා යෝජිත ව්‍යායාම මංතීරුව.
32	බලපිටිය, කිරිල්ල ඇළ, ඇවිදීමේ මංතීරුව සඳහා යෝජිත සංවර්ධනය. - අදියර I
33	අම්බලන්ගොඩ, රන්දොඹේ ශ්‍රී සංඝරාජ විහාරස්ථානය සඳහා පොදු ස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
34	ජා-ඇළ, මාකේට්ට යෝජිත ව්‍යායාම මංතීරුව.
35	ඉහළ කොත්මලේ බලාගාරය සඳහා ඉවුරු ආරක්ෂණ කාර්යයන්
36	ඉවුරු ආරක්ෂණය අදියර 4 - ගම්පහ උද්භිද උද්‍යානයේ අත්තනගලු ඔය ඇළ ඉවුර ප්‍රතිසංස්කරණය කිරීම.
37	පාර්ලිමේන්තු පරිශ්‍රය වටා රැඳවුම් බැම්ම නිවැරදි කිරීමේ කටයුතු.
38	කළුතර, බිඳුණු ඇළ, සඳහා යෝජිත වැසි ජල අපවහන කටයුතු - අදියර II
39	රොන්මඩ ඉවත් කිරීමේ කාර්යයන් කටුකිතුල් ඔය තලවකැලේ ජලාශ ඉහළ කොත්මලේ බලාගාරය.
40	කෙරවලපිටියේ අභ්‍යන්තර කාණු ඉදිකිරීම.
41	රුක්මල්ගම ඉඩමක් සංවර්ධනය කිරීම සඳහා භාර ගැනීමට ශක්‍යතා ඇගයීම
42	ඔබේසේකරපුර, අරුණෝදය මාවතේ ශ්‍රී සුබෝධි විහාරය අසල යෝජිත ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
43	වැව් ආශ්‍රිතව ආරක්ෂිත වැටක් ඉදි කිරීම.
44	සූරියමල් මාවත එළිමහන් ව්‍යායාම ප්‍රදේශය - 01.
45	කෙරවලපිටිය කැබලි අංක14 දක්වා මීටර් 400ක තීරුවක් සංවර්ධනය කිරීම සඳහා ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම.
46	ප්‍රභූ පිවිසුමේ යෝජිත වහලය සහ උළු විනිවිදභාසය.
47	මහනුවර, ගන්නෝරුව නාගරික සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් සංවර්ධනය (ජලාපවහනය සැලසුම් කිරීම සහ වැඩිදියුණු කිරීම)
48	මහනුවර, පිළිමතලාව නාගරික සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් සංවර්ධනය (ජලාපවහනය සැලසුම් කිරීම සහ වැඩිදියුණු කිරීම)
49	මහනුවර, කටුගස්තොට නාගරික සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් සංවර්ධනය (ජලාපවහන සැලසුම් කිරීම සහ වැඩිදියුණු කිරීම)
50	ජේරලන්ද යෝජිත තෙත්බිම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- දෙවන අදියර II
51	මෘදු ඉවුරුකරණ ප්‍රවේශය භාවිතයෙන් කෝට්ටේ ඇළ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය - දිග-කිලෝමීටර් 3.43
52	252/A, ගොරකපොල ගංවතුර ගැටලුව සඳහා වැසි ජල අපවහන යෝජනාව.
53	කිඹුලාවල ව්‍යායාම් ශාලාව සඳහා යෝජිත ගොඩනැගිල්ල දීර්ඝ කිරීම සඳහා මූලික ඇස්තමේන්තුව.
54	මුලකිච් බස් නැවතුම්පළේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයන්
55	අම්බුළුවාව සංවර්ධනය සඳහා මූලික ඇස්තමේන්තුව.
56	මූතූරාජවෙල තෙත් බිම් සංරක්ෂණ ප්‍රදේශය.
57	ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ගංවතුර සඳහා ගංවතුර අවම කිරීමේ යෝජනාවක් සකස් කිරීම.
58	රජගම පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම.
59	සුගතදාස ක්‍රීඩාංගණයේ අලුත්වැඩියා කාර්යයන්.
60	කළු ඔය දෝණිය - RCC සතරැස් බෝක්කු (පොසිච්කුඹුර සහ කාදිනල් කුරේ මාවත).

තවද අප විසින් පහත සඳහන් අංශවල හැරීම්, ගොඩකිරීම්, ජලාපවහන සහ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණ සමීක්ෂණ සේවා සපයා ඇත.

· ඉදිකිරීම්

· ජලාපවහනය සහ ගොඩකිරීම්

· පිරියත සහ යන්ත්‍රෝපකරණ

· තෙත්බිම් කළමනාකරණය

· සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධනය

පැවති වසංගත තත්ත්වයත් සමඟ පසුගිය වර්ෂයේ අප විසින් හසුරුවන ලද මුළු ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 11,482 කි. බාහිරව සහ අභ්‍යන්තරව සපයන ලද ප්‍රමාණ සමීක්ෂණ සේවා වටිනාකම රු. මිලියන 46.7 කි.

තෙත් බිම් කළමනාකරණ අංශය

හැඳින්වීම

තෙත්බිම් කළමනාකරණ අංශය ඵලදායී තෙත්බිම් කළමනාකරණයක් හරහා කොළඹ නගරයේ තිරසර සංවර්ධනයක් සිදු කරයි. දියසරු උද්‍යානය මානව මැදිහත්වීමෙන් තෙත්බිම් ප්‍රතිසංස්කරණය කිරීමේ සාර්ථක කතාවක සජීවී උදාහරණයකි, එමඟින් අඩු විවිධත්වයෙන් යුත් ප්‍රදේශයක් වගුරු ශාක, ක්ෂීරපායින්, පක්ෂීන්, සමනලුන්, මත්ස්‍යයින්, උභයජීවීන්, උරගයන්, බත්කුරන්, කිඹුලන් සහ ධීවර බළලා, දිය බල්ලා සහ දම් පාට මුහුණැති කොළ වදුරා වැනි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් ඇතුළු තෙත්බිම් ශාක හා සත්ත්ව විශේෂ සඳහා විවිධ වාසස්ථාන සහිත ඉහළ ජෛව විවිධත්වයෙන් යුත් තෙත් බිමක් බවට පත් කළේය. අධ්‍යයන මධ්‍යස්ථානය, විවෘත අධ්‍යයන ප්‍රදේශය, ඇවිදීමේ පුවරු, සමනල උද්‍යානය, ළමා පොකුණ, ඇළ මාර්ග, කුරුළු නැරඹුම් කුළුණ, විවේක මඩුව, කෘෂිකාර්මික ප්‍රදේශය, පරිසර විද්‍යාගාරය, කාර්යාලය, ටිකට්පත් කවුන්ටරය, රථගාල, ගබඩා කාමරය, උත්සව සඳහා ඇඳුම් මාරු කිරීමේ කාමරය සහ කම්කරු මඩුව වැනි ස්වභාවධර්මයට මිශ්‍ර වූ යටිතල පහසුකම් සහිත දියසරු උද්‍යානය අක්කර හැට (60) ක ප්‍රදේශයක විහිදේ. තෙත්බිම් ආශ්‍රිත CEPA (සන්නිවේදන, අධ්‍යාපනය, සහභාගීත්වය සහ දැනුම්වත් කිරීම්) ක්‍රියාකාරකම් සහ දෙස් විදෙස් සංචාරකයින් සඳහා සංචාරක ගමනාන්තයක් සපයන තෙත්බිම් මධ්‍යස්ථානයක් ලෙසින් ක්‍රියා කරන දියසරු උද්‍යානය කොළඹ නගරයේ ප්‍රධාන ස්වභාවික ආකර්ෂණයන්ගෙන් එකක් බවට පත්ව ඇත. දියසරු උද්‍යානයේ වාර්ෂික ක්‍රියාකාරකම් මඟින් “නාගරීකරණයේ ආතතිය මුදා හැරීමේ” දැක්ම වෙනුවෙන් අප කටයුතු කරනු ලැබේ.



අධ්‍යයන මධ්‍යස්ථානය



පුවරු මත ඇවිදීම



විවේක මඩුව



විවෘත අධ්‍යයන ප්‍රදේශය

ජයග්‍රහණ

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් දියසරු උද්‍යානය රජයේ නීති හා රෙගුලාසිවලට අනුව කිහිප වතාවක් වසා දැමුණි. කෙසේවෙතත්, 2021 වසරේ ලෝක තෙත්බිම් දිනය සමරමින් රටේ පවතින සෞඛ්‍ය රෙගුලාසිවලට අනුකූලව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. කීර්තිමත් පරිසර විද්‍යාඥ ආචාර්ය ජගත් ගුණවර්ධන AAL විසින් “තෙත් බිම් ජෛව විවිධත්වය” පිළිබඳ දේශනයක් සහ ස්වභාවධර්මයට ආදරය කරන්නන් සඳහා මාර්ගෝපදේශ චාරිකාවක් පවත්වන ලදී. මෙම උද්‍යානය විවිධ කණ්ඩායම් අතර විශේෂයෙන්ම ළමුන්, විශ්වවිද්‍යාල සිසුන් මෙන්ම එළිමහන් රැස්වීම්, කුරුල්ලන් නැරඹීම, සොබාදහමේ ක්‍රියාකාරකම් සහ ඡායාරූපකරණය වැනි වෙනත් විනෝදාස්වාද සඳහා වඩාත් ජනප්‍රිය තෙත්බිම් අත්දැකීම් සපයන ස්ථානයක් ලෙස පවතී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද පසුගිය වසර තුළ රු.මිලියන 15.5ක මුළු ආදායමක් උපයා ඇත.

2021 ලෝක තෙත්බිම් දිනයේ විශේෂ අවස්ථා









<u>දියසරු උද්‍යානය නඩත්තු කිරීම</u>

ඇළ මාර්ග නඩත්තු කිරීම හා පිරිසිදු කිරීම, තණතිල්ල හා මාර්ග අද්දර තණකොළ කැපීම, අඩි පාරවල් පිරිසිදු කිරීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, ගොඩනැගිලිවල වහලවල් නඩත්තු කිරීම, දැව අත්‍රේල් සහ පාලම් පිළිසකර කිරීම, පැල තවාන, සමනල උද්‍යානය සහ ගෙවත්ත නඩත්තු කිරීම, දම්වැල් වැටවල් පිරිසැකසීම ආදියෙන් උද්‍යානය නිසි ලෙස නඩත්තු කරනු ලැබේ. උද්‍යානය නඩත්තු කිරීම අභියෝගාත්මක වුවද, උද්‍යානය නරඹන්නන්ට සිත් ඇදගන්නාසුළු ස්ථානයක් බවට පත් කිරීමට අපගේ කාර්ය මණ්ඩලය එයට සාර්ථකව මුහුණ දෙයි.

හොඳම ආකර්ශණීය අත්දැකීම් සඳහා අඛණ්ඩ නඩත්තු කිරීම් යටතේ පවතින ප්‍රදේශ







<u>දියසරු උද්‍යානයේ පිවිසුම් සංවර්ධනය කිරීම</u>

දියසරු උද්‍යානයේ පිවිසුම් ප්‍රදේශය සහ නාම පුවරුව 2021 වර්ෂය තුළ අලුතින් නිම කරන ලදී









<u>යෝජිත තෙත්බිම් මධ්‍යස්ථානය සඳහා සැලසුම්</u>

දියසරු උද්‍යානය කොළඹ තෙත්බිම් නගරයේ ප්‍රධාන තෙත්බිම් උද්‍යානය ලෙස සංවර්ධනය කර ඇති අතර එබැවින් දැනට පවතින සැපයුම් පහසුකම් වැඩිදියුණු කිරීම ඉතා වැදගත් වේ. තෙත්බිම් පිළිබඳ සියලුම අංශ පිළිබඳව නරඹන්නන්ට පහසුකම් සැලසීමට සහ දැනුම්වත් කිරීම සඳහා දියසරු උද්‍යානයේ යෝජිත තෙත්බිම් මධ්‍යස්ථානය කොළඹ ප්‍රධාන තෙත්බිම් මධ්‍යස්ථානය ලෙස ඉදිකිරීමට නියමිතය. යෝජිත තෙත්බිම් මධ්‍යස්ථානයේ ගෘහනිර්මාණාත්මක කටයුතු ප්‍රවීණ ගෘහනිර්මාණ ශිල්පී ඉසුරු ද සොයිසා මහතා විසින් සිදු කර ඇත.







ව්‍යාපෘතිය: මෘදු ඉවුරු ප්‍රවේශ්‍ය භාවිතා කරමින් කෝට්ටේ ඇළ මාර්ගයේ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම

2018 වසරේ තෙත්බිම් පිළිබඳ රැම්සා සම්මුතියේ පාර්ශ්වයන්ගේ 13 වැනි සමුළුවේදී කොළඹ නගරය තුළ වර්ග කිලෝමීටර් 19ක නාගරික තෙත් බිම්වල (කොළඹ නගරයේ භූමි ප්‍රමාණයෙන් 15%ක) වැදගත්කම හඳුනාගනිමින් කොළඹ රැම්සා තෙත්බිම් නගරයක් ලෙස ප්‍රතිනතය කර ඇත. වගුරු බිම් සහ කුඹුරු ඇතුලත් වන මෙම තෙත් බිම් පුළුල් ඇළ මාර්ග ජාලයකින් සම්බන්ධ වේ. මෙම ඇළ මාර්ගවලින් සමහරක් ජලය ආශ්‍රිත ප්‍රවාහනය සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලැබේ.

කෝට්ටේ ඇළ මාර්ගය, කිලෝමීටර් 2.91 ක දිගකින් යුක්ත වන අතර කෝට්ටේ වගුරු බිම හරහා ගලා බසින එය කොළඹ නගරය තුළ ඇති එවැනි ප්‍රධාන ඇළ මාර්ගයකි. කෝට්ටේ ඇළ මාර්ගයේ ඇළ ඉවුරු බෑදනය වීම පසුගිය කාලයේ කැපී පෙනුණි. පසෙහි අස්ථාවරත්වය සහ බෝට්ටු නිසා ඇතිවන ජල තරංගවල හාරය හේතුවෙන් එය වේගවත් වී ඇත. ඇළ ඉවුරේ කිලෝමීටර් 2.09 දිගක් (වම් ඉවුර සහ දකුණු ඉවුර යන දෙකම) පමණක් මීට පෙර ගේබියන් හෝ තෙත් පෙදෙරේරු බිත්තිවලින් ආරක්ෂා කර ඇත. මෙම ක්‍රම මිල අධික වන අතර තෙත්බිම් පරිසරයට අහිතකර බලපෑම් ඇති කරයි

එබැවින් කෝට්ටේ ඇළ මාර්ගයේ බෑදනය වූ මෙම ඇළ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පාරිසරික වශයෙන් තිරසර මෘදු ඉවුරු පද්ධතියක් යෝජනා කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (i) පාරිසරික වශයෙන් ආරක්ෂිත සහ ලාභදායී, තිරසර විකල්පයක් මඟින් ඇළ ඉවුරු ස්ථාවර කිරීම සහ (ii) කෝට්ටේ ඇළ මාර්ගයේ සපයනු ලබන සෞන්දර්යාත්මක සහ පරිසර පද්ධති සේවා වැඩිදියුණු කිරීමයි.

මෘදු ඉවුරු පද්ධතිය තුළ කොහු භූ-රෙදිපිළි, කොහු කඳන් සහ විශේෂිත ආවරණ බෝග අඩංගු වේ. ඇළ ඉවුර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා, එහි තීව්‍ර මූල ජාලය හේතුවෙන් ආවරණ බෝගයක් ලෙස *Vetiveria zizanoids* (වෙටිවර් තෘණ) තෝරා ගන්නා ලදී. පස් පිරවීම මඟින් ඇළ ඉවුරු එහි මුල් ස්වරූපයට වැඩිදියුණු කරන ලදී. බෝට්ටු ප්‍රේරිත තරංග හාරය සඳහා මූලික බාධකයක් ලෙස ක්‍රියා කිරීම සඳහා ඇළ ඉවුරු පාදයේ කොහුබත් කඳන් සවි කරන ලදී. Vetiveria zizanoids ස්ථායී වන තෙක් පාංශු බෑදනය පාලනය කිරීම සඳහා කොහු භූ-රෙදිපිළි බෑවුම හරහා අතුරන ලදී. මෙම කොහු නිෂ්පාදන වසර 3 සිට 5 දක්වා පවතින අතර Vetiveria zizanoids තමන් විසින්ම ස්ථාපනය වෙමින් අවසානයේ ඉවුරෙහි මුල් බැස ගනු ඇත. මෙම නිෂ්පාදන පෛව හායනය වන විට, තීව්‍ර ස්වභාවික මූල ව්‍යුහයක් සමඟ ඉවුර ස්ථාවර කිරීමට ශාක සහ මුල් පවතිනු ඇත.

මෙම ක්‍රමයේ යෝග්‍යතාවය ඇගයීම සඳහා මෘදු ඉවුරු ව්‍යාපෘතිය 2020 වර්ෂය අවසානයේ නියමු පරිමාණයෙන් දියත් කරන ලදී. 2021 වර්ෂයේ පළමු කාර්තුව තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස කෝට්ටේ ඇළ ආරම්භක ස්ථානය ආසන්නයේ ඇළ ඉවුරේ මීටර් 100 ක දුරක් නිම කරන ලදී.



රූපය 1 : ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිම වූ වහාම



රූපය 2: ව්‍යාපෘතිය නිම වීමෙන් මාස තුනකට පසු

නියමු ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් පසු කෝට්ටේ ඇළ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රධාන ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

කෝට්ටේ ඇළෙහි මෘදු ඉවුරු පද්ධතිය මඟින් ඇළ ඉවුරුවල ස්වභාවික වෘක්ෂලතාදිය යථා තත්ත්වයට පත් කිරීමටත්, එමඟින් සත්ත්ව විශේෂ සඳහා හිතකර වාසස්ථානයක් නිර්මාණය කිරීමටත්, වගුරු බිම්වල සිටින උරගයින්ට, උභයජීවීන්ට සහ පක්ෂීන්ට පහසුවෙන් ජල මාර්ගවලට ඇතුළු වීමටත් ඉඩ සලසයි. මෙම ක්‍රමය මඟින් නාගරික ප්‍රදේශවල ඝන අංශු හසුකර ගැනීමෙන් සහ ජල මාර්ගවලට ඇතුළු වීමට පෙර නාගරික අපද්‍රව්‍යවල ඇති බැර ලෝහ

අවශෝෂණය කිරීමෙන් නාගරික ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරනු ඇත.

මෙම ව්‍යාපෘතියෙන් ප්‍රජාවට ද ඉමහත් ප්‍රතිලාභ ලැබෙනු ඇත. එය දේපල වටිනාකම් වැඩි කිරීම, පාරිසරික සංචාරක අවස්ථා වැඩි කිරීම, සිත් ඇදගන්නා ඇළ ඉවුරු ඇති වීම, වැඩිදියුණු වූ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ඇති වීම සහ විශ්මය ජනක පරිසරයක වැඩ කිරීමේ සහ ජීවත්වීමේ ස්වයං තෘප්තිය වැඩි කිරීමට හේතු වේ. ප්‍රතිලාභ ප්‍රාදේශීයව සහ අවසානයේ රටේ සියලුම පුරවැසියන්ට ලැබෙනු ඇත.

කොළඹ ජල තත්ත්වය වැඩි දියුණු කිරීමේ වැඩසටහන

ඉහළ යන ජනගහනය, සීමිත සම්පත් සහ දේශගුණික විපර්යාසවල වර්ධනය වන බලපෑම් හේතුවෙන් කොළඹ නගරය වැඩිවන පීඩනයකට මුහුණ දෙයි. ජල දූෂණය, නගරය තුළ සෞඛ්‍ය සම්පන්න සහ තිරසර ජීවන පරිසරයක් ඇති කිරීම සඳහා ඉක්මනින් විසඳිය යුතු ප්‍රධාන අභියෝගයකි.

SLLDC හට ඇළ මාර්ග පිළිබඳ අධිකරණ බලය ඇති අතර ඒවායේ සාමාන්‍ය නඩත්තුව, මූලික වශයෙන් වැසි ජලය බැස යෑම සහ දූෂණයෙන් තොර ජල මාර්ග නඩත්තු කිරීම සඳහා වගකීම දරයි. දූෂණයෙන් තොර ජල මාර්ග පවත්වා ගෙන යෑම සඳහා SLLDC විසින් දරන ලද සියලු උත්සාහයන් හමුවේ වුවද, කොළඹ ඇළ මාර්ග පද්ධතිය දූෂණය වී ඇත. කොළඹ පුරවර කලාපයේ (CMR) ජලාපවහන ජල පෝෂක ප්‍රමාණයෙන් 65% කට වඩා ප්‍රමාණයක ජලයේ තත්ත්වය නුසුදුසු මට්ටමේ සිට ඉතා නුසුදුසු මට්ටම දක්වා පරාසයක පවතින බව 2016 දී සිදු කරන ලද තෙත්බිම් කළමනාකරණ උපායමාර්ග (WMS) අධ්‍යයනයේ නිගමනය විය.

එබැවින්, වැඩිවන පරිසර දූෂණය සහ ඒ ආශ්‍රිත බලපෑම් අවම කිරීම සඳහා, කොළඹ පුරවර කලාපය සඳහා දිගුකාලීන තිරසර ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.
ඒ අනුව, CWQM වැඩසටහන පියවර හයකින් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත, එනම් (1) හවුල්කාරිත්වයන් ගොඩනැගීම, (2) ගැටලු හඳුනාගැනීම සඳහා කොළඹ ජල පෝෂක ප්‍රදේශය විදහා දැක්වීම (3) අභිමතාර්ථ සකස් කිරීම සහ ගැටලු හඳුනාගැනීම, (4) ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීම, (5) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ, (6) ප්‍රගති සමාලෝචනය සහ ගැලපීම් සිදු කිරීම

වැඩිවන ජනගහනය සහ නාගරීකරණය හේතුවෙන් පාර්ලිමේන්තු වැව ජල පෝෂක ප්‍රදේශය ද කාලයත් සමඟ විවිධ පාරිසරික, සමාජීය සහ ආර්ථික වෙනස්කම්වලට ලක්ව ඇත. කෙසේවෙතත්, 2016 දී තෙත්බිම් කළමනාකරණ උපායමාර්ගයේ දක්වා ඇති පරිදි, පාර්ලිමේන්තු වැවේ ජල පෝෂක ප්‍රදේශය "හොඳ" තත්ත්වයේ ජලය සහිත ලෙස වර්ගීකරණය කර ඇත. ජල පෝෂක ප්‍රදේශයේ ජල මාර්ග දූෂණය වීම මෑත අතීතයේ දී ප්‍රකට වූ එවැනි ගැටලුවකි.

2021 මාර්තු දෙවන සතියේදී පාර්ලිමේන්තු වැවේ සහ ඩෙන්සිල් කොඩිබෑකඩුව මාවත සහ බත්තරමුල්ල ආරක්ෂක අමාත්‍යාංශය මාර්ගය ඔස්සේ වැවට ගලා බසින සම්බන්ධිත ජල මාර්ගවල කහ-දුඹුරු පැහැති මණ්ඩියක් ලෙස දිස්වන ඇල්ගී පිපීම නිරීක්ෂණය විය. ඒ අනුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC), ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය, ශ්‍රී ලංකා නාවික හමුදාව, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ගොඩනැගිලි සහ පර්යේෂණ සංවිධානය විසින් ජල ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ මඟපෙන්වීම සහිතව මෙම ගැටලුව නිවැරදි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

අනතුරුව, 2021 අප්‍රේල් 19 වන දින ගරු කථානායකතුමා ගේ සභාපතිත්වයෙන් පැවති රැස්වීමේදී, ජල පෝෂක කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව සවිස්තරාත්මකව සාකච්ඡා කළ අතර ඒ සඳහා කාර්ය සාධක බලකායක අවශ්‍යතාව අවධාරණය කෙරිණි. ඒ අනුව, 2021 මැයි 10 දිනැති අංක: wum/0764/321/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ශ්‍රී ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු සංකීර්ණය අසලින් ගලා බසින දියවන්නා ඔය ආශ්‍රිත ජල මාර්ගවල දූෂණය පාලනය කිරීම සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වූ කාර්ය සාධක බලකායක් ස්ථාපිත කරන ලදී.

තාක්ෂණික සම්බන්ධීකාරක සහ කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු ලෙස SLLDC කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ විය. කළමනාකරණ සැලැස්මට අභිමතාර්ථ, අරමුණු, සහ වගකීම් සහිත ක්‍රියාකාරකම්, කාල නියමයක් සහ අවශ්‍ය සම්පත් ඇතුළත් විය. කළමනාකරණ සැලැස්මේ අභිමතාර්ථ පහත පරිදි වේ;

අභිමතාර්ථය 1: ඇල්ගී ඇති වන වාර ගණන සහ බරපතලකම අඩු කිරීම

අභිමතාර්ථය 2: ජලාශවෙහි සෞන්දර්යාත්මක වටිනාකම සහ විනෝදාස්වාද විභවය වැඩිදියුණු කිරීම

අභිමතාර්ථය 3: සෞඛ්‍ය සම්පන්න සහ විවිධ ජලජ ජීව විද්‍යාත්මක ප්‍රජා ව්‍යුහයක් පවත්වා ගැනීම

අභිමතාර්ථය 4: ඉවුරු තීරය යථා තත්ත්වයට පත් කිරීම සහ ආරක්ෂා කිරීම

අභිමතාර්ථය 5: කළමනාකරණ සැලසුම් සහ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීම සහ සම්පත් සංවර්ධනය කිරීම

අභිමතාර්ථය 6: පර්යේෂණ ප්‍රජාව, පෞද්ගලික අංශය සහ වෙනත් උනන්දුවක් දක්වන කණ්ඩායම්වල සහභාගීත්වය සහ දායකත්වය ප්‍රවර්ධනය කිරීම

අභිමතාර්ථය 7: කළමනාකරණ අරමුණු සහ උපාය මාර්ග සුදුසු පරිදි යාවත්කාලීන කිරීමට ප්‍රගතිය අධීක්ෂණය කිරීම

කළමනාකරණ සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් වර්ගීකරණය කර ඇති අතර SLLDC ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් විසින් මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

ශාකප්‍රතිකර්ම භාවිතයෙන් බෙරේ වැවේ ජලයේ ගුණාත්මක බව යථා තත්ත්වයට පත් කිරීම



බෙරේ වැව (BL) යනු කොළඹ හෙක්ටයාර 65 (අක්කර 162) ක පැතිරී ඇති නොගැඹුරු ජලාශයක් වන අතර සාමාන්‍ය ජල ගැඹුර මීටර් 1.67 කි. එය ප්‍රධාන ද්‍රෝණි හතරකින් සමන්විත විය; නැගෙනහිර වැව, ගාලුමුවදොර වැව, බටහිර වැව සහ නිරිත දිග වැව. බෙරේ වැව පාවෙන වෙළෙඳපොළ සහ ඇහිලි අංශය යනු නැගෙනහිර වැවට සම්බන්ධ කුඩා හා බණ්ඩනය වූ ජලාශ දෙකකි. බෙරේ වැව මැකලම් අගුළු ගේට්ටු හරහා කොළඹ වරායට ද, ශාන්ත සෙබස්තියන් ඇළ හරහා කැලණි ගඟට ද, පැරණි පාර්ලිමේන්තුව අසල පිහිටි අර්ධ චන්ද්‍රාකාර පිටවානකින් ඉන්දියන් සාගරයට ද සම්බන්ධ වේ.

ආරම්භයේදී බෙරේ වැව ආශ්‍රිත ප්‍රදේශය එහි ජල පෝෂකයෙන් ගලා එන දූෂක අවශෝෂණය කර පිරිසිදු කිරීමට අනුවර්තනය වූ වගුරු බිමක් විය. කෙසේවෙතත්, මෙම වගුරු බිම් නාගරික පරිසරය තුළ ඉදිකරන ලද ප්‍රදේශ හෝ මාර්ග බවට පරිවර්තනය වී ඇති අතර එමඟින් සම්පූර්ණ දූෂණ භාරය බෙරේ වැවට මුදා හැරේ. තවද දැනට පවතින මලාපවහන සහ අපජල සහ වැසි ජල අපවහන මාර්ග සියවසකට වඩා පැරණි වන අතර ඒවා අවශ්‍ය ධාරිතාවට වඩා අඩු

බැවින් වැව ආශ්‍රිත පුරවැසියන්ට අපජල නල වැසි ජල අපවහන නලවලට නීති විරෝධී ලෙස සම්බන්ධ කිරීමට හැකි වේ.



මෙම සියලු තත්ත්වයන්ගේ සමුච්චිත ප්‍රතිඵලයක් ලෙස, වර්තමාන බෙරේ වැවෙහි පවතින පෝෂක ප්‍රමාණය (එනම් නයිට්‍රේට් සහ පොස්පේට් ප්‍රමාණය) අධික වන අතර, සමතුලිත ජලජ පාරිසරික ක්‍රියාවලියට අහිතකර තත්ත්වයන් නිර්මාණය කරමින්, අධි සුපෝෂක තත්ත්වයක පවතින අතර බෙරේ වැවේ ජලයේ කොළ පැහැති මණ්ඩි ඇතිවීමට හේතුවන හානිකර සයනොබැක්ටීරියා (නිල් කොළ ඇල්ගී) වර්ධනය විකල්ප වශයෙන් ප්‍රවර්ධනය කරනු ලැබේ. ඇල්ගී විෂ හේතුවෙන් ජලජ ජීවීන් හා මිනිසා යන දෙකොටියාසයටම විෂ වීම හැරුණු විට අප්‍රසන්න පෙනුම සහ ඉඳහිට වහනය වන දුර්ගන්ධය එවැනි ඇල්ගී වර්ධනය වීම්වල ප්‍රධාන ප්‍රතිවිපාක වේ.

අධික පිරිවැයක් අවශ්‍ය වන ස්ථානයට විශේෂිත වූ අභිරුචිකරණ විසඳුම් අවශ්‍ය වීම, ඉඩකඩ සහ තාක්ෂණය යනාදී බොහෝ හේතු නිසා එවැනි ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම අභියෝගාත්මක ය. අනෙක් අතට වැවට ගලා පසින දූෂණය භාරය පාලනය නොකර එවැනි පිරිවැයක් දැරීමට ශක්‍ය ප්‍රවේශයක් නොවේ. මලාපවහන හා අපජල මාර්ග අලුත්වැඩියා කිරීම සහ/හෝ යාවත්කාලීන කිරීම සහ අසංවිධානාත්මක ජනාවාස නැවත ස්ථානගත කිරීම ද කාලය ගත වන ක්‍රියාවලියකි.
එබැවින් SLLDC හි සභාපති මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතාගේ මහපෙන්වීම සහ අධීක්ෂණය යටතේ බෙරේ වැවේ ජල තත්ත්ව ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බෙරේ වැවේ පාවෙන පිරිපහදු තෙත්බිම් (FTWs) ස්ථානගත කිරීමට SLLDC පියවර ගන්නා ලදී. පාවෙන පිරිපහදු තෙත් බිම් (FTW) යනු ශාක සහිත පාවෙන පැදුරු වේ. මෙම පැදුරු PVC වැනි සැහැල්ලු හා කල් පවතින ද්‍රව්‍යවලින් නිර්මාණය කර ඇති අතර ජලයේ දියවී ඇති අතිරික්ත දූෂක අවශෝෂණය කර ගැනීම සඳහා බුත්සරණ, හෙලිකෝනියා සහ වෙටිවර් තෘණ වැනි විශේෂිත ශාක ඒ මත වගා කර ඇත. මෙම ශාක මූලයන් හිතකර බැක්ටීරියා සඳහා නිවහන සපයන අතර එය සුදුසු උපස්ථරයක් ලබා දීමෙන් ජලය පිරිසිදු කිරීමට උපකාරී වේ. මෙම ශාක වැවේ ඇති නයිට්‍රේට් සහ පොස්පේට් වැනි අධික පෝෂක ද්‍රව්‍ය අවශෝෂණය කරක අතරම වැවට අමතර අලංකාරයක් ලබා දෙයි.

මෙම තෝරාගත් විශේෂවලට වැව් පද්ධතියෙන් අතිරික්ත පෝෂක ඉවත් කිරීමේ හැකියාව විද්‍යාත්මක පර්යේෂණ මඟින් ඔප්පු කර ඇත. ඒ අනුව බෙරේ වැවෙන් 30%ක් පමණ ආවරණය වන පරිදි යොදන ලද FTWs මඟින් ජලයේ පැහැදිලි බව, ඉඳහිට හමන දුර්ගන්ධය අඩු වීම, හිතකර ජලජ ජීවීන්ගේ වර්ධනය යනාදිය ඇතුළුව බෙරේ වැවේ දෘශ්‍යමාන වෙනස්කම් කරා ළඟා වීමට හේතු වී ඇත. එබැවින් අනාගතයේදී මෙම FTWs ජලයේ පිරිහුණු ගුණාත්මකභාවය යථා තත්ත්වයට පත් කරන අතරතුර ජලාශයේ භූ දර්ශනය සඳහා ද භාවිතා කරනු ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහභාගීත්වයෙන් මේ සඳහා මූලපිරීමක් ලෙස FTWs දහසකට අධික ප්‍රමාණයක් නිරිත දිග බෙරේ වැවේ තැන්පත් කරන ලදී. වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයා, වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ නාගරික කොමසාරිස්වරයා SLLDC හි සාමාන්‍යාධිකාරිවරයා සහ අනෙකුත් නිලධාරීන් සමඟ මෙම අවස්ථාවට සහභාගී විය.



අධ්‍යයනය: කොළඹ තෙත් බිම් සංකීර්ණයේ කාබන් තිර කිරීමේ විභවය තක්සේරු කිරීම

වර්තමානයේ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම සහ දේශගුණික විපර්යාස වැඩි වෙමින් පවතී. පොසිල ඉන්ධන දහනය, වන විනාශය සහ නාගරීකරණය වැනි ක්‍රියාකාරකම් හේතුවෙන් හරිතාගාර වායු විශාල ප්‍රමාණයක් වායුගෝලයට මුදා හැරේ.

වායුගෝලයෙන් CO_2 ග්‍රහණය කර ගැනීමට දායක වන භූ විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක ක්‍රම ලෙස ප්‍රධාන ක්‍රම දෙකක් නිබේ. පස සහ ශාක විශාලතම කාබන් ගබඩා ප්‍රභවයන් ලෙස පුළුල් ලෙස සලකනු ලබන අතර ඒවා ස්වභාවික වෙල්ලාව හෝ "කාබන් ගිල්වන" ලෙස හැඳින්වේ. ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය හරිත ශාකවලට වායුගෝලීය CO_2 ග්‍රහණය කර ඒවා වර්ධනය වනවිට කාබනික කාබන් බවට පරිවර්තනය කිරීමට ඉඩ සලසයි. භෞම්කව සහ බොහෝ විට ශාකවල වැඩි පරිමාවක් සහ දිගු ගබඩා කාලයක් ඇති බැවින් වැඩි කාබන් ප්‍රමාණයක් ගබඩා කරයි. කොළ, දැව, මුල් සහ පස වැනි ශාකවල විවිධ කොටස් තුළ වායුගෝලීය කාබන් ගබඩා කර ඇත. සියලු වර්ගවල ශාක මෙන්, වගා නොකළ කෙත්වතු සහ තණබිම් කාබන් උරාගන්නා අතර එමඟින් පසෙහි කාබන් ගබඩා කරයි.

පාංශු කාබනික කාබන් යනු පසෙහි කාබනික ද්‍රව්‍යවල පවතින කාබන් ප්‍රමාණයයි. පාංශු කාබනික ද්‍රව්‍යවලට ශාක අපද්‍රව්‍ය, ජීව මූල පද්ධති, ජීව විද්‍යාත්මක ජීවීන් සහ විවිධ ප්‍රමාණයේ දිරාපත් වන, දිරාපත් වූ හෝ පිළිස්සුණු ද්‍රව්‍ය වැනි පසෙහි ඇති සියලුම ජීව විද්‍යාත්මක සම්භවයක් ඇති ද්‍රව්‍ය ඇතුළත් වේ. පාංශු කාබන් ප්‍රමාණය භූමියට ඉහළ පෛව ස්කන්ධය මෙන් තුන් ගුණයක් සහ වායුගෝලයේ මෙන් දෙගුණයක් පමණ වේ.

පසෙහි විවිධ්‍ය කාබන් ප්‍රමාණයක් හෝ මට්ටමක් ඇති තරමින් භෞතික පරිසර පද්ධතිය සහ වායුගෝලය අතර කාබන් ප්‍රමාණයේ ඇතුළුවීමේ සහ පිටවීමේ චක්‍රයක් සෑම විටම පවතී. එබැවින් පාංශු කාබන් වායුගෝලයට මුදා හරින CO_2 ජ්‍රමාණයේ ප්‍රධාන නිර්ණායකයක් ලෙස ක්‍රියා කරයි. පස, කළමනාකරණය සහ ඉඩම් පරිහරණය මත පදනම්ව, CO_2, CH_4, N_2O වැනි හරිතාගාර වායුවල ප්‍රභවයක් හෝ ගිල්වනයක් ලෙස ක්‍රියා කරයි.

තෙත්බිම් යනු ගෝලීය වශයෙන් වැදගත් කාබන් ගිල්වන වන අතර, විශාල කාබන් ප්‍රමාණයක් ගබඩා කර ගනිමින් දේශගුණික විපර්යාස අවම කිරීමට උපකාරී වේ. වර්තමානයේ වායුගෝලයට කාබන් විමෝචනය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. එබැවින් කාබන් විමෝචනය සහ තිර කර ගැනීමේ ක්‍රියාවලීන් අතර සමතුලිතතාවයක් ඇති කිරීම අවශ්‍ය වේ. ශාක ප්‍රභාසංශ්ලේෂණය සාමාන්‍යයෙන් කාබන් තිර කර ගනිමින් මෙම සමතුලිතතාවය පවත්වා ගැනීමට උත්සාහ කරයි. තොරතුරුවලට අනුව, තෙත්බිම්වල අනෙකුත් පාරිසරික තත්ත්වයන්ට වඩා වැඩි කාබන් ප්‍රමාණයක් රඳවා ගත හැකිය. එබැවින් කාබන් විමෝචනය සහ ග්‍රහණය කර ගැනීමේ ක්‍රියාවලීන් අතර සමතුලිතතාවය පවත්වා ගැනීමට තෙත් බිම් ඉහළ දායකත්වයක් ලබා දෙයි. එබැවින්, තෙත් බිම්වල කාබන් තිර කිරීමේ අනුපාතය ගණනය කිරීම අවශ්‍ය වේ. එබැවින් මෙම අධ්‍යයනයෙන් කොළඹ පුරවර ප්‍රදේශයේ තෙත් බිම්වල කාබන් තිර කිරීමේ ධාරිතාව මැනීමට සැලසුම් කරයි.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ තෙත්බිම් කළමනාකරණ අංශය කොළොන්නාව වගුරු බිම, හීන්-ඇළ වගුරු බිම, මාදින්නාගොඩ වගුරු බිම, දියසරු උද්‍යානය සහ කෝට්ටේ


වගුරු බිම යන තෝරාගත් තෙත්බිම් පහක් තුළ මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කරගෙන යයි. මෙය පරිසරයේ තෙත් සහ වියළි තත්ත්වයන් අනුව සිදු කරන ලද රසායනාගාර සහ ක්ෂේත්‍ර පාදක අධ්‍යයනයකි.

මෙම අධ්‍යයනය මගින් නාගරික තෙත්බිම් කාබන් තිර කිරීමේ ක්‍රියාවලියට දායක වන ආකාරය පිළිබඳ සංඛ්‍යානමය දත්ත සමුදායක් සපයන අතර අවසානයේ ගෝලීය උණුසුම අඩු කිරීම සඳහා නාගරික තෙත් බිම් වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. මෙය ඉදිරියේදී තෙත්බිම් පිළිබඳ විවිධ පර්යේෂණ අධ්‍යයන සඳහා මූලික වේදිකාවක් සපයන විශිෂ්ට අධ්‍යයනයක් වනු ඇත.

<u>තෙත් බිම් අනවසරයෙන් අත් පත් කර ගැනීම වැළැක්වීමේ ව්‍යාපෘතිය – අදියර I – ගොතටුව ප්‍රදේශය</u>

<u>කොළොන්නාව වගුරු බිමේ අත්පත් කරගත් ඉඩම් මායිම් වටා ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීම</u>


හැඳින්වීම




කොළඹ ජල පෝෂක ප්‍රදේශය තුළ ප්‍රධාන වගුරු බිම් හතරේ අත්පත් කරගත් ඉඩම් මායිම් යළි විවෘත කිරීමේ ව්‍යාපෘතියෙන් පසුව, වගුරු බිම් ආශ්‍රිතව සිටින පුද්ගලයන්ගේ අනවසර අත් පත් කර ගැනීම් හේතුවෙන් අත්පත් කරගත් ඉඩම් ප්‍රමාණය ඉතා ශීඝ්‍රයෙන් අහිමි වෙමින් පවතින බව හඳුනාගත හැකිය. මෙම ගැටලුවට විසඳුමක් ලෙස, ජලය රඳවා තබා ගැනීමේ ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් මායිම ඔස්සේ ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීමට තීරණය කරන ලදී.

මෙහි 1 වන අදියර ලෙස, මූලික සැලැසුම් අංක PP CO 7415 හි දක්වා ඇති කොළොන්නාව වගුරු බිමේ තෝරා ගන්නා ලදී.

පරිධියේ සම්පූර්ණ දිග මීටර් 4000 කි.





2020 වර්ෂයේ ප්‍රගතිය

වර්ෂය අවසානයේදී පහත සඳහන් අයිතම අවසන් කරන ලදී.

	කාර්යයයේ විෂය පථය	2021 දෙසැම්බර් දක්වා ප්‍රගතිය	සිදු කරන ලද කාර්යයන් (රු.)
1	ජල විද්‍යාත්මක අධ්‍යයනය, පරිධියේ කාණු සහ අනෙකුත් ව්‍යුහයන් සැලසුම් කිරීම සහ අදාළ ඇඳීම් සකස් කිරීම	90% නිම කර ඇත	17,484,680.52
2	ඇම්ෆිබියස් යන්ත්‍රයක් මඟින් භාවිතයෙන් වගුරු බිම හැරීම සහ හාරන ලද ද්‍රව්‍ය භාවිතා කර ඇවිදීමේ මංතීරුවක් සකස් කිරීම	මායිම් ගැටලු ඇති ස්ථාන කිහිපයක හැර නිම කර ඇත	
3	පිටතින් ගෙන ආ සුන්බුන් භාවිතයෙන් ඇවිදීමේ මංතීරුව සකස් කිරීම	කාර්යයන් සිදු කරමින් පවති (දිග මීටර් 1800ක් නිම කර ඇත)	
4	මායිම් සීමාව ඔස්සේ 450 x 450 mm ප්‍රමාණයේ පෙරැදි U කාණු තැබීම	මීටර් 600	
5	මීටර් 100 ක පරතරයකින් දියවල ඉදිකිරීම සහ ඇළට ජලය මුදා හැරීම සඳහා කුඹහ තැබීම.	5	
6	රජය විසින් අත්පත් කරගත් ඉඩම් සහ පෞද්ගලික ඉඩම් වෙන් කිරීම සඳහා දම්වැල් වැටක් සවි කිරීම		

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කළමනාකරණය කරනු ලබන කෙරවලපිටිය කසල කළමනාකරණ උද්‍යානය

අපද්‍රව්‍ය ජනනය වන පළාත් පාලන ආයතන (කොළඹ සහ උප නාගරික ප්‍රදේශය) සඳහා මධ්‍ය කාලීන විසඳුමක් ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කෙරවලපිටිය කසල කළමනාකරණ උද්‍යානයේ (KWP) යෝජිත ප්‍රදේශයේ කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානයක් 2017 ජුනි 1 වන දින සිට ආරම්භ කර ඇත. කොම්පෝස්ට් බලාගාරයේ ආරම්භක ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 100 කි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ මීතොටමුල්ල කුණු කන්ද කඩාවැටීමෙන් පසු විවෘත කසළ බැහැර කිරීමෙන් පරිසරයට සිදුවන හානිය අවම කිරීමයි. නීතිය බලාත්මක කිරීම සහ දැනුම්වත් කිරීම තුළින් ව්‍යාපෘතිය ආරම්භ කර මාස 9ක් ඇතුළත නාගරික ඝන අපද්‍රව්‍යවල (MSW) 100% ප්‍රභව වෙන් කිරීමක් ලබා ගැනීමට ව්‍යාපෘතිය සමත් වී ඇත. මෙම ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී KWP වෙත අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 750ක් ලැබී ඇති අතර දිරායන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 550ක් කොම්පෝස්ට් කර දිරාපත් නොවන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 200ක් ගබඩා කර ඇත. ලැබෙන මුළු කසල ප්‍රමාණය සකස් කිරීමට පවතින පහසුකම් ප්‍රමාණවත් නොවිණි. එබැවින් KWP හි නව පෙරන යන්ත්‍රයක් හඳුන්වාදීමෙන් කොම්පෝස්ට් නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට පියවර ගන්නා ලදී. හිතකර කාලගුණික තත්ත්වයන් යටතේ වර්තමාන දෛනික කොම්පෝස්ට් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 30 ක්

පමණ වන අතර සම්පූර්ණ කොම්පෝස්ට් ප්‍රමාණය සීමාසහිත කළමිබු කොමර්ෂල් ෆර්ටිලයිසර්ස් වෙත ලබා දේ.

කෙරවලපිටියේ කසල මහින් බලශක්ති ජනන ව්‍යාපෘතිය ආරම්භ කිරීම හේතුවෙන් මේ වනවිට දිනකට පැමිණෙන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙ.ටොන් 150 කි.

KWP සම්බන්ධ වැදගත් තොරතුරු

- ලැබුණු මුළු දිරායන කසල ප්‍රමාණය - 52,078.92MT
- ලැබුණු මුළු දිරායන නොයන කසල ප්‍රමාණය - 6047.49MT
- මුළු කොම්පෝස්ට් අළෙවිය - 1,452.94MT
- කසල භාර ගැනීමෙන් ලද මුළු ආදායම - රු.. 105,894,800.00
- කොම්පෝස්ට් විකිණීමෙන් ලද මුළු ආදායම - රු. 19,636,670.00

KWP කොම්පෝස්ට් පහසුකම කිරුම් පාලම්, 80 x 45 m² කොන්ක්‍රීට් තට්ටුව, වින්ඩ්‍රෝ ටර්නර්, කොම්පෝස්ට් පෙරන යන්ත්‍ර 3 කින්, ලෝන්ග් ආම් එක්ස්කැවේටර් යන්ත්‍ර 02 කින්, ෂෝර්ට් ආම් එක්ස්කැවේටර් යන්ත්‍ර 02 කින්, රෝද 06 ට්‍රිපර් රථ 02කින්, රෝද හතරේ ට්‍රැක්ටරයකින්, බැකෝ ලෝඩරය සහ ස්කිඩ් ස්ටියර් යන්ත්‍රයකින් සමන්විත වේ. වින්ඩෝ ටර්නර් යන්ත්‍රය මඟින් වාතනය කිරීමෙන් දිරාපත් වීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම හරහා කොම්පෝස්ට්වල ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ.

කොම්පෝස්ට්වල ගුණාත්මක බව සහතික කිරීම සඳහා ප්‍රතීතනය ලත් රසායනාගාරවලින් වරින් වර කොම්පෝස්ට් තත්ත්ව පරීක්ෂාව සිදු කරනු ලැබේ. ***"මිණිජය"*** කොම්පෝස්ට් කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය බව පරීක්ෂණ ප්‍රතිඵලවලින් තහවුරු විය. තවද, බැර ලෝහ අන්තර්ගතය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කර ඇති සම්මත උපරිම අවසර ලත් මට්ටමට වඩා බෙහෙවින් අඩු බව පරීක්ෂණ ප්‍රතිඵලයෙන් තහවුරු වී ඇත.













විශේෂ ව්‍යාපෘති අංශය

විශේෂ ව්‍යාපෘති අංශය මඟින් වැසි ජල අපවහන සැලසුම් ක්‍රියාත්මක කිරීම, ජලාපවහන කළමනාකරණ සැලසුම් සකස් කිරීම, පිරිවැය ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ ගංවතුර සහ ජලාපවහන කළමනාකරණ අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කළමනාකරණය/අධීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති භාර ගනී. 2021 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වර්ග කළ හැක;

- විදේශ ආධාර ලැබූ ව්‍යාපෘති

    1. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකු ආධාර)

- භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

    2. මාදිවෙල දකුණ හැරවුම් ව්‍යාපෘතිය
    3. මොරටුව, රත්මලාන යෝජිත නාගරික ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
    4. කළු පාලම ගේට්ටු සවිකළ පොම්ප ස්ථාපිත කිරීම

- සේවාදායක ව්‍යාපෘති

    5. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා වැව් සහ ඒ අවට යෝජිත අලංකරණ සහ සංවර්ධන කටයුතු
    6. මොනරාගල, දඹගල්ල, මඩුල්ල, නෙළුම්වැව නගර සංවර්ධන හා අලංකරණ කාර්යයන්

1. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP)

කොළඹ නගරය තුළ සහ අවට ගංවතුර ඇතිවීම වර්ෂ ගණනාවක සිට සිදු වෙමින් පවතින අතර එමඟින් මහජනතාවගෙන් විශාල කොටසක් සඳහා සැළකිය යුතු ආර්ථික පසුබෑමක් සහ සමාජ දුෂ්කරතා ඇති කරයි.

කොළඹ ජල ද්‍රෝණියෙහි ගංවතුර පාලනය, යටිතලවියුහ සහ අපවහන කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම මෙන්ම කොළඹ පුරවර ප්‍රදේශයේ යටිතලවියුහ නඩත්තු කිරීම සඳහා සහ සේවාවන් ලබාදීම සඳහා මධ්‍යම රජයේ සහ පළාත් පාලන ආයතනවල හැකියාවන් ඉහළ නැංවීම MCUDP මඟින් අරමුණු කර ඇත.

MCUDP හි ප්‍රධාන සංඝටක දෙකක් ඇත;

1 වැනි සංඝටකය: ගංවතුර සහ අපවහන කළමනාකරණය

2 වැනි සංඝටකය: තිරසර පුරවර සහ ප්‍රාදේශීය යටිතල පහසුකම් සහ සේවාවන් සැපයීම සඳහා ආයතන ශක්තිමත් කිරීම සහ ක්‍රියාවට නැංවීමේ සහාය

ගංවතුර සහ අපවහන කළමනාකරණය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) යටතේ ක්‍රියාවට නංවන ලද ප්‍රධාන සංඝටකය වේ. කොළඹ පුරවර කලාපයේ අපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා තීරණාත්මක යැයි හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ගංවතුර සහ අපවහන කළමනාකරණ යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මෙමඟින් සහාය ලබා දෙනු ඇත. පවතින අපවහන පද්ධතියේ පිටවාන ධාරිතාවය වැඩි දියුණු කිරීම, නව හැරවුම් ඇළ මාර්ග සහ වැසි ජල පොම්පාගාර හඳුන්වාදීම සඳහා මෙමඟින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය කළමනාකරණය කරනු ලබන අතර ගංවතුර හා ජලාපවහන කළමනාකරණ සංරචකයේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය SLLDC වේ.

SLLDC විසින් MCUDP යටතේ සිදු කරන ලද උප ව්‍යාපෘතිවල ලැයිස්තුවක් පහත දක්වා ඇත.

අංකය	උප ව්‍යාපෘතිය
2021 වර්ෂයට පෙර නිම කරන ලද උප ව්‍යාපෘති	
1	දෙහිවල ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්
2	අලුත් මාවත බෝක්කුව, සතරැස් කාණුව, මෝදර උමං මනුබිල ඉදිකිරීම, මෝදර මුහුදු පිටවාන අසල ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම් සහ ප්‍රධාන කාණුවේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්
3	ශාන්ත සෙබස්තියන් දකුණු ඇළෙහි ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් ඉදිකිරීම
	තලංගම වැව හැරීම
5	ගාලු පාර පාලම අසලදී වැල්ලවත්ත ඇළ වෙත ජලය ගලා යෑම වැඩිදියුණු කිරීම
6	මාදිවෙල නැඟෙනහිර හැරවුම් යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම : අදියර – I
7	මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම : අදියර - II
8	ශාන්ත සෙබස්තියන් උතුරු ඇළෙහි ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් ඉදිකිරීම
9	කොළොන්නාව ඇළ මාර්ගය හැරවීමේ යෝජනා ක්‍රමය : අදියර II
10	කොළොන්නාව ඇළ මාර්ගය හැරවීමේ යෝජනා ක්‍රමය : අදියර III
11	ජලයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා දෝර ගේට්ටු සැලසුම් කිරීම සහ ස්ථාපනය කිරීම
12	කොළොන්නාව ඇළ මාර්ගය හැරවීමේ යෝජනා ක්‍රමය : අදියර I
2021 වර්ෂ තුළ නිම කරන ලද උප ව්‍යාපෘති	
13	මාදිවෙල නැඟෙනහිර හැරවුම් යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම : අදියර - III
14	කොළොන්නාව ඇළ මාර්ගය හැරවීමේ යෝජනා ක්‍රමය : අදියර IV
15	ශාන්ත සෙබස්තියන් උතුරු දියගුළු ගේට්ටුව සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම
16	ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය ඉදිකිරීම
17	අඹතලේ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම
සිදු කරමින් පවතින උප ව්‍යාපෘති	
18	නත්‍ය කාලීන ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ (RTC) පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම
19	ටොරින්ටන් උමග සහ නව මෝදර උමග සැලසුම් කිරීම සහ ඉදිකිරීම

2021 වර්ෂය තුළ නිම කරන ලද උප ව්‍යාපෘති

- **මාදිවෙල නැඟෙනහිර හැරවුම් යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම : අදියර - III**

කොන්ත්‍රාත්කරු	- E & C කොමුනි JV
කොන්ත්‍රාත් වටිනාකම	- රු. 344,577,482.70
ආරම්භ කළ දිනය	- 11.01.2017
නිම කළ දිනය	- 2021 සැප්තැම්බර් 30

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත කාර්යයන් ඇතුලත් වේ;

- පවතින ප්‍රධාන ගංවතුර ගේට්ටු ව්‍යුහයේ පත් ගේට්ටු ප්‍රතිසංස්කරණය කිරීම
- නව ගංවතුර ගේට්ටු ව්‍යුහය ඉදිකිරීම සහ ද්විතියික ඇළ මාර්ගය සඳහා නව ගේට්ටු ස්ථාපිත කිරීම
- නඩත්තු හා මෙහෙයුම් මාර්ග සමඟ පැති කාණු සමඟ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- NWS&DB ට අයත් ජල නල සකස් කිරීම සහ නව නල මාර්ග උපස්ථම්භක ව්‍යුහයක් ඉදිකිරීම
- ජලය බැස යෑම සඳහා ප්‍රධාන බාධකයක් ලෙස ක්‍රියා කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගේට්ටු ව්‍යුහය ඉවත් කිරීම
- ලෝලෙවල් පාර පාලම සඳහා අමතර ප්‍රවේශයක් විවෘත කිරීම







- **කොලොන්නාව ඇළ මාර්ගය හැරවුම් යෝජනා ක්‍රමය: අදියර IV**

කොන්ත්‍රාත්කරු	-	E&C - RR JV
කොන්ත්‍රාත් වටිනාකම	-	රු. 1,431,682,105.43
ආරම්භ කළ දිනය	-	01.02.2019
නිම කළ දිනය	-	2021 දෙසැම්බර් 20

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත කාර්යයන් ඇතුලත් වේ;

- කළු පාලම අසල කිත්තම්පහුව ඇළ මාර්ගය හරහා ගේට්ටු ව්‍යුහ ඉදිකිරීම සහ එක් ගේට්ටුවක් මීටර් 6 පළල x මීටර් 4.5 උස සිරස් ගේට්ටු 3ක් ස්ථාපිත කිරීම
- කළු පාලම අසල සේදවත්ත-අඹතලේ මාර්ගය ඔස්සේ පවතින පාලම ඉවත් කර ඒ වෙනුවට මීටර් 18ක් පළල පාලමක් ස්ථාපිත කිරීම
- CPC ට අයත් ගේට්ටු ව්‍යුහය කඩා ඉවත් කර සපත්තු පලමක් ඉදිකිරීම
- CPC පරිශ්‍රය අසල ඇළ මාර්ගයේ පත්ල පෝරු දැමීම
- නඩත්තු හා මෙහෙයුම් මාර්ග සහ පැති කාණු සමඟින් ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම.









- **ශාන්ත සෙබස්තියන් උතුරු දියඟුළු ගේට්ටුව සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම**

කොන්ත්‍රාත්කරු	-	චයිනා ජියෝ- ඉන්ජිනියරින් කෝපරේෂන්
කොන්ත්‍රාත් වටිනාකම	-	ඇ.ඩො. 9,766,653.08 + ශ්‍රීලරු 473,212,403.68
ආරම්භ කළ දිනය	-	01.06.2017
නිම කළ දිනය	-	ඉදිකිරීම් කාර්යයන් - 2021 මැයි 31
ක්‍රියාත්මක කිරීම	-	2021 නොවැම්බර් 30
පොම්ප කිරීමේ ධාරිතාවය	-	30 m3/s, (ධාරිතාවය 6m3/s වන පොම්ප 5කින් සමන්විත වේ)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත කාර්යයන් ඇතුලත් වේ;

- ගේට්ටු ව්‍යුහ ඉදිකිරීම සහ නව සිරස් ගේට්ටු සවි කිරීම
- ජලය බැස යෑම සඳහා ප්‍රධාන අවහිරතාවයක් වී ඇති පවතින ගේට්ටු ව්‍යුහය ඉවත් කිරීම
- නව පොම්පාගාරයක් ඉදිකිරීම සහ පෙරහන් සහ වෙනත් අවශ්‍ය උපකරණ සමඟ පොම්ප සවි කිරීම
- ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම







- **අඹතලේ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම**

කොන්ත්‍රාත්කරු	- සැල්කන් ඉංජිනියරින් බර්හැඩ්
කොන්ත්‍රාත් වටිනාකම	- අ.ඩො.මි. 5.85 0+ ශ්‍රීලරු.මි. 1,181.53
ආරම්භ කළ දිනය	- 03.09.2018
නිම කිරීමට අපේක්ෂිත දිනය	- 2021 දෙසැම්බර් 31
පොම්ප කිරීමේ ධාරිතාවය	- 20 m3/s, ධාරිතාවය 4m3/s වන පොම්ප 5කින් සමන්විත වේ

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත කාර්යයන් ඇතුලත් වේ;

- පවතින ගේට්ටු ව්‍යුහය සඳහා නව සිරස් ගේට්ටු සවි කිරීම
- නව පොම්පාගාරයන් ඉදිකිරීම සහ පෙරහන් සහ වෙනත් විද්‍යුත්-යාන්ත්‍රික උපකරණ සහිත නව පොම්ප සවි කිරීම
- ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්







- **ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය ඉදිකිරීම**

කොන්ත්‍රාත්කරු	- චයිනා ජියෝ- ඉන්ජිනියරින් කෝපරේෂන්
කොන්ත්‍රාත් වටිනාකම	- ඇ.ඩො. 5,934,884.90 + ශ්‍රීලරු 165,833,566.49
ආරම්භ කළ දිනය	- 01.02.2019
නිම කළ දිනය	- 2021 නොවැම්බර් 20
පොම්ප කිරීමේ ධාරිතාවය	- 10 m3/s, ධාරිතාවය 5m3/s වන පොම්ප 2කින් සමන්විත වේ

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත කාර්යයන් ඇතුලත් වේ;

- පවතින ගේට්ටු ප්‍රතිසංස්කරණය කිරීම
- නව පොම්පාගාරයක් ඉදිකිරීම සහ පෙරහන් සහ වෙනත් අවශ්‍ය උපකරණ සමඟ පොම්ප සවි කිරීම
- ඉවුරු ආරක්ෂණ කාර්යයන්
- ඇළ මාර්ගය හැරීම









2021 වර්ෂය තුළ සිදු කරමින් පවතින උප ව්‍යාපෘති

ටොරින්ටන් උමඟ සහ නව මෝදර උමඟ සැලසුම් කිරීම සහ ඉදිකිරීම

කොන්ත්‍රාත්කරු	-	වයිනා පෙට්‍රෝලියම් පයිප්ලයින් ඉන්ජිනියරින් කම්පනි ලිමිටඩ්
කොන්ත්‍රාත් වටිනාකම	-	ඇ.ඩො. 32,098,189 + ශ්‍රීලරු 246,060,603.00
ආරම්භ කළ දිනය	-	30.05.2018
නිම කිරීමට අපේක්ෂිත දිනය	-	2022 මාර්තු 31
නව මෝදර උමඟ	-	පරිධිය 3 m, දිග 700 m සහ ධාරිතාවය 15 m3/s.
ටොරින්ටන් උමඟ	-	ප්‍රධාන උමඟෙහි පරිධිය 3 m කි (දිග 1100 m), ප්‍රධාන සහ ද්විතීයික උමං මාර්ගවලින් (පරිධිය 1.2 m – 2.0 m; දිග 2500 m) සමන්විත පද්ධතියක් පවතී. එහි ධාරිතාවය 32 m3/s.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට පහත කාර්යයන් ඇතුලත් වේ;

- ඇතුල්වන කාණුව ඉදිකිරීම
- ලැබීමේ පතුවළ ඉදිකිරීම
- පිටවන කාණුව ඉදිකිරීම
- උමං හෑරීම
- මනුවල ඉදිකිරීම









නව මෝදර උමඟ





ටොරින්ටන් උමග

- **කතෘ කාල පාලන පද්ධතිය (RTC)**

ඉංජිනේරු ඇස්තමේන්තුව	-	රු. මිලියන 414
ආරම්භ කළ දිනය	-	2017 ජූලි
නිම කිරීමට අපේක්ෂිත දිනය	-	2022 අප්‍රේල් 30

අරමුණු

1. ඒකාබද්ධ ගංවතුර පාලන හා ජල කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම
2. කොළඹ පුරවර ප්‍රදේශයට පූර්ව අනතුරු ඇඟවීමේ සභාය ලබා දීම
3. ගබඩා කළ හැකි ධාරිතාවයද සැළකිල්ලට ගනිමින් පොම්ප සහ ගබඩා පහසුකම් සඳහා ප්‍රශස්ත මෙහෙයුම් නීති රීති සකස් කිරීම සහ ප්‍රසන්න නාගරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජලය භාවිතා කිරීම
4. නාගරික සංවර්ධනයෙන් මෙන්ම දේශගුණික විපර්යාසයන්ගෙන් මහානගරය වෙත වර්තමාන හා ඇති විය හැකි අනාගත ජලය හා සම්බන්ධ අවදානම් තක්සේරු කිරීම



භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

2. මාදිවෙල දකුණ හැරවුම් ව්‍යාපෘතිය

පොදු

කොළඹ පුරවර ද්‍රෝණියේ ඉහළ කොටසේ සිට වේරළු ගංගා ද්‍රෝණියට ගංවතුර ජලය හරවා යවන හැරවුම් ද්‍රෝණියක් ලෙස මාදිවල දකුණ හැරවීම සැලකේ. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අධ්‍යයනයට අනුව, මාදිවෙල දකුණ හැරවීම කොළඹ පුරවර ද්‍රෝණියේ ගංවතුර අවම කිරීම සඳහා අංක 01 දරන මැදිහත්වීම වේ. මතුපිට ජලය පාර්ලිමේන්තු වැවට ගලා යාම වැළැක්වීම සඳහා වසර 20, 40 සහ 50ක වර්ෂාව සඳහා පහත විකල්ප අධ්‍යයනයන් සිදු කර ඇත

අ) ජල පෝෂක ප්‍රදේශය තුළ පිහිටි ජල රැඳවුම් ගබඩා ප්‍රදේශය තුළ ජලය ගබඩා කිරීම.
ආ) ගුරුත්ව ඇළ මාර්ග නාලිකාවක් මඟින් වේරළු ගංගා ද්‍රෝණිය වෙත හැරවීම.
ඇ) පොම්ප කිරීමෙන් වේරළු ගංගා ද්‍රෝණිය වෙත හැරවීම.

ඉහත විකල්පයන් සහ 2020 වර්ෂයේදී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයනයන් සලකා බැලීමේදී, අවම පාරිසරික, සමාජීය සහ ආර්ථික බාධාවන් යටතේ ක්‍රියාත්මක කළ හැකි වඩාත්ම සාධ්‍ය විකල්පය පොම්ප කිරීමෙන් වේරළු ගංගා ද්‍රෝණියට හැරවීම බව අනාවරණය විය. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව ඉදිරිපත් කිරීම ඇතුළුව සංකල්පීය සැලසුම් සහ ඇඳීම් සැකසීම 2021 වර්ෂයේදී නිම කර ඇත.


අරමුණ

කොළඹ පුරවර ද්‍රෝණියේ ගංවතුර භාරය අවම කිරීම මෙම යෝජනාවේ අරමුණ වේ

කාර්යයේ විෂය පථය

මේ අනුව යෝජිත මාදිවල දකුණ හැරවීමේ විෂය පථය පහත පරිදි සාරාංශ කළ හැක.

I. කිඹුලාවල වැවෙහි වැඩිදියුණු කිරීමේ කාර්යයන්.
II. කිඹුලාවල වැවෙහි සිට හයිලෙවල් මාර්ගය දක්වා නව භූගත සතරැස් හැරවුම් කාණුව (පළල මීටර් 8, දිග කි.මී. 2.5).
III. යෝජිත පොම්පාගාරය (20m3/s).
IV. හයිලෙවල් මාර්ගය හරහා භූගත සතරැස් කාණු බෝක්කුව (පළල මීටර් 8, දිග මීටර් 300)
V. හයිලෙවල් මාර්ගයේ සිට වේරළු ගඟ දක්වා පවතින ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම (පළල මීටර් 8, දිග මීටර් 3700).
VI. මාර්ග සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව, ඉහත ව්‍යාපෘතියේ හැරවුම් මාර්ගය ඔස්සේ (සතරැස් කාණුව මත සහ විවෘත ඇළ මාර්ගයේ මායිම ඔස්සේ) නව මාර්ගයක් ඉදිකිරීමට යෝජනා කර ඇත.



කිඹුලාවල වැවෙහි සිට හයිලෙවල් මාර්ගය දක්වා යෝජිත සතරැස් හැරවුම් ඇළ මාර්ගය



හයිලෙවල් මාර්ගයේ සිට වේරස් ගඟ දක්වා යෝජිත හැරවුම් ඇළ මාර්ගය

3. මොරටුව, රත්මලාන යෝජිත නාගරික ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය


ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර වන කොළඹට දකුණින් පිහිටා ඇති මොරටුව-රත්මලාන උප ද්‍රෝණිය සාපේක්ෂව පහත් බිම් ප්‍රදේශයකි. ප්‍රධාන ජල ධාරාව වන වේරස් ගඟට වැසි ජලය බැස යාමට නිසි ජලාපවහන පද්ධතියක් නොමැතිකම හේතුවෙන් මෙම උප ද්‍රෝණිය නිතර ප්‍රදේශීය සුළු ගංවතුරට ලක් වේ.

ප්‍රදේශයේ මහජනයාට සිදුවන අපහසුතාවයන් අවම කිරීම සඳහා මොරටුව-රත්මලාන උප-පෝෂක ප්‍රදේශය සම්බන්ධයෙන් ජලාපවහන අධ්‍යයනයක් සහ සවිස්තරාත්මක සැලසුමක් සකස් කරමින් සිටී.

කාර්යයේ විෂය පථය


I. පවතින ඇළ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම
II. පවතින මාර්ග පැති කාණු වැඩිදියුණු කිරීම
III. බෝක්කු නැවත ඉදිකිරීම
IV. පාලම නැවත ඉදිකිරීම
V. නව බෝක්කුවක් ඉදිකිරීම
VI පොම්පාගාරයක් හඳුන්වාදීම සහ ඉදිකිරීම

2021 වර්ෂයේ ප්‍රතිපාදන අනුව, A පැකේජයේ සැලසුම්, ඇඳීම් සහ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම සහ B & C පැකේජයේ මැනුම් කටයුතු අවසන් කර ඇත.



4. කළු පාලම ගේට්ටු සවිකළ පොම්ප ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර වන කොළඹට මදක් ඔබ්බෙන් පිහිටා ඇති කොලොන්නාව, සමාජීය හා ආර්ථික වශයෙන් අගනුවරට සැලකිය යුතු ලෙස සම්බන්ධ වූ ප්‍රදේශයකි. මුළු ප්‍රදේශයටම පාහේ වර්ෂාපතනයෙන් ඇති වන වැසි ජල ප්‍රවාහය දළ වශයෙන් වර්ග කිලෝමීටර 14 ක වපසරියකින් යුත් කොලොන්නාව ජල පෝෂක ප්‍රදේශය සාදමින් කැලණි ගඟට ගලා බසී. කිත්තම්පහුව ඇළ මෙම ජල පෝෂක ප්‍රදේශයේ ඇති ප්‍රමුඛතම ජල මාර්ගය වන අතර, කැලණි ගඟ හා එක්වන දෙමෝයෙහි ("කළු පාලම" දුම්රිය පාලම අසල) පත් ගේට්ටු කට්ටලයක් ඇති අතර එය කැලණි ගඟේ (ඉහළ කැලණි තත්ත්වය) ඉහළ ජල මට්ටම් පවතින කාලවලදී ස්වයංක්‍රියව වැසී යෑම මඟින් ගඟේ සිට ජලය ආපසු ඇළට ඇතුළු වීම වළක්වයි.



කොලොන්නාව ජල පෝෂකය සහ කිත්තම්පහුව ඇළ මාර්ගය

පහත් බිම් ප්‍රදේශයක් වීම හේතුවෙන් එය කැලණි ගඟේ ගංවතුර තැනිතලාවේ කොටසක් ලෙස බොහෝ කලක සිට සලකනු ලැබූ අතර විසිවන සියවසේ මුල් භාගයේදී කොළඹ ගංවතුර ආරක්ෂණ බැම්ම සැලසුම් කිරීමේදී "අනාරක්ෂිත ප්‍රදේශයක්" ලෙස ඉතිරිව තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රදේශයට වර්ෂාපතනයක් නොලැබුණද ගංගා ද්‍රෝණියේ ඉහළ ප්‍රදේශවල වර්ෂාපතනය හේතුවෙන් ඉහළ කැලණි තත්ත්වයේ දී ප්‍රදේශය නිතර ජලයෙන් යට වේ. කෙසේවෙතත්, ශීඝ්‍ර නාගරීකරණය සහ ජනගහන වර්ධනය හේතුවෙන් ප්‍රදේශය මේ වනවිට විශාල වශයෙන් ජනාකීර්ණ වී ඇති අතර, ඒ හේතුවෙන් මෙම නිරන්තර ගංවතුර ප්‍රදේශයේ ජන ජීවිතයට සහ ආර්ථික කටයුතුවලට සැලකිය යුතු බාධාවක් වී තිබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන කාලගුණයට ඔරොත්තු දීම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (CRIP) යටතේ, ගඟෙහි විශාල ගංවතුර තත්ත්වවලදී ආරක්ෂාව සැලසීම සඳහා ගං ඉවුරෙහි උස ඉහළ නංවනු ඇත. එවැනි තත්ත්වයන් යටතේ කොලොන්නාව ජල පෝෂක ප්‍රදේශයට අධික වර්ෂාපතනයක් ඇති වනවිට එම ජල පෝෂකයේ ජලය ගඟට බැස යාමට පොම්ප කිරීම අවශ්‍ය වේ. මේ සඳහා කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ (MCUDP) කොටසක් ලෙස දැනට ඉදිවෙමින් පවතින සිරස් ගේට්ටු ව්‍යුහයේ ගේට්ටු සවිකර ඇති පොම්ප ස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. ජල විද්‍යාත්මක අධ්‍යයනයන් මත පදනම්ව, කළු පාලමේ අසලට අවශ්‍ය උපරිම පොම්ප ධාරිතාව ලෙස 20m3/s ලෙස තීරණය කර ඇත.

ප්‍රතිපාදන අනුව සංකල්පමය සැලසුම් සකස් කිරීම 2021 වර්ෂයේදී නිම කරන ලදී.

සේවාදායක ව්‍යාපෘති

5. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා වැව් සහ ඒ අවට යෝජිත අලංකරණ සහ සංවර්ධන කටයුතු

ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ සහ වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මහතාගේ ඉල්ලීම පරිදි කුරුණෑගල

සිට දඹුල්ල හරහා අනුරාධපුර ප්‍රධාන මාර්ගය ඔස්සේ වැව් කිහිපයක් ඒකාබද්ධව සංවර්ධනය කිරීමට තෝරාගන්නා ලදී.

වර්තමානයේ එම වැව් මතුපිට ජල පැලෑටි හා පඳුරුවලින් වැසී ඇත. එබැවින් පස් තැන්පත් වීම සහ ආක්‍රමණශීලී ජලජ ශාක වර්ධනය වීම හේතුවෙන් වැව්වල ගබඩා ධාරිතාව අඩු විය.

මෙම ව්‍යාපෘතියේ දී තෝරාගත් වැව්වලට අදාළ ව්‍යුහයන් මතුපිට පිරිසිදු කිරීම, හැරීම සහ නිවැරදි කිරීමේ කටයුතු කිහිපයක් සම්පූර්ණ කිරීමට අප සැලසුම් කර ඇති අතර එමඟින් වැව්වල ධාරිතාව ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

1. **<u>කලගස් වැව, ඉබ්බාගමුව (කුරුණෑගල දිස්ත්‍රික්කය)</u>**



පෙර



පසු

2. **<u>කලම්මුල්ල වැව, මැල්සිරිපුර (කුරුණෑගල දිස්ත්‍රික්කය)</u>**



පෙර



පසු

3. **<u>කලහකැලේ වැව, ගලේවෙල (මාතලේ දිස්ත්‍රික්කය)</u>**



පෙර



පසු

4. **<u>පුවක්පිටිය වැව, ගලේවෙල (මාතලේ දිස්ත්‍රික්කය)</u>**



පෙර



පසු

5. **සළඅපුල්ලන වැව, දඹුල්ල (මාතලේ දිස්ත්‍රික්කය)**



පෙර



පසු

6. **මාලව වැව, කැකිරාව (අනුරාධපුර දිස්ත්‍රික්කය)**



පෙර



පසු

7. **උලන්කුලම වැව, මරදන්කඩවල (අනුරාධපුර දිස්ත්‍රික්කය)**





8. **තිරප්පනේ වැව, තිරප්පනේ (අනුරාධපුර දිස්ත්‍රික්කය)**





9. <u>ගල්කුලම වැව, ගල්කුලම (අනුරාධපුර දිස්ත්‍රික්කය)</u>





6. **මොනරාගල, දඹගල්ල, මඩුල්ල, නෙළුම්වැව නගර සංවර්ධන හා අලංකරණ කාර්යයන්**

හෙක්ටයාර 8.9 කින් සමන්විත නෙළුන් වැව, මොනරාගල දිස්ත්‍රික්කයේ, දඹගල්ල, මඩුල්ල හන්දියේ දඹගල්ල-මාරියඅරාව මාර්ගයට යාබදව පිහිටා ඇත. මෙම වැව ප්‍රදේශයේ වාරි ඉල්ලුම සපුරාලන වැදගත් හා ප්‍රධාන ජලාශයකි. අසල පිහිටි දඹගල්ල-මාරියඅරාව මාර්ගයේ ගමන් ගන්නා අයගේ නෙත් සිත් ඇදගන්නා ස්ථානයකි. මෙම වැව වියළි කලාපයේ පිහිටා ඇති බැවින් භූගත ජලය නැවත ආරෝපණය කිරීමටත් වියළි කාලවලදී ජලය සැපයීමටත් එය ඉවහල් වේ. වර්තමානයේදී වැව් ප්‍රදේශය ජලජ ශාක සහ පඳුරුවලින් වැසී ඇත. එබැවින් පස් තැන්පත් වීම සහ ආක්‍රමණශීලී ජලජ ශාක වර්ධනය වීම හේතුවෙන් වැවේ ගබඩා ධාරිතාවය අඩු වී ඇත.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමේ සංකල්පය යටතේ ගරු. කුමාරසිරි රත්නායක අමාත්‍යාවරයාගේ ප්‍රධානත්වයෙන් මෙම නෙළුනම් වැව මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට විනෝදාත්මක පහසුකම් සහිතව ප්‍රතිසංස්කරණය කළ යුත් වැවක් ලෙස හඳුනාගෙන ඇත.

කාර්යයේ විෂය පථය

i. සවිස්තරාත්මක සැලසුම් වාර්තාව
ii වැව් ප්‍රදේශය කැණීම
iii. වැව වටා ඇවිදීමේ මංතීරුවක් ඉදිකිරීම
iv. වැව් අවට භූ දර්ශන කටයුතු සහ අලංකරණ කටයුතු.
v. සනීපාරක්ෂක පහසුකම් සහ ආසන පහසුකම් සැපයීම
vi. එළිමහන් ව්‍යායාම් ශාලාව
vii. ළමා ක්‍රීඩා ප්‍රදේශය
viii. LED ලාම්පු සහ ජාල මනුකරණය ඇතුළුව තනි සහ ද්විත්ව පැති සහිත පහන් කණු.





ඉදිකිරීම් අංශය

2021 වර්ෂයේ ඉදිකිරීම් අංශය යටතේ පැවති ව්‍යාපෘති

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණය, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති,

1. කිරිමණ්ඩල මාවතේ තත්‍ය කාලීන ගංවතුර පාලන හා ජල කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම
2. රාගම- පේරලන්ද තෙත්බිම් ප්‍රදේශ විනෝදාත්මක සංවර්ධන ව්‍යාපෘතිය- අදියර I
3. රාගම- පේරලන්ද තෙත්බිම් ප්‍රදේශ විනෝදාත්මක සංවර්ධන ව්‍යාපෘතිය- අදියර II
4. කොට්ටාගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය - අදියර I
5. කොට්ටාගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II
6. මාකේට්ට, නෙළුම්විල, යෝජිත ඇවිදීමේ මංතීරුව - අදියර I
7. මාකේට්ට, නෙළුම්විල, යෝජිත ඇවිදීමේ මංතීරුව - අදියර II
8. නුවරඑළිය ග්‍රෙගරි වැවේ ඇවිදීමේ මංතීරු සංවර්ධනය
9. අහුන්ගල්ල (බලපිටිය), කිරිල්ල ඇල හි ඇවිදීමේ මංතීරුව සඳහා යෝජිත සංවර්ධනය
10. අම්බලන්ගොඩ, රන්දොඹේ ශ්‍රී සංඝරාජ විහාරස්ථානය සඳහා පොදු ස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ වන ව්‍යාපෘති

11. පෑලියගොඩ යෝජිත නිවාස ඒකක 600 සඳහා ගේබියන් බැමි ඉදිකිරීම සහ ඉඩම් පිරවීම.

සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම යටතේ වන ව්‍යාපෘති

12. කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළෙහි මගී පර්යන්තය සඳහා වෙන් කළ ප්‍රවේශ මාර්ගයෙහි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

භාණ්ඩාගාරය යටතේ වන ව්‍යාපෘති

13. කඩවත "සුවත උයන" නඩත්තු කාර්යයන්

14. රත්ගම - නගර සංවර්ධන හා ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

15. වේරළු ගඟ වැසි ජල සහ ජලාපවහන පද්ධතිය යටතේ ඉදිකිරීම් කාර්යයන්

ස්වයං අරමුදල් ව්‍යාපෘති

16. කිරිමණ්ඩල මාවතේ මධ්‍යම ගබඩාවේ - බිම් මහළ සහ පළමු මහළ අතර මහළ, වෙන් කිරීමේ කටයුතු සහ රාක්ක පද්ධතිය ඉදිකිරීම

17. අනුරාධපුර සංචාරක බංගලාව සඳහා යෝජිත බිත්ති රාක්ක, ජරාහු කාමර වෙනස් කිරීම, ගෘහභාණ්ඩ සැකසීම

<u>නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණය, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය</u>

1. කිරිමණ්ඩල මාවත තත්‍ය කාලීන ගංවතුර පාලන හා ජල කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් පිරිනමන ලදී. ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තු වටිනාකම වැට බද්ද හැර රු. මිලියන 752 කි.

මෙම ව්‍යාපෘතිය පස් මහල් ගොඩනැඟිල්ලක් (වර්ග මීටර් 3250) ඉදිකිරීම හා සම්බන්ධ සියලු සිවිල්, යාන්ත්‍රික, විදුලි කාර්යයන් සහ භූමි අලංකරණ කාර්යයන් ඇතුළු මගී සෝපාන අංක 02 කින් සමන්විත වේ.

මෙම ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 20 වන දින ආරම්භ කරන ලද අතර 2021 අගෝස්තු 21 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා ශ්‍රී ලංකාව තුළ පැවති කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල හේතුවෙන් වැඩ අදියර දෙකකින් තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් එය 2022මාර්තු මස නිම කිරීමට නියමිතය.
2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 175 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 503 කි.





2. රාගම-පේරලන්ද තෙත්බිම් ප්‍රදේශයේ විනෝදාත්මක ක්‍රියාකාරකම් සංවර්ධන ව්‍යාපෘතිය - අදියර I

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 25 කි. ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 09 වන දින ආරම්භ කරන ලද අතර පළමු අදියර 2021 අප්‍රේල් 08 වන විට නිම කර නිබුණි.

ව්‍යාපෘතිය රාගම-පේරලන්ද තෙත්බිම් උද්‍යානය ඉදිකිරීම සඳහා හැරීම් කාර්යයන්වලින් සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 9 ක් වන අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 21කි.





3. රාගම-පේරලන්ද තෙත්බිම් ප්‍රදේශයේ විනෝදාත්මක ක්‍රියාකාරකම් සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 196 කි. ව්‍යාපෘතිය 2021 අප්‍රේල් 19 වන දින ආරම්භ කරන ලද අතර 2021 මැයි 31 සිට 2021 ජුනි 21 දක්වා සහ 2021 අගෝස්තු 21 සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය සඳහා ඇඳිරි නීතිය/හුදකලා කිරීම හේතුවෙන් අදියර දෙකකින් වැඩ තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් එය 2022 පෙබරවාරි මස අවසන් වනවිට නිම කිරීමට නියමිතය.

ව්‍යාපෘතිය ගේබියන් කාර්යයන්, පිටවාන, සපත්තු පාලම්, පැති කාණු සහ මාර්ග හරස් ව්‍යුහයන්, වීදි ලාම්පු සහ භූමි අලංකරණ කටයුතු වලින් සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 143 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 143 කි.






4. කෝට්ටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය- අදියර I

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 13 කි. ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 19 වන දින ආරම්භ කරන ලද අතර 2021 අප්‍රේල් වනවිට නිම කර ඇත.

මෙම ව්‍යාපෘතිය කොටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය නිර්මාණය කිරීම සඳහා හැරීම් කාර්යයන්වලින් සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 11 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 12 කි.





5. කෝට්ටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය- අදියර II

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම රු.මි.42 කි. ව්‍යාපෘතිය 2021 අප්‍රේල් 19 වන දින ආරම්භ කරන ලද අතර 2021 මැයි 31 සිට 2021 ජුනි 21 දක්වා සහ 2021 අගෝස්තු 21 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය සඳහා ඇඳිරි නීතිය/හුදකලා කිරීම හේතුවෙන් අදියර දෙකකින් වැඩ තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් එය 2022 පෙබරවාරි මාසය වනවිට නිම කිරීමට නියමිතය.

පැති කාණු සහ මාර්ග හරස් ව්‍යුහ ඉදිකිරීම, පිටවාන සහ ඇවිදීමේ මංතීරුව ඉදිකිරීමෙන් ව්‍යාපෘතිය සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 23 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 23 කි.





6. මාකේවිට, නෙළුම්විල, යෝජිත ඇවිදීමේ මංතීරුව - අදියර I

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 30 කි. ව්‍යාපෘතිය 2021 අප්‍රේල් මස ආරම්භ කරන ලද අතර 2021 මැයි 31 සිට 2021 ජුනි 21 දක්වා සහ 2021 අගෝස්තු 21 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා කොවිඩ්-19 වසංගත තත්ත්වය සඳහා ඇදිරි නීතිය/හුදකලා කිරීම හේතුවෙන් අදියර දෙකකින් වැඩ තාවකාලිකව අත්හිටුවන ලදී. 2021 දෙසැම්බර් අවසානය වනවිට නිම කරන ලදී.

වැව වැඩිදියුණු කිරීම, කුඹහ බෝක්කු ඉදිකිරීම සහ ක්‍රීඩාංගණය වැඩිදියුණු කිරීමෙන් ව්‍යාපෘතිය සමන්විත වේ.



2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 24 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 24 කි.

7. මාකේවිට, නෙළුම්විල, යෝජිත ඇවිදීමේ මංතීරුව - අදියර II

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 26 කි. ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් මස ආරම්භ කරන ලද අතර 2022 වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය ව්‍යායාම මංතීරුව, කුඹහ බෝක්කු ඉදිකිරීම සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශයේ ඉඩම් වැඩිදියුණු කිරීම සහ සූර්ය වීදි ලාම්පුවලින් සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 7.5 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 7.5කි.







<u>නාගරික සංවර්ධන අධිකාරිය යටතේ වන ව්‍යාපෘති</u>

11. පැලියගොඩ යෝජිත නිවාස ඒකක 600 සඳහා ගේබියන් බැම් ඉදිකිරීම සහ ඉඩම් පිරවීම

ඉහත ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය වන රු. මිලියන 239 ට අක්කර 2ක ඉඩම් ගොඩකිරීම, ගේබියන් බැම් ඉදිකිරීම (මීටර් 600), ඇළ මාර්ගය වැඩිදියුණු කිරීමේ කාර්යයන් සහ බෝක්කු ඉදිකිරීම ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2019 සැප්තැම්බර් මස ආරම්භ කරන ලද අතර රට තුළ පැවති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එම කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මස අවසානයේදී නිම කරන ලදී.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 83 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 210 කි.





<u>සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම යටතේ වන ව්‍යාපෘති</u>

12. කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළෙහි මගී පර්යන්තය සඳහා වෙන් කළ ප්‍රවේශ මාර්ගයෙහි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ඉහත ව්‍යාපෘතිය සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් පිරිනමන ලදී. ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුව වන රු. මිලියන 278 ට ආශ්‍රිත අතරමැදි මනුවල සහිත පෙරැදි කුඹහ ජලාපවහන පද්ධතිය ඉදිකිරීම සහ පිරවුම් කාර්යයන් ඇතුළත් වේ.

ආරම්භ කළ දිනය 2020 ජුනි 01 වන දින වන අතර ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල හේතුවෙන් එම කාර්යයන් තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් ව්‍යාපෘතිය නිම කළ දිනය 2021 මාර්තු 27 විය.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 121 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 225 කි.




<u>භාණ්ඩාගාරය යටතේ වන ව්‍යාපෘති</u>

13. කඩවත "සුවත උයන" නඩත්තු කාර්යයන්

2021 වර්ෂය සඳහා ඉහත ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර මුළු ප්‍රතිපාදනය රු. මිලියන 12.50 ක් වූ අතර වසර පුරා නඩත්තු කාර්යයන් සිදු කරනු ලැබේ.
ව්‍යාපෘතිය ඇළ මාර්ගය මතුපිට පිරිසිදු කිරීම, ඇළ ඉවුරු එළි පෙහෙළි කිරීම, ඇළ මාර්ගය පරීක්ෂා කිරීම, තණකොළ කැපීම, අභ්‍යන්තර මාර්ග නඩත්තු කිරීම, පැටවීම, පස් තාවකාලිකව ප්‍රවාහනය සහ තුනි කිරීම සහ විදුලි බිල්පත් ගෙවීමෙන් සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 12.5 කි.





14. රත්ගම - නගර සංවර්ධන හා ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ඉහත ව්‍යාපෘතිය 2021භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් අංශය විසින් ආරම්භ කරන ලද අතර, සැලසුම් සකස් කිරීම විශේෂ ව්‍යාපෘති අංශය විසින් සිදු කරනු ලබයි.

ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුව රුපියල් මිලියන 858 කි. මෙම ව්‍යාපෘතිය 2021 නොවැම්බර් මස ආරම්භ කරන ලද අතර එය 2022 වසර පුරා ක්‍රියාත්මක කෙරේ.

කඩා ඉවත් කිරීම සහ ස්ථානය පිරිසිදු කිරීම (අක්කර 7.5), ගොඩකිරීමේ කටයුතු (අක්කර 14.8), ඇවිදීමේ මංතීරුව, කාණු, සතරැස් බෝක්කු ඉදිකිරීම සහ ඇළ මාර්ගය වැඩිදියුණු කිරීමේ කාර්යයන්වලින් ව්‍යාපෘතිය සමන්විත වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 20 කි.





15. වේරැස් ගඟ වැසි ජල සහ ජලාපවහන පද්ධතිය යටතේ ඉදිකිරීම් කාර්යයන්

වේරැස් ගඟ වැසි ජල හා ජලාපවහන පද්ධතිය යටතේ ඉදිකිරීම් කාර්යයන් 2020 ජනවාරි 10 වන දින ආරම්භ කර ඇති අතර පහත සඳහන් කාර්යයන් 2021 වසර පුරා සිදු කරන ලදී.

i. මහජන පරිහරණයට ඉඩ සැලසෙන පරිදි සූරියමල් මාවත වැවේ වැඩ නිම කිරීම.

ii. මහජන පරිහරණයට ඉඩ සැලසෙන පරිදි වෙල පාර වැවේ වැඩ නිම කිරීම.

iii. සූරියමල් මාවතේ කඩ සාප්පු සහ නානකාමර ඉදිකිරීම

iv. එදිරිසිංහ පාරේ, අංක 03 ස්ථානයේ බෝක්කු ඉදිකිරීම.

v. ස්ථානය 01 හි කුඹඟ බෝක්කුව සහ කළුගල් ඇතිරීම සහ සහ 1-4 ස්ථාන අතර A, B සහ C බෝක්කු ඉදිකිරීම

vi. 03-05 ස්ථානයේ කාණු ඔස්සේ දියවලවල් ඉදිකිරීම

vii. රණසිංහ මාවත ඇළ වැඩිදියුණු කිරීමේ කාර්යයන් (කලාපය 01- පැකේජය 40)

viii. රබර්වත්ත වැවේ පිටවාන ව්‍යුහය ඉදිකිරීම.

ix. පැහිරිවත්ත පාරේ ඉහළ කොටසෙහි බෝක්කු 02ක් ඉදිකිරීම

x. අරලිය මාවතේ ප්‍රවේශ මාර්ගය සඳහා ග්‍රේට්ං වැඩ

xi වේරහැර ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු.

xii. කට්ටිය හන්දියේ කඩ සාප්පු, ව්‍යායාම මංතීරුව කාණු ඉදිකිරීම

xiii. පැපිලියානේ මීටර් 4 පළල සතරැස් බෝක්කුව ඉදිකිරීම

xiv. දිවුලපිටියේ බෝක්කු 2ක් ඉදිකිරීම

xv. වෙල මාවතෙහි හදුනාගත් ඉදිකිරීම් කාර්යයන්

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 161.20 ක් වන අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රුපියල් මිලියන 259.20 කි.




























<u>ස්වයං අරමුදල් ව්‍යාපෘති</u>

16. කිරිමණ්ඩල මාවතේ මධ්‍යම ගබඩාව - බිම් මහළ සහ පළමු මහළ අතර මහළ, වෙන් කිරීමේ කටයුතු සහ රාක්ක පද්ධතිය ඉදිකිරීම

ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුව රු. මිලියන 10 ක් වන අතර ආවරණ කාර්යයන්, වෙන් කිරීමේ කාර්යයන්, ලෝහ වැඩ සහ ගෘහ භාණ්ඩ සැපයීම ඇතුළත් වේ.

ආරම්භ කළ දිනය 2021 මාර්තු 22 වන අතර ව්‍යාපෘතිය නිම කළ දිනය 2021 ඔක්තෝබර් 31 විය.







2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 9.0 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 9.0කි.

17. අනුරාධපුර නිවාඩු නිකේතනය සඳහා යෝජිත නිම කිරීමේ කාර්යයන්

අනුරාධපුර නිවාඩු නිකේතනය සඳහා ගෘහ භාණ්ඩ සැකසීම සඳහා යෝජිත නිම කිරීමේ කාර්යය සඳහා මුළු ඇස්තමේන්තුගත වටිනාකම සඳහා රු.මි.17.90 කි.

ඉහත කාර්යයන් 2020 අගෝස්තු මස ආරම්භ කර 2021 අප්‍රේල් මස අවසානය වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත.

ඉහත කාර්යයට අදාළව සිදු කර ඇති මූළු කාර්යය රු. මිලියන 13 ක් වන අතර 2021 වසර දක්වා සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 18 කි.





ඉඩම් සහ අළෙවිකරණ අංශය

ඉඩම් සහ අළෙවිකරණ අංශය

ඉඩම් හා අළෙවිකරණ අංශය මෙම සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරී අංශවලින් එකක් වන අතර පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කිරීමට අවධානය යොමු කර ඇත; සංවර්ධන කටයුතු සඳහා සුදුසු ඉඩම් අත්පත් කර ගැනීම, ජලය රඳවාතබා ගැනීමේ කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, මහ කොළඹ ගංවතුර පාලන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GCFC&EIP) සඳහා අත්පත් කර ගත් ඉඩම්, එම ඉඩම්වල භාරකරු ලෙස කළමනාකරණය කිරීම, ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශ අනුව ඉඩම් බැහැර කිරීම, 2006 අංක 35 දරණ සංශෝධිත පනතට අනුව තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම, එවැනි සංවර්ධනයන්හි බලපෑමට ලක්වූ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සහ ඔප්පු නිකුත් කිරීම.

රාගම, කොලොන්නාව සහ ඔලියමුල්ල යන ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සහ ජලාපවහනය වැඩිදියුණු කිරීම පිණිස ඇළ මාර්ග සංවර්ධනය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කර ඇත.

ගංවතුර අවම කිරීම සඳහා අතුරුගිරියේ රේඛීය උද්‍යානය සහ රැඳවුම් පොකුණ සඳහා සහ පානදුර ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට සංස්ථාව මූලික පියවර ගෙන ඇත.

රත්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංස්ථාව සඳහා අක්කර 25ක භූමි ප්‍රමාණය අත්පත් කර ගෙන ඇත. ඉහත කාර්යයන්වලට අමතරව, අත්පත් කර ගැනීම කඩිනම් කිරීම සහ අවසන් කිරීම සඳහා වේරළු ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WGSWD&EIP) යටතේ ඉඩම් අත්පත් කර ගැනීම මේ වනවිට ඉඩම් සහ අළෙවිකරණ අංශය වෙත පවරා ඇත.

කොළඹ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානයට ආසන්නව පිහිටා තිබීම හේතුවෙන්, මුතුරාජවෙල ප්‍රදේශය බස්නාහිර කලාපයේ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහනය කලාපයේ කොටසක් ලෙස හඳුනාගෙන තිබේ. තවද කෙරවලපිටිය පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සංවර්ධනයත් සමඟ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහනය හා සම්බන්ධ ව්‍යාපෘති සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම්වල ඉල්ලුම විශාල ලෙස වැඩි විය. ඒ අනුව, සංස්ථාව විසින් මුතුරාජවෙල ප්‍රදේශයේ බොහෝ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත.


ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තරඟකාරී මිලක් ලබා ගැනීමෙන් පසු බහුකාර්ය ඒකාබද්ධ භාණ්ඩ ප්‍රවාහන කටයුතු ආරම්භ කිරීම සඳහා අක්කර 34 ක පමණ විශාලත්වයකින් යුත් බිම් කැබලි කිහිපයක් හේමාස් ලොජිස්ටික්ස් (පෞද්) සමාගම, පිරමිඩ් ලංකා (පෞද්) සමාගම, ඊස්ට් වෙස්ට් ක්ලියරින් ඇන්ඩ් ෆෝවර්ඩින් ලිමිටඩ්, ඩාර්ට් ග්ලෝබල් ලොජිස්ටික්ස් (පෞද්) සමාගම සහ ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් (පෞද්) යන සමාගම් සඳහා වෙන් කර ඇත

පසුගිය වර්ෂ කිහිපය තුළ මුතුරාජවෙල කාර්මික කලාපයේ ඉඩම් බොහොමයක් කර්මාන්ත කිහිපයක් සහ ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා බැහැර කර ඇත. බනිජ තෙල් ටැංකි අංගනය, ලිට්‍රෝ ගෑස්, ලංවිම බලාගාරය කලාපය තුළ පිහිටා ඇති වැදගත් ව්‍යාපෘති සමහරකි.

2021 වර්ෂය තුළ ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පෞද්) සමාගම, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් සහ සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන් යන ආයතනවල පුළුල් කිරීමේ ව්‍යාපෘති සඳහා සුදුසු ස්ථාන ලෙස ඉඩම් කැබලි කිහිපයක් හඳුනාගෙන ඇත.

කොළඹ කසළ ප්‍රශ්නය විසඳීම සඳහා සංස්ථාව විසින් මුතුරාජවෙල ප්‍රදේශයේ අක්කර 10ක භූමි ප්‍රමාණයක් වෙස්ටර්න් පවර් කම්පැනි (පෞද්) සමාගම වෙත ලබා දී ඇත. කසල බලශක්තිය බවට පත් කිරීමේ මෙම ව්‍යාපෘති මඟින් ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 10-20ක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉඩම් හා අළෙවිකරණ අංශය දිගු කාලීන කල්බදු, කෙටිකාලීන කල්බදු, සෘජු විකුණුම් සහ තනි නිවාස සඳහා විකුණුම් මඟින් ඉඩම් බැහැර කිරීමේ නිරත වේ. ඒ අනුව, ඉඩම් හා අළෙවිකරණ අංශය 2021 වර්ෂය තුළ විකුණුම්/කල්බදු වලින් දළ වශයෙන් රු.මිලියන 671.16ක මුදල් ප්‍රවාහයක් සාක්ෂාත් කර ගෙන ඇත.



මෑත අතීතයේ සංවර්ධනයේ නව මානයන් සමඟ සංස්ථාවේ විෂය පථය වඩාත් සංවර්ධන අරමුණු හා පරිසර සංරක්ෂණය උදෙසා වෙනස් කර ඇත. ගංවතුර පාලනය, තෙත් බිම් සංරක්ෂණය, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමෙන් ඇළ ඉවුර අලංකාර කිරීම සහ ඇළ ඉවුර ඔස්සේ ඇවිදීමේ මංතීරු ඉදිකිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වෙමින් පවතී.
ඉහත කාර්යයන් සඳහා සහාය වීම සඳහා ඉඩම් හා අළෙවිකරණ අංශය දිවයිනේ තෙත්බිම් අදියර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ නිරත වේ. සංස්ථාවේ අනෙකුත් අදාළ අංශ සමඟ සහයෝගිත්වයෙන් ඇළ මාර්ග රක්ෂිත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරමින් පවතී.

2021 වර්ෂයේදී වයඹ පළාතේ තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම අවසන් කර ඇත. ඒ අනුව උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් සියලුම පළාත්වල තෙත් බිම් මේ වනවිට ප්‍රකාශයට පත් කර ඇත.

බස්නාහිර පළාතේ ඇළ රක්ෂිත දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර දකුණු සහ ඌව පළාත්වල ඇළ මාර්ග රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම සිදුවෙමින් පවතී.

සංස්ථාව විසින් ජලය රඳවාගැනීමේ අරමුණු සඳහා GCFC&EI ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් වගුරු බිම් නඩත්තු කිරීමද සිදු කරයි. වර්තමානයේ මෙම ඉඩම් සංස්ථාවේ නීති අංශය, ආරක්ෂක ඒකකය සහ විශේෂ විමර්ශන ඒකකයේ සහාය ඇතිව ඉඩම් හා අළෙවිකරණ අංශය විසින් කළමනාකරණය කරනු ලැබේ.

සංස්ථාව විසින් අත්පත් කර ගත් වගුරු බිම්වල අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානයක පදිංචි කිරීමට ඉඩම් හා අළෙවිකරණ අංශය කටයුතු යොදා ඇත. එවැනි ව්‍යාපෘති මුතුරාජවෙල, වෙදමුල්ල, පොකුණ පාර, දෙහිවල ප්‍රදේශවල පිහිටා ඇත. එවැනි පවුල්වලට පැවරුම් ඔප්පු නිකුත් කිරීමට කටයුතු යොදා ඇත

2022 වර්ෂය සඳහා විකුණුම් සහ කල්බදුවලින් ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 1973 කි.

සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන අංශය

1. දේශීය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අක්වෙරළ වැලි විකිණීමට හැරීම

ගංගා වැලි සඳහා වඩාත්ම පරිසර හිතකාමී ශක්‍ය විකල්පය ලෙස අක්වෙරළ වැලි සලකනු ලබන අතර වර්තමානයේ එය ඉදිකිරීම් කර්මාන්තයේ වැඩිවන වැලි ඉල්ලුම සපුරාලීමේ ප්‍රධාන මූලාශ්‍රවලින් එකකි. අක්වෙරළ වැලි මිල ගංගා වැලි මිලට වඩා සැලකිය යුතු ලෙස අඩු බැවින්, වෙළෙඳපොළේ ගංගා වැලි මිල පාලනය කිරීමට ද අක්වෙරළ වැලි උපකාරී වේ.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) 2006 වසරේ සිට ඉදිකිරීම් කර්මාන්තයට අක්වෙරළ පිටත වැලි සපයනු ලබයි. පහත දැක්වෙන පරිදි SLLDC විසින් පසුගිය කාලය තුළ අක්වෙරළ වැලි කැණීම් සහ පොම්ප කිරීමේ ව්‍යාපෘති 04ක් සාර්ථකව නිම කර ඇත.

වර්ෂය	කොන්ත්‍රාක්කරු	පොම්ප කරන ලද ප්‍රමාණය
1994 / 1995	බොස්කලිස් ඉන්ටර්නැෂනල්, නෙදර්ලන්තය	ස.ඝ.මි.යන 4.55
2005 / 2007	රෝඩ් නිල්සන් ඒ/එස්, ඩෙන්මාර්කය	ස.ඝ.මි.යන 3.00
2011 / 2013	ඩ්‍රේජින් ඉන්ටර්නැෂනල්, බෙල්ජියම	ස.ඝ.මි.යන 3.80
2018 /2020	රෝඩ් නිල්සන් ඒ/එස්, ඩෙන්මාර්කය	ස.ඝ.මි.යන 3.38




කෙරවලපිටියෙන් ලබා ගන්නා වෙරළාසන්න වැලි කෙරවලපිටියේ පිහිටි සේදීමේ සහ හැලීමේ කම්හලේදී සෝදා හැලීම සිදු කරයි. දැනට සේදීමේ සහ හැලීමේ යන්ත්‍රාගාරය දිනකට කියුබ් 600 ක් පමණ සපයයි. කොන්ක්‍රීට් සහ බදාම සඳහා සියුම් එකතු කිරීම් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් නිකුත් කරන ලද පිරිවිතරයන්ට අනුකූලව "සංස්ථා වැලි" යන වෙළඳ නාමය යටතේ මෙම අක්වෙරළ වැලි අළෙවි කෙරේ (SLS 1397:2010). තවද "සංස්ථා වැලි" SLSI වෙතින් SLS සහතිකය සහ පරිසර හිතකාමී නිෂ්පාදනයක් ලෙස ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාව විසින් "හරිත ලේබල් සහතිකය" පිරිනමා ඇත.

එහි මිල සහ ඉදිකිරීම් කටයුතු සඳහා වැලිවල යෝග්‍යතාවය පිළිබඳව මහජනයා අතර පවතින මතය වෙනස් වීම හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ මුහුදු වැලි සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස ඉහළ ගොස් ඇත


පහත ප්‍රස්ථාරයෙන් 2013 වර්ෂයේ සිට අළෙවි කරන ලද වාර්ෂික අක්වෙරළ වැලි ප්‍රමාණය දක්වා ඇත.

2013 - 2021 කාලසීමාව තුළ අළෙවි කළ අක්වෙරළ වැලි ප්‍රමාණය




★ පහත ප්‍රස්ථාර මඟින් පසුගිය වසර පහේ විකුණුම් රටාව නිරූපණය කරයි

ප්‍රස්ථාරය 01 – මාසික අක්වෙරළ වැලි අළෙවිය




ප්‍රස්ථාරය 02 – මාසික අක්වෙරළ වැලි විකුණුම් ප්‍රමාණයන්



සංස්ථාවට ඉහළම ආදායම් දායකත්වය අක්වෙරළ වැලි අළෙවියෙන් ලැබේ. 2021 වර්ෂයේදී, පසුගිය වසර දෙකට සාපේක්ෂව කියුබ් 317,846.04 ක විකුණුම් පරිමාවක් සාක්ෂාත් කර ගැනීමට සංස්ථාවට හැකි වූ අතර ආදායම අනුව එය රු. 2,288,791,766.86 කි.

මුළු ආදායම (2021) : රු. මිලියන 2,288.79

2021 වර්ෂයේ වැලි අළෙවි කරන ලද මාසික අක්වෙරළ වැලි ප්‍රමාණයන්



➢ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්

1. දියත උයන

දියවන්නා ඔය ඉවුරේ ඉදිකරන ලද දියත උයන උද්‍යානය 2012 සැප්තැම්බර් මාසයේදී විවෘත කරන ලදී. ආරම්භයේ සිටම ආසන්නයේ ජීවත් වන ජනතාව පමණක් නොව දිවයින පුරා විසිරී සිටින සෑම තරාතිරමකම පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට එය සමත් වී තිබේ. වගුරු බිමක ඉදිකර ඇති මෙම උද්‍යානයට වාණිජ අගනගරයෙන් පහසුවෙන් ළඟා විය හැකිය. නගරයේ කළබලකාරී වටපිටාවෙන් මිදී යම් සහනදායී වටපිටාවක විවේකයෙන් ගත කිරීමට පවුල්වලට මෙය කදිම ස්ථානයකි.

සංගීත ජල මලෙන් විහිදෙන වර්ණවත් ජල ධාරාවන් සමස්ත පසුබිමට විචිත්‍රත්වයක් එක් කරයි. දියවන්නා ඔයේ ජලය සන්සුන්ව ගලා බසින වටපිටාවක සශ්‍රීක හරිත හා සාමකාමී වාතාවරණයක් තුළ, ඒ අසල ඇති චතුර මලට අමතරව, දවසේ ඕනෑම වේලාවක විවේකීව සිටීමට කදිම ස්ථානයක් මහජනයාට ලබා දී තිබේ.

දියවන්නා ඔය පසුකර යන විට විවේකීව සිටීමටත්, මදක් ගිමන් හැරීමට සහ වටපිටාව භුක්ති විඳීමටත් උපාය මාර්ගික ස්ථානවල තබා ඇති හරිත උද්‍යාන පුටු මහ හැර යෑමය කිසිවෙකු සමත් වේ යැයි සිතිය නොහැක.



නරඹන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ආහාර අළෙවිසැල් ද තිබේ. පැමිණෙන්නන්ට සෞඛ්‍ය සම්පන්න සහ සන්සුන් වාතාවරණයක් තුළ කෙටි කෑමක් හා පානයක් ලබා ගත හැකිය.

දියත උයන හි මින්මැදුර බොහෝ ළමයින් ආකර්ෂණය කර ගන්නා අතර සවස් කාලයේ රවුම් මින්මැදුර වටා සමූහයා එක්රැස් වන අතර එය නගර වැසියන්ගේ ජීවිතවලට මොහොතක සන්සුන් බවක් ලබා දෙයි.

ප්‍රදේශයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ;

- දියවන්නා ඔය ගං ඉවුරේ පිහිටි අලංකාර මල් වෙළඳසැල්
- ගං ඉවුරේ ඇවිද යෑමට හැකි වීම
- ගංගා බෝට්ටු හෝ රුවල් බෝට්ටු සහ පදින බෝට්ටු සවාරියක් යෑමට හැකි වීම
- ශාක පත්‍රයක හැඩයෙන් යුත් බස් නැවතුම්පොළ
- සිමෙන්තු බංකු සහ මේස
- මධ්‍යයේ පිහිටි ජල මල
- වෙනස්වන වර්ණවලින් යුත් ජල මල
- ළමයින් සඳහා සෙල්ලම් කිරීමේ ප්‍රදේශය.
- නිස්කලංක පරිසරය – ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු වුවද සිදු කළ හැක
- ආහාර වෙළඳසැල් – කෙටි කෑමක් ලබා ගත හැකි වීම සහ දේශීය සහ විදේශීය පාන වර්ග පානය කිරීමට හැකි වීම
- බිම්ගල් ඇල්ලූ මංතීරු ඔස්සේ ඇවිදීම, දිව යෑම සහ පාපැදි පැදීම සිදු කළ හැකි වීම.
- ත්‍රිමාණ ඡායාරූප ලබා ගැනීමේ හැකියාව
- වක්‍රාකාර මින් මැදුර



සුදුසු වෙළඳසැල් හිමියන් ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තෝරාගෙන වසරක කාලයක් මාසික කුලී පදනම මත ප්‍රදානය කරනු ලැබේ, එක් වසරක කාලය වාර්ෂිකව වසර පහක් දක්වා අලුත් කරනු ලැබේ.

කෙසේවෙතත්, 2021 වර්ෂයේ පැවති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේදී ආහාර අළෙවිසැල්වලින් ලැබෙන ආදායමේ අඩුවීමක් දක්නට ලැබුණි.

මුළු ආදායම (2021) : රු. මිලියන 28.68

2. බෙල්ලන්විල

කොළඹ වැසියන් මෙම ස්ථානය ගැන හොඳින් දනි. සෑම දිනකම සිය ගණනක් හෝ දහස් ගණනක් දිවීම, ඇවිදීම සහ පාපැදි පැදීම සඳහා මෙහි පැමිණේ. මෙම ස්ථානයට පැමිණීම රාත්‍රියේදී කොළඹදී කළ හැකි සිත්ගන්නා සුළු දෙයකි.

කොළඹ බොරලැස්ගමුවෙහි පිහිටා ඇති බෙල්ලන්විල උද්‍යානය, ශ්‍රී ලංකාවේ මේ දක්වා අප සාකච්ඡා කළ අනෙක් උද්‍යානවලට වඩා මදක් වෙනස් වේ.



ගංවතුර තර්ජනය පාලනය කිරීමේ අරමුණින් බෙලන්විල උද්‍යානය 2014 දී "වෙරස් ගහ" ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස ඉදිකරන ලදී.

ඇවිදීමේ මාර්ගය, පාපැදි ධාවන පථය සහ ආහාර අළෙවි සැල මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වේ. පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීම ඇත්තෙන්ම කදිම ස්ථානයකි

කෙසේවෙතත්, 2021 වර්ෂයේ පැවති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේදී ආහාර අළෙවිසැල්වලින් ලැබෙන ආදායමේ අඩුවීමක් දක්නට ලැබුණි

මුළු ආදායම (2021) : රු. මිලියන 0.84



3. කිඹුලාවල

සාමාජිකයන් 103 දෙනෙකුගෙන් 2015.01.12 දින ආරම්භ කරන ලද ව්‍යායාම ශාලාවේ ක්‍රියාකාරකම් මේ වනවිට පුද්ගලයින් 396 ක් දක්වා වී ඇති අතර එමඟින් මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවට අමතර වටිනාකමක් ලබා දේ.



ඵලදායී, කාර්යක්ෂම හා අභිප්‍රේරණය වන ව්‍යායාම වැඩසටහන් සැලසුම් කිරීමෙන් මෙම තත්ත්වය අත්පත් කරගෙන ඇත. අපගේ පුහුණුකරුවන් මනා සුදුසුකම්වලින් යුක්ත වන අතර කර්මාන්තයේ නව ප්‍රවණතා සමඟ කටයුතු කරයි.



වැදගත්ම දෙය නම්, ඔවුන් අලුතින් සම්බන්ධ වූ අත්දැකීම් අඩු සාමාජිකයන් පිළිබඳව ඉතා සැලකිලිමත් වීම සහ ඔවුන්ට සහාය වීමයි.

කෙසේවෙතත්, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේදී සාමාජිකයින්ගේ පැමිණීමේ අඩුවීමක් සිදු විය.

4. කෙලිමඩල

"බොරලැස්ගමුව - කෙලිමඩළ ළමා උද්‍යානය" කොළඹ - හොරණ පාරේ පිහිටා ඇත. කෙලිමඩළ උද්‍යානය 2018 දී "වේරස් ගහ" ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇත. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ශ්‍රී ලංකාවේ පළමු ළමා උද්‍යානය මෙයයි. මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ ඇවිදීමේ මාර්ගය, ආහාර අළෙවි සැල සහ ළමා උද්‍යානයයි. එය සැබවින්ම පවුලේ අය හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීමට කදිම ස්ථානයකි.

ආබාධිත ළමුන් සඳහා නිර්මාණය කර ඇති විවිධ ආකාරයේ ක්‍රියාකාරකම් 21 ක් මෙහි ඇත. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට විශේෂ ආරක්ෂාවක් යටතේ හැකි තාක් දුරට සාමූහික ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට හැක .

කෙසේවෙතත්, 2020 වර්ෂයේ පැවති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේ ආහාර අළෙවිසැල්වලින් ලැබෙන ආදායමේ අඩුවීමක් දක්නට ලැබුණි.

මුළු ආදායම (2021) : රු.මිලියන 0.34



1. ඇළ මාර්ග රක්ෂිතවල ඇති වෙළඳ දැන්වීම් පුවරු

සමාගමේ එළිමහන් සලකුණු බොහෝ විට අනාගත ගනුදෙනුකරුවෙකු දකින පළමු දෙයයි. සමාගම් ලාංඡනය අවධානය ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් දීප්තිමත් හා කැපී පෙනෙන්නක් විය යුතු (අතිශය දීප්තිමත් නොවිය යුතුය) වන අතර අනාගත ගනුදෙනුකරුවන්ට එහි විකුණනු ලබන දේ පිළිබඳව දැන ගැනීමට ප්‍රමාණවත් තොරතුරු සහිත විය යුතුය. SLLDC පාලනය යටතේ ඇති ඇළ ඉවුරුවල සහ වෙනත් ස්ථානවල ඇති ඉඩ ප්‍රමාණය පෞද්ගලික පාර්ශ්වයන්ට ඔවුන්ගේ නිෂ්පාදනය, සේවාව හෝ සමාගම ප්‍රදේශයේ මහ නගර සභාවේ අවසරය ඇතිව ප්‍රචාරය කිරීම සඳහා ලබා දී ඇත.





මුළු ආදායම (2021) : රු. මිලියන 3.09

5. ගාර්ටන්ස් ආර්ක් අවන්හල

ගාර්ටන්ස් ආර්ක් යනු නාවල නාගරික තෙත්බිම් උද්‍යානයට යාබදව පිහිටි දියවන්නා ඔයේ නිශ්චල ජලයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ විශාලතම යාත්‍රා අවන්හලයි. එය 2014 නොවැම්බර් මාසයේදී දියත් කරන ලදී.

මුළු ආදායම (2021) : රු. මිලියන 0.75



6. හංස බෝට්ටු සේවය

විවේකය සහ සන්සුන්භාවය දියවන්නා ඔයේ දායාදයන් වේ. පදින හංස බෝට්ටු මඟින් විනෝදාත්මක අත්දැකීමක් ලබා දෙන අතරම එහි වගුරුබිම් ඉවුර දිගේ බෝට්ටු සවාරිය නගර වැසියන්ට සොබාදහම සමඟ නැවත සම්බන්ධ වීමට උපකාරී වේ. මෙම පහසුකම් මහජනයාට ලබා දීම සඳහා පෞද්ගලික අංශයට භාර දී ඇත.

මුළු ආදායම (2021) : රු. මිලියන 0.07



7. කටමරාන් -38' ඩිනර් ක්‍රෘස් යාත්‍රාව

38' ඩිනර් ක්‍රෘස් යාත්‍රාව 2020 ජනවාරි 24 වන දින සිට දියත උයන අවට දියවන්නා වැවේ යාත්‍රා කරන අවන්හලකි. යාත්‍රා කරන ආපනශාලාව දුර්ලභ ශාක හා සත්ත්ව විශේෂවලින් යුත් සුන්දර දූපත් පසුකරමින් දියත ජල මාර්ගයේ පැහැදිලි ජලයේ කිලෝමීටර 12 ක් ආවරණය කරමින් යාත්‍රා කරයි. SLLDC හි පාලනය යටතේ ඇති පරිශ්‍රය සහ ජලාශය ඒෂියා ක්‍රෘස් ලයින්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් සමාගම වෙත ඔවුන්ගේ යාත්‍රා කරන ආපන ශාලාව පවත්වාගෙන යාමට ලබා දී ඇත.





මුළු ආදායම (2021) : රු. මිලියන 0.17

මානව සම්පත් සංවර්ධන අංශය

මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන අංශයේ දායකත්වය

මානව සම්පත් සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්

01. මානව සම්පත් මෙහෙයුම් (පරිපාලනය)
මානව සම්පත් ක්‍රියාකාරකම් මනා මෙහෙයවීම සහ සේවකයන්ගේ සුබසාධනය සහතික කිරීම

02. මානව සම්පත් සංවර්ධනය
පුද්ගල හා ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව තුළ මානව ප්‍රාග්ධනය නිසි ලෙස සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම.

03. මානව සම්පත් පුහුණුව සහ සංවර්ධනය
ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා සේවකයන්ගේ කුසලතා සාක්ෂාත් කර ගැනීම සහ වැඩිදියුණු කිරීම

මානව සම්පත් මෙහෙයුම්	මානව සම්පත් සංවර්ධනයන්	මානව සම්පත් පුහුණුව
• සේවා අවශ්‍යතා මත වාර්ෂික මාරුවීම් සහ මාරුකිරීම්	▪ මානව සම්පත් සැලසුම් කිරීම	• දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම
• මිනිස්බල/දේපළ/වාහන/යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අනතුරු සහ හිමිකම් සමඟ වාර්ෂික රක්ෂණ හැසිරවීම	▪ බඳවාගැනීම සහ තෝරා ගැනීම	• පුහුණු අවශ්‍යතා ඇගයීම් පැවැත්වීම
• චිනය පරිපාලනය	▪ උසස්වීම්	• වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කිරීම
• සේවක සුභසාධන ක්‍රියාකාරකම්	▪ මානව සම්පත් ප්‍රතිපත්ති සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය	• නම් කරන ලද පුහුණු වැඩසටහන් සඳහා පුහුණු කමිටු නිලධාරීන් හරහා තෝරා ගැනීම් සිදු කෙරේ
• සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ	▪ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීම	• පශ්චාත් පුහුණු ඇගයීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම
• ආරක්ෂක අංශය, ප්‍රවාහන හා වෛද්‍ය මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම	▪ ආයතනික සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කිරීම	• උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර ලබා දීම
• තැපැල් පද්ධතියේ පරිපාලනය		• සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාවලි, ක්‍රියා පටිපාටි අධීක්ෂණය සහ වැඩි දියුණු කිරීම
• වැටුප් හා වේතන පරිපාලනය.		
• වාර්ෂික/වැටුප් වර්ධක		
• ඍන්නිය සමිති කටයුතු කළමනාකරණය		
• සේවක දුක්ගැනවිලි		
• කාල කළමණාකරණය		
• අභ්‍යන්තර සහ බාහිර චක්‍රලේඛ		

<u>බඳවාගැනීම් සහ තෝරාගැනීම්</u>

2021 දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද බඳවාගැනීම් සංඛ්‍යාව

සේවක වර්ගය	2021
ස්ථීර	58
කොන්ත්‍රාත්	15
එකතුව	73

2021 දෙසැම්බර් 31 දිනට මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව

විස්තරය	සංඛ්‍යාව
ස්ථීර	1278
කොන්ත්‍රාත්	56
අනියම්	00
එකතුව	1334

<u>මානව සම්පත් සැලසුම්කරණය: 2021 වර්ෂය සඳහා යෝජිත නව සේවක සංඛ්‍යාව</u>

තනතුර	වැටුප් ක්‍රේකය	අනුමත සේවක සංඛ්‍යාව	මේ වනවිට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	යෝජිත සේවක සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරි	HM- 2-2	01	01	-	01
අතිරේක සාමාන්‍යාධිකාරි	HM 2-1	02	02	-	02
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි	HM 1-3	12	11	01	12
සහකාර සාමාන්‍යාධිකාරි	HM 1-1	17	12	05	17
කළමනාකරු	MM 1-1	154	138	16	160
කණිෂ්ඨ කළමනාකරු	JM 1-1	120	89	31	127
බලාත්මක කිරීමේ නිලධාරි	MA 5-1	08	04	04	09
සහායක නිලධාරි	MA 03	61	54	07	65
කළමනාකරණ සහකාර - නාක්ෂණ කාණ්ඩය	MA 2-2	220	147	55	252
කළමනාකරණ සහකාර නාක්ෂණ නොවන කාණ්ඩය	MA 1-2	210	173	23	210
ප්‍රාථමික මට්ටම - පුහුණු	PL 03	321	282	29	466
ප්‍රාථමික මට්ටම - අර්ධ පුහුණු	PL 02	111	65	49	119
ප්‍රාථමික මට්ටම - නුපුහුණු	PL 01	412	318	69	138
යෝජිත නව තනතුරු නාම					26
මුළු එකතුව		1649	1278	291	1878

<u>පුහුණුව සහ සංවර්ධනය</u>

කොවිඩ්-19 ව්‍යාප්තිය අතරතුර පුහුණු වැඩසටහනක් සඳහා අවම සේවක සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් නව විසඳුම් යොදා ගනිමින් වෛද්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව ඇතැම් සීමාකිරීම් තුළ ඉගෙනුම් සහ කුසලතා සංවර්ධනය සඳහා ප්‍රවේශය පවත්වා ගෙන යන ලදී.

ලොව පුරා ව්‍යාප්ත වූ ව්‍යසනයත් සමඟ සියලුම විදේශීය පුහුණුවීම් අවලංගු කර දේශීය පුහුණු වැඩසටහන් අංක 14 ක් පැවැත්වීමට සමත් වූ අතර ඒ සඳහා සේවකයින් 265 දෙනෙකු සහභාගි විය. එම පුහුණු වැඩසටහන් සඳහා දරන ලද වියදම රු. 843,357.69/= කි.

ISO තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ සෞඛ්‍යය සහ ආරක්ෂාව

තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS)

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සියලුම ක්‍රියාවලි සහ සේවාවන් සඳහා 2011 අප්‍රේල් 06 දින සිට ISO 9001;2015 අවශ්‍යතා සපුරා ඇති ප්‍රමුඛතම ආයතනයයි.

උසස්වීම්

ආයතනික අරමුණු සපුරාලීම, සේවකයෙකුගේ යුතුකම් සහ කාර්යයන් හඳුනාගැනීම මත උසස්වීම් පදනම් වේ. ලබා දී ඇති සංකීර්ණතාව සහ වගකීම මත මෙය වෙනස් විය හැකිය. එබැවින් ඉහළ යන වගකීම් මට්ටම් මත වෙනස් වන තරාතිරම මත උසස්වීම් පදනම් වේ. උසස්වීම්වල අමතර ප්‍රතිලාභ ලෙස වඩා හොඳ කාර්ය සාධනය සඳහා දිරිගැන්වීමක්, චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීමක් සහ ස්වයං සාක්ෂාත් කර ගැනීමක සහ පිළිගැනීමක හැඟීමක් ඇති කරයි .

- සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාවේ ඇති පුරප්පාඩු මත සහ අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවක සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව උසස්වීම සඳහා සලකා බලන ලදී.

- අනුමත උසස්වීම් ක්‍රියා පටිපාටියේ දක්වා ඇති අවශ්‍යතා අනුව ශ්‍රේණියක සිට තවත් ශ්‍රේණියකට උසස්වීම් ලබා දෙන ලදී

ඒ අනුව, 2022 වර්ෂයේ මේ දක්වා SLLDC හි සේවකයින් සඳහා ශ්‍රේණි උසස්වීම් 158 සහ උසස් කිරීමේ පත්වීම් 29 පිරිනමා ඇත.

නීති අංශය

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (SLLDC) පනත හා එහි තදනන්තර සංශෝධනයන් මඟින් පවරා ඇති බලතල ප්‍රකාරව නීති අංශය ක්‍රියාත්මක වේ.

නීතිමය කාර්යයන්:

1. ඉඩම් සංවර්ධනය කිරීම්, නැවත පදිංචි කිරීම, ප්‍රජා උපදේශන සඳහා අදාළ නීති කෙටුම්පත් ලියවිලි සකස් කිරීම සහ අඩු ආදායම්ලාභී පවුල් පදිංචි ප්‍රදේශවල ජනතාව සඳහා නීතිමය ආධාර සැපයීම.

2. සංස්ථාව මඟින් හා සංස්ථාවට එරෙහි නඩු හබ ආදියේදී අධිකරණයේදී සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම හා ආරක්ෂා කිරීම.

3. සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

4. සියලු ආකාරයේ අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව, ජල අපවහන සැලසුම්වල සඳහන් කොන්දේසි කඩකරන්නන්ට එරෙහිව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සහ 2006 අංක 35 හා 2021 අංක 13 දරන එහි සංශෝධනයන් මඟින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි පිහිටි ඇළ මාර්ග රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් සහ ඇළ මාර්ග දූෂණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සංස්ථාව බලාත්මක වී ඇත.

5. සියලු අවබෝධතා ගිවිසුම් සැකසීම හා සහතික කිරීම, අළෙවි ගිවිසුම්, කොන්ත්‍රාත්/ උපදේශන ගිවිසුම්, දිගු කාලීන බදු දීම්, වාර්ෂික බදු දීම්, කෙටි කාලීන බදු දීම්, ඔප්පු පවරා දීම්, අදාළ නීතිමය ලියකියවිලි, විදේශ රැකියා පොරොන්දු පත්‍ර (වැටුප් සහිත/රහිත), මෝටර් රථ ණය ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර සහ ඉඩම් නිරවුල් සහතික පත් සඳහා ඉඩම් හිමිකම් වාර්තාවන්හි අයිතිය

විගණන කමිටු වාර්තාව

කමිටුවේ කාර්ය භාරය

විගණන කමිටුව ආයතනයක මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි ක්ෂේත්‍රවල අධීක්ෂණ වගකීම් සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයට සහාය වීම සඳහා උපාය මාර්ගික කාර්යභාරයක් ඉටු කරනු ලබන කමිටුවකි. විගණන කමිටුව සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් දරන අතර එය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත වේ. කමිටුවේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය හා විගණන විශේෂඥතාවක් සහිත ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලයක සහාය කමිටුවට ලබා දී ඇත.

විගණන කමිටු ප්‍රඥප්තිය

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛය මඟින් පොදු ව්‍යවසායන්වල විගණන කමිටු පාලනය වේ.

ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ස්වාධීන හා විෂය මූලික සමාලෝචනයක් ලබා දීමෙන් මණ්ඩලයට සිය රාජකාරි ඉටු කිරීමට සහාය වීම කෙරෙහි විගණන කමිටුව මූලික වශයෙන් අවධානය යොමු කරයි.

කමිටුවේ රැස්වීම්

2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කාර්ය සටහන් වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරන ලදී. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස විගණන අධිකාරීවරයා රැස්වීම්වලට සහභාගි විය. රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ආරාධනය මත රැස්වීම්වලට සහභාගි විය.

2021 වසරේ පැවති රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
යූ.එන්. මල්ලවාරච්චි මහතා (සභාපති)	4
එන්.එච්.එන්.එල්. නවරත්න මහතා (සාමාජික)	4
දිනේෂ් ජයවීර මහතා (සාමාජික)	3

අභ්‍යන්තර විගණනය

සංස්ථාවට වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ඇත. අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන කමිටුවට ඉදිරිපත් කර අනුමත කරන ලද අතර කමිටුව අභ්‍යන්තර විගණන සැලැස්ම ආවරණය කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරයි. කමිටුව එහි කාර්තුමය රැස්වීම්වලදී අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තා සමාලෝචනය කරන අතර එමඟින් අභ්‍යන්තර විගණන සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට කමිටුවට හැකියාව ලැබේ.

බාහිර විගණනය

2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදී. විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද විගණන අධිකාරීවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, සංස්ථාවේ බාහිර විගණන කටයුතු සම්බන්ධීකරණය කරයි.

නිගමනය

මෙම වාර්තාවෙන් ආවරණය වන කාල සීමාව තුළ, එනම් 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර තුළ කමිටුවේ දැනට සේවය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කිසිවකු නොසිටින ලද බව කමිටුව අවධානයට ලක් කරයි. එත්මන් විගණන කමිටුව එස්.ඒ.සී. කුලතිලක මහතා (සභාපති), ගාමිණී හේවගේ මහතා (සාමාජික), ධම්මික දිසානායක මහතා (සාමාජික) යන අයගෙන් සමන්විත වේ.


විගණන කමිටුව වෙනුවෙන්.


එස්.ඒ.සී.කුලතිලක
සභාපති - විගණන කමිටුව
2022 සැප්තැම්බර් 22

මූල්‍ය සමාලෝචනය


සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය

ජාතියක් ලෙස අප පසුකරමින් සිටින්නේ දුෂ්කරම කාල පරිච්ඡේදයකි. පවතින විදේශ විනිමය හිඟය ආර්ථිකයේ සෑම අංශයකටම දැඩි ලෙස බලපා ඇත. පවතින ආර්ථික අර්බුදයේ අයහපත් ප්‍රවිපාක වන ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් දීර්ඝ කාලයක් නිහව පැවතීම, අධික මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට සිදුවීම, අවශ්‍ය ද්‍රව්‍ය හිඟය වැනි අහිතකර බලපෑම් ඕනෑම ව්‍යාපාරික ආයතනයක ක්‍රියාකාරිත්වයට බාධාවක් වේ. මෙම අභියෝග මධ්‍යයේ වුවද රු. මිලියන 1,023 ක ශුද්ධ ලාභයක් සමඟ 2021 මූල්‍ය වර්ෂය අවසන් කිරීමට සංස්ථාවට හැකි විය. SLLDC හි විශාල මූල්‍ය කාර්ය සාධනය වාර්තා කිරීමට හැකි වීමේ රහස අන් කිසිවක් නොව, අක්වෙරළ වැලි විකිණීමේ ව්‍යාපාරය සඳහා ඉහළ අස්වැන්නක් සහ වෙළඳපල ඉල්ලුමක පැවතීමයි. ශුද්ධ ලාභයට ප්‍රධාන වශයෙන් අක්වෙරළ වැලි අළෙවි ව්‍යාපාරයට ආරෝපණය කළ හැකි රු. මිලියන 935 ක මෙහෙයුම් ලාභයක් ඇතුළත් බව සඳහන් කිරීම ප්‍රශංසනීය වේ.





2021 වර්ෂය සඳහා, සංස්ථාව ප්‍රධාන ව්‍යාපාරවලින් රු.මිලියන 6,793 ක ආදායමක් වාර්තා කළේය. මෙම ආදායමේ ආංශික වශයෙන් සංයුතිය පහත පරිදි වේ;



2021 වර්ෂය සඳහා සංස්ථාව විසින් රු. මිලියන 3,090 ක එකතු කළ අගයක් නිර්මාණය කර ඇති අතර එය පාර්ශ්වකරුවන් අතර බෙදා හැරීම මෙම වාර්තාවේ අවසාන කොටසෙහි දැක්වේ.

සංස්ථාව සංස්ථාපිත කර වසර 50කට පසු සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 10 ඉක්මවා ඇති බව සඳහන් කිරීම වටිනා කාරණයකි. එලෙසම සංස්ථාවේ මුළු වත්කම රු. බිලියන 20 ඉක්මවා ඇත. ආයතනයේ ද්‍රවශීලතාවය ද සතුටුදායක මට්ටමක පවත්වා ගෙන යනු ලැබේ.

සතුටුදායක මූල්‍ය කාර්ය සාධනයක් පැවතියද, සංස්ථාව මුහුණ දෙන විශාලතම අභියෝගය එයට දැරීමට සිදු වී ඇති අධික පොදු කාර්ය පිරිවැය හේතුවෙන් ඇති වන ඉහළ පොදු කාර්ය පිරිවැය බව සඳහන් කළ යුතුය. 2021 වර්ෂයේදී පොදු කාර්ය වියදම් දළ ලාභයෙන් 65%කට වඩා පරිභෝජනය කර ඇත. තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී, පොදු කාර්ය වියදම්වලින් 85% කට වඩා කාර්ය මණ්ඩල පිරිවැය සඳහා වන බව නිරීක්ෂණය වේ.

සමූහ මූල්‍ය කාර්ය සාධනය

අනුබද්ධ REDECO සමාගම මේ වසරේ ද රු. මිලියන 2 ක ආන්තික පාඩුවක් ලබන අතර LRDC සර්විසස් (පෞද්) සමාගම රු. මිලියන 33 ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය. තවද REDECO හි ශුද්ධ වටිනාකම මූල්‍ය වර්ෂය අවසානයේ සෘණ රු.මිලියන 31ක් විය.

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වාර්තාව හා සංස්ථාවේ ගිණුම් සතුටින් ඉදිරිපත් කරයි.

ප්‍රධාන කාර්යයන්
සංස්ථාවේ ප්‍රධාන කාර්යයන්, මෙහෙයුම් සමාලෝචනයේ සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 1 හි විස්තර කර ඇත

වර්ෂය පිළිබඳ මෙහෙයුම් සමාලෝචනය
වර්ෂය තුළ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමාලෝචනයක් මේ යටතේ දක්වා ඇත.

පිරිවැටුම
2021 වර්ෂය තුළ සංස්ථාවේ පිරිවැටුම රුපියල් මිලියන 6,793කි. (2020: රු.මිලියන 7,304කි)

ලාභය
2020 වර්ෂයේ ලාභය වන රු.මිලියන 2,448 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ලාභය රු.මිලියන 1,029 කි.

කටයුතුවල තත්ත්වය
සංස්ථාවේ කටයුතුවල තත්ත්වය මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි වේ. (පිටුව 105)

දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ
වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ පිළබඳ සිදු වූ සංසරණය ගිණුම් හා සම්බන්ධ සටහන් අංක 8**හි** දක්වා ඇත.

බදුකරණය
2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත සහ එකී පනතෙහි තදනන්තර සංශෝධන ප්‍රකාර බදු ගෙවීම් සඳහා කරන ගැළපුම් අනුව වර්ෂයේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව
මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 22 හි අනාවරණය කර ඇති පරිදි හැර සංස්ථාවේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්
2021 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා ඇත. එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව පහත පරිදි වේ

අධ්‍යක්ෂවරයාගේ නම්	පත්වීම් දිනය	සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබූ රැස්වීම් සංඛ්‍යාව	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
මේජර් ජෙනරාල් එම්.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහතා (විශ්‍රාමික)	05.12.2019	07	07
ඉංජිනේරු නිහාල් සිරිවර්ධන මහතා	18.05.2020	07	05
යූ.එන් මල්ලවාරච්චි මහතා	13.01.2020	07	05
එන්.එච්.එන්.එල්. නවරත්න මහතා	07.01.2020	07	07
දිනේෂ් ජයවීර මහතා	07.01.2020	07	06
එච්.කේ.චමත් තාරුක අල්විස් මහතා	23.02.2021	06	04
ඩී.පී. නන්දන දිසානායක මහතා	25.06.2021	04	04
ගෘහනිර්.ශිල්පී හර්ෂන් ද සිල්වා මහතා	23.01.2020	03	03
එච්.ජී.සී.ජේ ජයසිංහ මහතා	07.01.2020	03	03

අඛණ්ඩ පැවැත්ම
අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සංස්ථාව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශ්වාසය පළ කර සිටී.

ව්‍යාවස්ථාපිත ගෙවීම්
ඔවුන්ගේ දැනුවත් වීම සහ විශ්වාසය අනුව රජය සහ සේවකයන් සම්බන්ධයෙන් සිදු කළ සියලු විමධ්‍යගත ගෙවීම් නියමිත කලට වේලාවට සිදු කළ බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

සේවක මණ්ඩලය
2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පුද්ගලයින් 1,334 දෙනෙකු සංස්ථාවේ සේවයේ නියුතුව ඇත. (2020: 1450)

ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්
ශේෂ පත්‍රයේ දිනට පසු සිදු වී ඇති වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්වල ගැළපීම් සිදු කර ඇත.

අති විශේෂිත අයිතමයන්
වෙනම අනාවරණය කළ යුතු අසාමාන්‍ය/අති විශේෂිත ස්වභාවයේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් මඟින් වාර්තා කර ඇත.

විගණකවරු
2021 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලැබේ.

මණ්ඩලයේ අණ පරිදි,

එච්.කේ.කේ.ඩබ්ලිව්. ඒකනායක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2022 දෙසැම්බර් 14 වැනි දින

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HUD/C/SLLDC/21/01 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 ජූනි 21 දින

සභාපති

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගම්වල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (සංස්ථාව) හා එහි පරිපාලිත සමාගම්වල (සමූහය) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ සහ සමූහයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01

ප්‍රමිතියේ 54 වන ඡේදය අනුව ආයතනයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හිමිකම සම්බන්ධ අයිතම පමණක් පෙන්නුම් කළ යුතු වුවත් සංස්ථාව විසින් කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ සාමාජික මුදල්වලින් සමන්විත වූ රු.මිලියන 95.14 ක සේවක සුභසාධන අරමුදල් ශේෂය හිමිකම් හා සංචිත යටතේ හා ජංගම නොවන වගකීම් යටතේ හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් හිමිකම හා සංචිත එම අගයෙන් අඩි ගණනය වී තිබුණු අතර ජංගම නොවන වගකීම් ඌන ගණනය වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමයට පිළියෙල කිරීමේදී, කාරක ප්‍රාග්ධනය වෙනස් වීම් ගැලපීම් කිරීම සඳහා යොදා ගත යුත්තේ ජංගම වත්කම් හා ජංගම වගකීම් වුවත්, සංස්ථාව විසින් හිමිකම හා සංචිත යටතේ ඇති සේවක සුභසාධක අරමුදලේ වෙනස්කමද එතුළ ගැලපීම් හේතුවෙන් කාරක ප්‍රාග්ධන වෙනස්කම් රු.මිලියන 13.63 කින් අඩි ගණනය වී මූල්‍ය ක්‍රියාකාරකම් එම අගයෙන්ම ඌන ගණනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08

ප්‍රමිතියේ 42 (ආ) ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක සිදුකරන වෙනස්කමක් ඉදිරිපත් කරන පැරණිම කාලපරිච්ඡේදයටත් පෙර වරදක් නම් ඉදිරිපත් කරන පැරණිම කාලපරිච්ඡේදයේ ආරම්භක ශේෂ නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතයට බලපාන ලෙස නිවැරදි කළ යුතු වේ. 2017 වර්ෂයේදී සංස්ථාව විසින් දියත් උයන භූමිය ආපන ශාලාව සංවර්ධනය කිරීම වෙනුවෙන් වැයකරන ලද රු. මිලියන 88.42 ක් හා ඒ සඳහා සියයට 15 ක පොළී ප්‍රතිශතය යටතේ වර්ෂ 4 ක් සඳහා අයකරගත යුතු පොළිය ලෙස රු. මිලියන 33.64 ක් චෝටර්ස් ඒජ් සමාගමෙන් අයවිය යුතු ලෙස 2021 ජනවාරි 01 දිනට දක්වා තිබුණි. එහෙත් 2022 අගෝස්තු 19 වන දින චෝටර්ස් ඒජ් සමාගම සමඟ එළඹ තිබූ ගිවිසුම් අනුව ණය මුදල සඳහා අයකරගත හැකි පොළී ප්‍රතිශතය සියයට 5 ක් ලෙස එකඟ වී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2018 වසරේ සිට මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන තිබූ සියයට 15 පොළී ආදායම් වූ රු. මිලියන 22.39 ක් අතීතයට බලපාන පරිදි නිවැරදි කිරීම් සිදු නොකර අදාළ ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 2.86 කින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 08

ආයතනයක් විසින් තම මූල්‍ය ප්‍රකාශන මඟින් තමන් නිරතවන ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ස්වභාවය, මූල්‍ය බලපෑම හා එය ක්‍රියාත්මක වන ආර්ථික පරිසරයත් ඇගයීමට හැකිවන පරිදි අවශ්‍ය තොරතුරු පරිශීලකයන් හට හෙළිදරව් කළ යුතු අතර ප්‍රමිතයේ 11 වන ඡේදය ප්‍රකාරව ආයතනය විසින් සිය එක් එක් මෙහෙයුම් අංග පිළිබඳව තොරතුරු වෙන වෙනම වාර්තා කළ යුතු වේ. එසේ වුවද, සංස්ථාවේ මෙහෙයුම් ප්‍රධාන පිරිවැය මධ්‍යස්ථාන කිහිපයක් ඇතුලු අංශ හඤ්ඤාවක් සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන නමුත් ප්‍රමිතියට අනුව එම ප්‍රධාන අංශවල මෙහෙයුම් කටයුතු පිළිබඳ වෙන වෙනම වාර්තා කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15

සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව විසින් භාහිර පාර්ශවයන් සඳහා ව්‍යාපෘති (Client Project) ඉටුකිරීමෙන් ලද කොන්ත්‍රාත් ආදායම මූල්‍ය ප්‍රකාශවල හඳුනාගැනීමේදී සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්වල වටිනාකමින් සියයට 90 කට සමාන රු. මිලියන 1,686.64 ක් පමණක් ඇතුළත් කර තිබුණි. එම බිල්පත්වල ඇතුළත් රේටයන් සඳහා අමාත්‍යාංශ ස්ථාවර තාක්ෂණික කමිටුවෙහි (STC) අනුමැතිය ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් බිල්පත්වලට අදාළව සහතික කරන ලද වටිනාකමින් සියයට 10 ක් කාලපරිච්ඡේදයේ ආදායම ලෙස හඳුනාගෙන නොතිබුණි. එහෙත් සහතික කරන ලද නමුත් ආදායමට හඳුනා නොගන්නා ලද මෙම සියයට 10 ආදායම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16

(i) ප්‍රමිතියේ, 34 වන වගන්තිය අනුව, සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්කම් සිදුවන දේපල, පිරියත හා උපකරණ වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කළ යුතු අතර, සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්කම් සිදු නොවන දේපල, පිරියත හා උපකරණ වසර 03 ක් හෝ 05 ක් තුළ ප්‍රත්‍යාගණනය කළ යුතුය. නමුත් සංස්ථාව විසින් රු. මිලියන 1,935.79 ක දේපළ, පිරියත හා උපකරණවල ඇතුළත් රු. මිලියන 971.26 ක ඉඩම් සහ ගොඩනැගිලිවල අගය මුල් පිරිවැයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර කිසිදුවිටක ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 36 වගන්තිය අනුව, දේපළ පිරියත උපකරණවලට අදාළ යම් අයිතමයක් ප්‍රත්‍යාගණනය කරනු ලබන්නේ නම් එම අයිතමයට අදාළ වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, රු. මිලියන 301.39 ක් වටිනා වාහන පමණක් 2020 ජනවාරි මාසයේදී ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් සංස්ථාව සතුව පැවති 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය පිළිවෙලින් රු.

මිලියන 24.74 ක් හා රු. මිලියන 26.47 ක් හා ධාරණ අගය ඇති වූ මෝටර් බයිසිකල් 160 ක් හා ජීප් රථයක් සමාලෝචිත වර්ෂය තුළදීද ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 37 වගන්තිය අනුව ආයතනයක මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන සමාන ලක්ෂණ සහිත වත්කම් සමූහයක් දේපළ, පිරියත හා උපකරණ පන්තියක් ලෙස වර්ගීකරණය කළ යුතු වේ. කෙසේ වුවද සංස්ථාව විසින් 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.95 ක ගෘහ භාණ්ඩ, රු. මිලියන 2.39 ක කාර්යාල උපකරණ රු. මිලියන 0.64 ක සුභසාධක උපකරණද ඇතුළත් රු. මිලියන 10.53 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් තොගයක් වෙනත් ස්ථාවර වත්කම් ලෙස වර්ගීකරණය නොකර පොත්වල දක්වා තිබුණි.

(iv) ප්‍රමිතියේ 51 ඡේදය අනුව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 301.39 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර වත්කම්වල ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(c) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21

ප්‍රමිතියේ 23 (අ) ඡේදය ප්‍රකාරව, ගිණුම් කාලපරිච්ඡේදය අවසානයේදි විදේශ මුදල් අයිතම වර්ෂය අවසාන දිනට ප්‍රකාශිත නිල විනිමය අනුපාතිකය (Closing Exchange rate) භාවිතා කර පරිවර්තනය කර විදේශ විනිමය අනුපාතික ලාභය හෝ පාඩුව ගණනය කළ යුතු වේ. එසේවුවද, සංස්ථාව විසින් මුහුදු වැලි ගොඩදැමීමේ ව්‍යාපෘතියෙහි ගෙවීම් කටයුතු වෙනුවෙන් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන එ.ජ.ඩොලර් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය වූ එ.ජ.ඩො. මිලියන 2.18 ක් රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමේදී එදිනට පැවති මහ බැංකුව විසින් නිකුත් කරන ලද එතැන් විනිමය අනුපාතිකය (Spot Exchange rate) වූ රු.200.4338 ක් මත පරිවර්තනය නොකිරීම හේතුවෙන් විනිමය පරිවර්තන ලාභය රු. මිලියන 4.72 කින් අඩි ගණනය වී තිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායමද එම ප්‍රමාණයෙන් අඩි ගණනය වී තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38

(i) ප්‍රමිතියේ 118 වන ඡේදයට අනුව අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කළයුතු වේ එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 7,513 ක් ලෙස හඳුනාගෙන තිබූ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර තිබූ නමුත් එම අනුපාතය සංස්ථාව විසින් හෙලිදරව් කර නොතිබුණි

(ii) ප්‍රමිතියේ 29 වන වන ඡේදය අනුව බලපත්‍ර අලුත් කිරීම හා නඩත්තු වියදම් ප්‍රාග්ධනිත කළ නොහැකි වුවද, සංස්ථාව විසින් SAP මෘදුකාංගය සඳහා මිලදී ගත් බලපත්‍ර 55 ක් අලුත් කිරීමේ වියදම් වූ රු. මිලියන 1.09 ක් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුම් යටතේ ඇතුළත් කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුම් හා වර්ෂයේ රඳවා ගත් ඉපයුම් ගිණුම් එම අගයෙන් අඩි ගණනය වී තිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පිරිවැය රු. මිලියන 160.30 ක ආයෝජන දේපල දෙකක සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි. එමෙන්ම, සංස්ථාව දිගුකාලීන කුළී පදනම් මත බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබුණු රු.මිලියන 9.41 ක් පිරිවැය වූ ගොඩනැගිලි 3 ක්, ආයෝජිත දේපළ ලෙස හඳුනානොගෙන දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඒ) 1987 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වසර 30 ක් සඳහා බදු කුලී පදනම් මත ලබාදී තිබූ කොල්ලුපිටියේ 22 වන පටුමගේ පිහිටි සසකාවා ශ්‍රී ලංකා ජපාන අනුස්මරණ ශාලාවේ බදු ගිවිසුම් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ නමුත් ගොඩනැගිල්ල ආපසු භාර දී නොතිබුණු අතර නැවත තක්සේරු කර දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹීමටද 2023 මාර්තු 31 වන විටත් කටයුතු කර නොතිබුණි. තවද, පැවති කොන්දේසි මත හෝ වාර්ෂික බදුකුලී අයකිරීමට 2017 වර්ෂයෙන් පසු කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම වශයෙන් රු. මිලියන 0.27 ක් පමණක් හඳුනාගෙන තිබූ අතර සංස්ථාව විසින් බදු කුලීකරු වෙත යවන ලද ලිපිය අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු බදු කුලී ආදායම රු. මිලියන 5.93 කින් ඌන ගණනය වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඔ) නිදහස් රදවා ගැනීමේ පදනම් මත (Free Hold Basis) රජය විසින් සංස්ථාවට ලබාදී තිබූ මුතුරාජවෙල පිහිටි අක්කර 02 ක් පමණ වූ ඉඩම් 2019 ඔක්තෝබර් 29 දිනැති

අංක අමප/19/2832/16/11 අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2019 මාර්තු මාසයේදී විකුණා තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය ඉඩමේ විකුණුම් වටිනාකමින් ඒ සඳහා දැරූ සංවර්ධනය කිරීමේ වියදම් අයකර ගෙන ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙසට සංස්ථාවට දන්වා තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 17 දින ඉඩම් විකුණා රු. මිලියන 272.62 ක් ලබාගෙන තිබූ නමුත් දැරූ සංවර්ධන වියදම් වූ රු. මිලියන 21.02 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු රු. මිලියන 251.60 ක් 2023 පෙබරවාරි දක්වාම ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබූ අතර එම වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණු අතර මේ පිළිබඳව හෙළිදරව් කිරීමක් ඉහ් කර නොතිබුණි.

(ඔ) නියැදි විගණන පරීක්ෂාවකට අනුව උපචිත පදනම් මත කුලී ආදායම් ගිණුම්ගත කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාළව අවස්ථා 07 කදී කුලී ආදායම් රු. මිලියන 1.31 ක් අඩුවෙන් හා අවස්ථා 10 කදී රු. මිලියන 4.74 ක් වැඩියෙන් ගිණුම් ගත කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම් රු. මිලියන 3.43 කින් අධිගණනය වී තිබුණි.

(ක) සී/ස එල්ආර්සීසි සේවා පෞද්ගලික සමාගම් වෙත බදු පදනම් මත ලබාදී තිබූ සංස්ථාවට අයත් කිරිමණ්ඩල මාවත පිහිටි ගොඩනැගිල්ල සඳහා 2022 පෙබරවාරි 25 දිනැති රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව පදනම් කරගෙන මාසික බදු කුලී වටිනාකම් රු.මිලියන 0.25 ක් වශයෙන් තීරණය කර තිබූ අතර ඒ අනුව 2019 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි කුලී අයකර ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව වාර්ෂික බදු කුලී ආදායම් රු. මිලියන 3 ක් වුවද සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම් වශයෙන් රු. මිලියන 0.24 ක් පමණක් හඳුනා ගැනීම් හේතුවෙන් වර්ෂයේ බදු කුලී ආදායම් රු. මිලියන 2.76 කින් ද 2019 හා 2020 වර්ෂවල බදුකුලී ආදායම් හඳුනාගෙන නොතිබීම් හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ලාභය රු. මිලියන 5.52 කින්ද ඌණ ගණනය වී තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයට අදාළ නොවන දැන්වීම් පුවරු ආදායම් රු. මිලියන 2.24 ක් ආදායමට හඳුනා ගැනීම් හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඩ) සංස්ථාව විසින් බෙරේ වැවේ රොන් මඩ ඉවත් කිරීම සඳහා 2019 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.මිලියන 398.25 ක් වූ යන්ත්‍ර 3 ක වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඡ) සංස්ථාව විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත පමණක් එකතුව රු.මිලියන 81.50 ක් සමාලෝචිත වර්ෂයේදී බොල් ණය ලෙස ලාභයට එරෙහිව කපාහැර තිබුණි. 2022

මාර්තු 18 දිනැති අංක MRW 5461 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත නාගරික සංවර්ධන අධිකාරියේ සාලමුල්ල නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද රු. මිලියන 34.13 ක්ද 2021 ඔක්තෝබර් 15 දිනැති MRW 5404 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ඩී.ඒ.රාජපක්ෂ අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදලින් රු. මිලියන 47.37 ක්ද ලෙස මෙම බොල් ණය සමත්විත වී තිබුණි. තවද මෙම බොල් ණය හඳුනාගැනීමට පෙර මෙම ණය ඇතිවීමට හේතුවූ කරුණු, වගකිව යුතු නිලධාරීන් නිශ්චය කිරීමට විධිමත් පරීක්ෂාවන් කළ බවට හෝ ඉදිරියේදී මේ පාඩු පිළිබඳ පරීක්ෂාවන් සිදුකල යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට ගත් බවට තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් හෝ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් හෙළිදරව් නොවුණි. මේ අනුව සංස්ථාව විසින් මෙම පාඩු පිළිබඳ කටයුතු කිරීමේදී විධිමත් ආකාරයෙන් කටයුතුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ට) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් සංස්ථාවට ලැබිය යුතු ලෙස රු.මිලියන 268.89 ක් දක්වා තිබුණද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. මිලියන 328.89 ක් ලෙස දක්වා තිබීමෙන් ඒ අතර රු.මිලියන 60ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම එම සමාගම වෙත ගෙවිය යුතු ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 83.56 ක් දක්වා තිබුණද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සංස්ථාවෙන් ලැබිය යුතු ලෙස රු.මිලියන 93.40 ක් දක්වා තිබූ බැවින් ඒ අතර රු.මිලියන 9.84 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේවුවද. මෙම වෙනස්කම් සඳහා හේතු වූ කරුණු සංස්ථාව විසින් හඳුනාගෙන නොතිබුණි.

(ඩ) සංස්ථාව විසින් SAP මෘදුකාංගය භාවිතා කිරීම 2019 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණද එම මෘදුකාංගය මිලදි ගැනීමේ වියදම් වූ රු. මිලියන 12.4 ක් 2021 දෙසැම්බර් 31 දින දක්වාම කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබූ අතර, අස්පෘශ්‍ය වත්කම් ලෙස ප්‍රාග්ධනීත කර ඊට අදාළ ලියා හැරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර වසර 5 ½ කට ආසන්න කාලයක් ගතවී තිබූ නමුත් විධිමත් කොන්දේසි සහිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපියට අනුව මූලික කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 4.6 ක් වුවද තත්‍ය වියදම් රු මිලියන 12.4 ක් දක්වා වැඩිවී ඇතිබවද නිරීක්ෂණය විය.

ගිණුම්කරණ මූලිකාංග අනුව ආයතනයක් විසින් වර්ෂයකට අදාළව උත්පාදනය කරනු ලබන ආදායම් සහ වැය කරනු ලබන වියදම් සමාලෝචිත වර්ෂයට අදාළව ආදායම් ප්‍රකාශනයට ගැලපීමෙන් පසු ලැබෙන ශුද්ධ ලාභය/අලාභය රදවාගත් ඉපයුම් ගිණුමට මාරු කිරීමෙන් පසුව අදාළ ආදායම්/වියදම් ගිණුම් වල වටිනාකම් ශුන්‍ය

අගයන් ගනු ලබයි. එසේ වුවද, සංස්ථාව විසින් 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමෙන් පසුවද ගිණුම්කරණ මෘදුකාංගය තුළ වූ සියළු ආදායම් ගිණුම්වලට (45) අදාළ බැර ශේෂයන් හා හර ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 18,895.64 ක් හා මිලියන 1.25 ක්ද, විකුණුම් පිරිවැය ගිණුම්වලට (8) අදාළව රු.මිලියන 8,329.74 ක හර ශේෂයක්ද එසේම වියදම් ගිණුම්වලට (122) අදාළ හර ශේෂයන් හා බැර ශේෂයන්ද පිළිවෙලින් රු. මිලියන 8,180.26 ක් හා රු. මිලියන 1,663.28 ක්ද වූ සමුච්චිත ශේෂ ආරම්භක ශේෂ ලෙස ලෙජරයේ දක්වා තිබුණි. මේ නිසා වර්ෂයේ ශේෂ පිරික්සුම් එක් වරකදී ලබා ගත නොහැකි වූ අතර වත්කම් වගකීම් හිමිකම් වෙනම් ශේෂ පිරික්සුමක් ලෙස හා ආදායම් වියදම් වෙනම් ශේෂ පිරික්සුමක් ලෙස ලබා ගැනීමට සිදු විය. තවද ස්ථාවර වත්කම් ලේඛනය වෙනම් අතින් පවත්වාගෙන ගොස් තිබූ අතර ඒ අනුව පිරිවැය රු. මිලියන 4,177.94 ක් වූ වත්කම් ඒකක 9,272 ක් පවත්නා බව නිරීක්ෂණය වූ නමුත්, නව ගිණුම්කරණ මෘදුකාංගය (SAP) තුළට විස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛණය ඇතුළත් කර නොතිබුණි. මේ නිසා ගිණුම්කරණ මෘදුකාංගය සංස්ථාවේ මූලික ගිණුම්කරණ අවශ්‍යතාවයන් සපිරෙන පරිදි සකස්කරගෙන නොමැතිබව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම් වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම් සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනී හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

		ඌනතා සහ රු.මිලියන 1.26 ක් අතිරික්තතා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(ආ)	2019 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වක්‍රලේඛ අංක 08/2019	2020 වසරේ සිට භාණ්ඩ, වැඩ, උපදේශන සේවා හෝ උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය කිරීමට සැලසුම් කර ඇති සියළුම රාජ්‍ය ආයතන 2020 ජනවාරි 31 දිනට පෙර ප්‍රසම්පාදන ආයතනයක් (PE) ලෙස ජාතික e-GP පද්ධතිය සමඟ ලියාපදිංචි කළ යුතු වුවත් 2023 පෙබරවාරි 07 දින වන විටත් ඒ අනුව සම්බන්ධතා නිලධාරීන් ලියාපදිංචි කිරීම (Registration of Liaison Officers – LOS), විකුණුම්කරුවන් ලියාපදිංචි කිරීම (Registration of Venders) , වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම , ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රකාශයට පත් කිරීම සහ වෙළඳ පල මිල සැඳහුම් ක්‍රමය සඳහා (Shopping Method) ඉලෙක්ට්‍රොනික් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.
(ඇ)	1994 ජුනි 14 දිනැති අංක පීඊ1/ 54/1 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වක්‍රලේඛයේ 02 වගන්තිය	වක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සේවකයින්ට ලබාදීමට හැකිවේ. එසේවුවද භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමතින් තොරව සංස්ථාවේ නිලධාරීන් 12 දෙනෙකු විසින් මෝටර් රථ ලබා ගැනීම සඳහා බැංකුවලින් ලබා ගෙන තිබූ ණය මුදල්වල සමාලෝචිත වර්ෂයට අදාල පොළියෙන්, 2/3 ක කොටසක් එනම් රු.608,929 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා නිබුණි.
(ඇ) (i)	2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක පීඊඩී/12	වක්‍රලේඛයේ 6.6 ඡේදය ප්‍රකාරව සංස්ථාව විසින් 2021 වර්ෂයට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත්කළ යුතු වුවත් මාස 10 කට වඩා පමාවී එනම් 2022 දෙසැම්බර් 20 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

		එමෙන්ම චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද සංස්ථාව විසින් 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(ii)	4.2.6 වගන්තිය	සංස්ථාවේ කාර්තුමය ප්‍රගති වාර්තා අදාළ කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුළත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය සහ කාර්යයන්	නිරීක්ෂණ
(අ)	1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත	
	2 (ආ) 1 වගන්තිය	දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම සංස්ථාව විසින් කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව විසින් පළාත් 06 ක පමනක් එබඳු ඉඩම් හඳුනාගෙන ගැසට් නිවේදන නිකුත් කර තිබුණි. තවද, මායිම් ගැසට් කර තිබුණු ඉඩම්වල සිදු කරන අනවසර ගොඩකිරීම් හා අනවසර පදිංචිවීම් වැළැක්වීමටද සංස්ථාව අපොහොසත් වී තිබුණු බවද නිරීක්ෂණය විය.
	8 (අ) වගන්තිය	ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, සංස්ථාව විසින් ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත, වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු

		වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, නියැදි පරීක්ෂාවකදී හඳුනාගත් පරිදි, සංස්ථාව විසින් 1995 වර්ෂයේදී මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා එලෙස පවරාගෙන තිබූ ඉඩම් අක්කර 800 කින් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 25 ක පමණ කාලයක් ගතව තිබුණද වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 400 ක් එනම්, සියයට 50 ක් පමණක් වී තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2010 ජූලි 14 දිනැතිව නිකුත් කරන ලද අංක 1662/17 දරණ ගැසට් නිවේදනය	මෙම ගැසට් නිවේදනයට අනුව සංස්ථාව විසින් බස්නාහිර පළාත තුළ පිහිටි සියලුම ඇල මාර්ගවල රක්ෂිත ඉඩම් (Reservation) ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට උක්ත ගැසට් පත්‍රය නිකුත් කර වර්ෂ 10 ක් ගත වුවද එම රක්ෂිත ඉඩම් හඳුනාගැනීමට හෝ රක්ෂිත ඉඩම්වල පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සාධනීය පියවර ගෙන නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) මුහුදු වැලි තොගවල යළි ඇනවුම් මට්ටම (Re- order Level) ගණනය කර කාලීනව මුහුදු වැලි රැස්කර තබා නොගැනීම හේතුවෙන් මුහුදු වැලි තොග නිහ වීම නිසා 2011 වර්ෂයේදී සංස්ථාවට අවශ්‍ය මුහුදු වැලි ලබා ගැනීමට මුතුරාජවෙල ප්‍රදේශයේ ලංකා විදුලි බල මණ්ඩලය වෙත සංස්ථාව විසින් වැලි දමා ගොඩකර විකුණන ලද ඉඩමකින් රු. මිලියන 351.13 ක් වටිනාකමකින් යුතු මුහුදු වැලි කපා ඉවත් කර ගෙන තිබුණි. වර්ෂ 6 කටත් අධික කාලයක සිට මෙම ඉඩම නැවත පිරවීමට, සංස්ථාව කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී 2018 හා 2019 වර්ෂවලදී සංස්ථාව සතු වැලිදමා ගොඩකරන ලද ඉඩම්වලින් පිළිවෙලින් රු.මිලියන 183.68 ක් හා රු. මිලියන 23.19 ක් වටිනා වැලි තොග කපා ඉවත් කර ගෙන තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඉඩම් නැවත පිරවීම සඳහා අවශ්‍ය වැලි වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 557.99 ක් වෙන් කර තිබුණද මෙම එකදු ඉඩමක් හෝ නැවත යථා තත්ත්වයට පත්කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ අතුරුගිරිය කොතලාවල අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛීය උද්‍යානයක් ඉදිකිරීම සහ ජලාපවහන වැඩි දියුණු

කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සෞභාග්‍යයේ දැක්ම වැඩ පිළිවෙළ යටතේ ක්‍රියාත්මක කර තිබූ අතර ආරම්භ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන සලසා ගැනීමක් සිදු කර නොතිබුණි. එමෙන්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා සංස්ථාව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් පරිදි ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ව්‍යාපෘති යෝජනාව සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබුණු අතර 2022 සැප්තැම්බර් වන විට සංස්ථාවේ අරමුදල්වලින් රු. මිලියන 213.95 ක් මේ සඳහා වැය කර තිබුණි. ඉන් කිසිදු මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට සිදු කර තිබූ වැඩවල වටිනාකම රු. මිලියන 129.33 ක් කෙරිගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

එසේම ඉදි කරන ලද උද්‍යානය නඩත්තු කර පවත්වාගෙන යාම කඩුවෙල මහ නගර සභාවට පැවරීමට සංස්ථාව අපොහොසත් වීම හේතුවෙන් මාසිකව රු.මිලියනයක් පමණ නඩත්තුව සඳහා වැය කිරීමටද සංස්ථාවට සිදුවී තිබුණි. ඇවිදීමේ මංතීරුව හා ඒ අවට ජල ගැලීම වලින් ගංවතුර තත්ත්වයන්ටද ලක්වී තිබූ අතර එම ස්ථානයේ ඉදිකර තිබූ වැසිකිලි පද්ධතිය සඳහා නිසි ජල සැපයුමක් නොමැති වීම හේතුවෙන් එම වැසිකිලි පද්ධතිය වසා දමා තිබුණි.

(ඇ) බදු ගිවිසුම් පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව වසර 01 සිට 12 දක්වා කාල පරාසයන් තුළ වලංගු බදු ගිවිසුම් අවසන් වූ සේවාදායකයන් 08 දෙනෙකු නවදුරටත් එම බදු දේපල භාවිතා කරමින් පැවතියද නව බදු ගිවිසුම්වලට එළඹීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඈ) 1981 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සංස්ථාව විසින් පවරා ගෙන තිබූ ඉඩම්වලට අදාල වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 47.11 ක් ද ඊට අදාළව ගෙවිය යුතු පොළිය රු. මිලියන 112.63 ක් ද වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ පොළිය රු. මිලියන 3.34 ක් වී තිබුණි. මෙම ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවුරුදු 14 සිට අවුරුදු 39 දක්වා කාල පරාසයන් තුළ සිදුකරමින් පැවති අතර මෙම ප්‍රමාදය හේතුවෙන් අදාල ඉඩම්වල අනවසර පදිංචිවීම් වැඩි වී තිබූ බවද අනාවරණය විය. එසේවුවද, ඉඩම් හිමිකම් නිරවුල් කර ගැනීම සඳහා සංස්ථාව විසින් අදාළ ප්‍රාදේශිය ලේකම්වරු, තක්සේරු දෙපාර්තමේන්තුව සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුව වැනි ආයතන සම්බන්ධ කරගෙන සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ඉඩම් සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණු බවද අනාවරණය විය.

(ඉ) සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි අක්කර 22 රූඩ් 02 හා පර්චස් 37.14 ක් වූ බිම් කොටසක් හා වර්ග අඩි 55900 ක ගොඩනැගිල්ලක් රු. මිලියන 2,195.79 ක බදු මුදලකට වසර 50 ක දිගු කාලීන බදු පදනම් මත පෞද්ගලික සමාගමකට ලබා දීමට 2021 ජූනි 02 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු.මිලියන 500 ක් ලබා ගෙන තිබූ නමුත්, ඉතිරි රු. මිලියන 1,695.79 ක මුදල ලබා ගැනීමට හා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට 2023 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාවේ තෙත් බිම් කළමණාකරන අංශය විසින් 2018 ජනවාරි 05 දින ඉදිකිරීම් ආරම්භ කරන ලද කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමණාකරන උද්‍යානයේ කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ යෝජිත කොම්පෝස්ට් නිෂ්පාදන කම්හලේ තෙවන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව අනුව රු.මිලියන 75.80 වැය කර පයිලින් වැඩ පමණක් සිදුකර තිබුණි. ඉතිරි ඉදිකිරීම් 2022 දෙසැම්බර් වන විටත් සැලසුම් කළ අකාරයට සිදු කර නොතිබුණි.

(උ) කැළණිය, බියගම, වත්තල සහ පැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ සිදුවන ජල ගැලීම් වලින් එම ප්‍රදේශවල පදිංචි 155,000 පමණ ජනතාවට සහ කර්මාන්තශාලාවලට සිදුවන ආරක්ෂක, පාරිසරික සහ සමාජීය හානි අවම කිරීමේ අරමුණින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,000 ක් වූ මුදුන් ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය 2021 වසර අවසාන වන විට නිම කිරීමට නියමිතව පැවතුණද එදිනට ව්‍යාපෘතියෙහි මූල්‍ය සහ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 61 ක් හා 62 ක් පමණක් වී තිබුණි.

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම් හේතුවෙන් නිවාස අහිමි වූවන්ට නාගරික සංවර්ධන අධිකාරිය ඉදිකළ නිවාස 164 ක් ලබා ගැනීමට රු. මිලියන 600 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවුල් 19 සඳහා නිවාස ලබාදී නොතිබුණි.

තවද, මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වසර අවසාන වන විට නිම කිරීමේ අපේක්ෂාවෙන් ජල පොම්පාගාර 02 ක් අදියර I සහ II වශයෙන් ඔලියමුල්ල ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිතව තිබූ අතර එයින් අදියර II ජලපොම්පාගාරයේ ඉදිකිරීම් කටයුතු 2018 මාර්තු 26 දින ආරම්භ කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබූ අතර ඒ හේතුවෙන් 2018 අගෝස්තු මාසයේදී රු. මිලියන 83.40 කට මිලදී ගෙන තිබූ $5M^3/S$ ජල පොම්ප දෙක නිශ්කාර්යව පැවතුණි.

කෙටුම්පත් විගණන වාර්තාව සඳහා 2023 අප්‍රේල් 10 දිනැතිව සභාපතිවරියා විසින් මා වෙත ලබා දෙන ලද පිළිතුර අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන හිඟ වීම මෙම ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයට හේතු වී තිබුණි.

(ඌ) සංස්ථාව විසින් 1996 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව ජල රැඳවුම් ප්‍රදේශ 9 ක් තුළ හෙක්ටයාර 400 ක සිදුකර තිබූ අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 1,104 ක් ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් එම හඳුනාගත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(එ) රු.මිලියන 800 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත රෙන් මඩ ඉවත් කර බෙරේ වැව පිරිසිදු කිරීම සඳහා වූ ව්‍යාපෘතියෙහි වැඩ 2019 වර්ෂයේදී ආරම්භ කර 2019 වර්ෂයේදීම අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලබා තිබූ ප්‍රගතිය සියයට 21ක් වැනි පහල මට්ටමක පැවතුණි. මෙම ව්‍යාපෘතියට අවශ්‍ය යන්ත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා රු. මිලියන 283.50 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද එම සීමාව ඉක්මවා නැවත අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 අගෝස්තු මාසයේදී රු. මිලියන 403.99 ක් වටිනා යන්ත්‍ර 3 ක් මිලදී ගෙන තිබුණි. මෙයින් රු. මිලියන 244.7 ක් හා රු. මිලියන 75.99 ක් වැය කර මිලදී ගෙන තිබූ යන්ත්‍ර දෙක 2023 මාර්තු 31 වන විටත් නිෂ්කාර්යව පැවතුණි. එම යන්ත්‍ර සඳහා වාරික වශයෙන් රු.මිලියන 169.61 ක් 2021 වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩලය අනුමත සීමාව ඉක්මවා මිලදී ගැනීම් සිදුකිරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් සිදුකරමින් පවතුණි. තවද, මෙයින් එක් යන්ත්‍රයක් වූ භූ ජලවර යන්ත්‍රය සඳහා සංස්ථා මුදලින් රු.මිලියන 82.46 ක් හා සැපයුම්කරු සමඟ ඇතිකර ගෙන තිබූ සමථ කොන්දේසි අනුව ගෙවීම් ප්‍රමාද කිරීම සඳහා පොළිය වශයෙන් රු. මිලියන 11.73 ක්ද ගෙවීමට සිදුවී තිබුණි.

(ඒ) බෙල්ලන්විල පන්සල අසල පවතින සංස්ථාව සතු වෙළඳ කුටි 06 ක් 2016 වර්ෂයේ සිට 2023 පෙබරවාරි 28 දින දක්වාම කුලී පදනම මත ලබා දීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 7.2 ක් හා 2016 සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 108.45ක් වශයෙන් සංස්ථාවට උපයාගතහැකිව තිබූ ආදායම රු.මිලියන 115.65ක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඔ) ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 41.44 ක්වූ කෙරවලපිටිය ප්‍රදේශයේ අපවහන මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 18.02 ක ඝවලීය අත්තිකාරම් මුදලක් 2018 පෙබරවාරි 05 දින මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබා ගෙන තිබුණි. 2018 මැයි 28 දින වන විට රු. මිලියන 15.60 ක

බිල්පත් ඉදිරිපත් කර තිබූ අතර එයින් පූර්ව අත්තිකාරම් මුදල් ලෙස රු. මිලියන 6.22 ක් අඩුකර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ඉටු කිරීම සඳහා අපේක්ෂා කළ පරිදි කොන්ත්‍රාත් ප්‍රදානකරු වන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිවාස ඉවත් කර නොදීම හේතුවෙන් සංස්ථාවට උක්ත ව්‍යාපෘතිය අතරමග අතහැර දැමීමට සිදුවී තිබූ අතර අපවහන ඇල මාර්ග අවහිර වී තිබීම හේතුවෙන් වැසි දිනවල ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් ඇතිවීමටද හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

(ඕ) ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 8,700 ක් වූ කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය පසුව අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර වසර 05 කින් නිමකළ යුතු වුවත් 2021 වර්ෂය අවසාන වන විට රු.මිලියන 482.57 ක් වැයකර කි.මී. 4.1 කින් යුත් පස්සැන්න ඇළ මාර්ගයට සම්බන්ධ වන මීටර් 450 කින් යුත් අතුරු ඇළ මාර්ගයේ වැඩි දියුණු කිරීමේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. සැලැසුම් කළ පරිදි භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 6 ක තරම් ඉතා අඩු ප්‍රතිශතයක් විය.

(ක) මාදින්නාගොඩ නිවාස ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් සඳහා රු.මිලියන 112 ක් වැය කර අතුරු ප්‍රවේශ මාර්ගයක් 2018 වර්ෂය වන විට ඉදිකිරීමට කටයුතු කර තිබූ නමුත් 2023 පෙබරවාරි 28 දින දක්වා ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) සංස්ථාව විසින් 2019, 2020 සහ 2021 යන වර්ෂවල වැඩ ආරම්භ කරන ලද හා සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික ප්‍රගතිය සියයට 67 ත් 97 ත් අතර පරාසයක පැවති උපදේශන සේවා කොන්ත්‍රාත් 5 කට අදාළව ඉදිරිපත් කර තිබූ බිල්පත් වටිනාකම රු. මිලියන 17.97 සඳහා කිසිදු අයකිරීමක් සිදුකර නොතිබුණි. සේවායෝජක ආයතන සමඟ කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ නොතිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ අතර සේවායෝජකයින් විසින් බිල්පත් සඳහා ගෙවීම් නොකළද උපදේශන සේවා කාර්යයන් නොනවත්වා ඉටු කිරීමට සංස්ථාව විසින් කටයුතු කර තිබුණි. තවද 2017 සහ 2021 වර්ෂවලදී රු. මිලියන 6.03 ක් වැය කර සංස්ථාව විසින් සේවායෝජක ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමකින් තොරව ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් 2ක බිල්පත් 2023 ජනවාරි වන විට අදාළ ආයතන වලට ඉදිරිපත් කර තිබූ නමුත් එම බිල්පත් සහතික කර නොතිබුණි.

(ව) ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම වාණිජ ව්‍යාපෘතියක් ලෙස මුහුදු වැලි අසුරුම් කර විකිණීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ යුතු බවට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 4 දින තීරණය කර තිබුණු අතර ඒ සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීමට සංස්ථාව විසින් රු. මිලියන 200 ක ණය මුදලක් සමාගම වෙත 2019 මැයි 07 දින ලබාදී තිබුණි. අදාළ ඉදිකිරීම් සිදු කිරීම සඳහා සංස්ථාව සතු ඉඩමක් දෙපාර්ශවය අතර බදු ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව සමාගම වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට විධිමත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව සංස්ථාව විසින් තීරණය කර තිබූ අතර ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම විසින් රු.මිලියන 331.02 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ල රජයේ තක්සේරුව මත රු.මිලියන 326.30 කට සංස්ථාව වෙත පවරාගෙන එය රාජ්‍ය සමාගමක් වන ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගමට ලබා දී තිබුණි.

සංස්ථාව විසින් සමාගමට ලබාදුන් ණය මුදල සඳහා සියයට 12 ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ මාසිකව රු. මිලියන 1.67 ක් බැගින් වර්ෂ 10 කින් ණය ආපසු ගෙවීමේ පදනම මත සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපාරය අතරමඟ නවතා දැමීම හේතුවෙන් ණය හා පොළිය ගෙවීමට සමාගම අපොහොසත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම විසින් තවදුරටත් ගෙවිය යුතු ණය මුදල රු. මිලියන 141.2 ක් සහ ගෙවිය යුතු පොළිය රු.මිලියන 49.46 ක් වූයෙන් සංස්ථාවට ලැබිය යුතු මුළු වට්නාකම රු. මිලියන 190.70 ක් විය. තවද, පරිපාලිත සමාගමේ ගිණුම් අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් සමාගම විසින් වැයකර තිබූ මුදල රු.මිලියන 382.50 ක් වී තිබුණි. සංස්ථාව විසින් වරින් වර ගෙන තිබූ අවධිමත් තීරණ හේතුවෙන් සමාගමේ මෙහෙයුම් කටයුතුවලට අයහපත් බලපෑමක් හා මූල්‍යමය අවාසිදායක තත්වයක් සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

(ඡ) සංස්ථාවෙහි බදු ඉඩම් උකස් කිරීමේ ප්‍රතිපත්තිය අනුව, බදු ගිවිසුම් අත්සන් කිරීමෙන් වර්ෂ 05 ක් ගත වූ පසු උකස් කිරීම සඳහා සලකා බැලිය යුතු අතර ඉඩම් ඇපයට තැබීමට පෙර සංස්ථාවේ සභාපතිගේ ලිඛිත කැමැත්ත ලබාගත යුතුය. කෙසේ වුවද එම කොන්දේසි සපුරා නොතිබියදී සංස්ථාව විසින් බදු පදනම මත ලබාදී තිබූ මුතුරාජවෙල පිහිටි අක්කර 09 පර්චස් 36.57 ක ඉඩම් 02 ක් හා අක්කර 04 රූඩ් 02 පර්චස් 11 ක ඉඩමක් පෞද්ගලික බැංකුවක් වෙත පිළිවෙලින් රු. බිලියන 4.5 කට සහ රු.මිලියන 600 කට උකස් කිරීම සඳහා බදුකරුවන් වෙත සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මෙය සංස්ථාවේ පවත්නා ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය විය.

(ට) ගම්පහ තෙත්බිම් උද්‍යානයේ සැලසුම් කිරීම හා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා නාගරික සංවර්ධන, ජලසම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය විසින් රු. මිලියන

24.45 ක සවලියකරණ අත්තිකාරමක් සංස්ථාව වෙත ලබාදී තිබූ අතර 2019 නොවැම්බර් මාසයේදී එම ව්‍යාපෘති කටයුතු වලින් කොටසක් පමණක් නිමකර ඉතිරි කටයුතු අතහැර දමා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ඉදි කිරීම් කටයුත්තක් සිදු කරනොතිබියදී උක්ත වැඩ පූර්ව අත්තිකාරම් (සවලීයකරණ අත්තිකාරම්) ගිණුමෙන් රු. මිලියන 5.05 ක් අඩු කිරීම් ගැටළු සහගත විය.

(ඩ) සංස්ථාව විසින් Waste to Wealth (Pvt) Ltd නමින් නව පරිපාලන සමාගමක් ආරම්භ කිරීමට 2019 නොවැම්බර් 04 දින රු.මිලියන 5ක මූලික ආයෝජනයක් සිදු කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ ජූනි 01 දින සමාගමේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබූ නමුත් ඒ විට සංස්ථාවට අයවිය යුතුව තිබූ රු.මිලියන 2.46 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ත) හොරණ බස් නැවතුම්පළ - දෙවන අදියර ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව සංස්ථාවට 2015 පෙබරවාරි 17 දිනට අය විය යුතු රු.මිලියන 5.53 ක වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට සංස්ථාව හොඳැකිව වී තිබුණු අතර ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම හේතුවෙන් සංස්ථාවට රු. මිලියන 12.35 ක අලාභයක් සිදුව තිබුණු බව ව්‍යාපෘතිය නතර කිරීම පිළිබඳව සංස්ථාව විසින් සකස් කර තිබූ පිරිවැය පිළිබඳ සාරාංශ වාර්තාව අනුව නිරීක්ෂණය විය.

(ද) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද කිරිමණ්ඩල මාවත කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියෙන් 2020 හා 2021 වර්ෂවල සංස්ථාවට සිදු වූ පාඩුව පිළිවෙලින් රු. මිලියන 7.16 ක් හා 6.81 ක් ලෙස වූ අතර ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව දරණ ලද මුළු පිරිවැය පිළිවෙලින් රු. මිලියන 7.73 ක් හා 10.75 ක් විය. 2020 වර්ෂයේ ඉන් රු.මිලියන 3.87 ක් හෙවත් සියයට 50.1 ක් ශ්‍රම පිරිවැය වූ අතර සමාලෝචිත වර්ෂයේ ශ්‍රම පිරිවැය රු. මිලියන 10.71 ක් හෙවත් සියයට 99.63 ක් වී තිබුණි. පිරිවැය කළමනාකරණය කර ගැනීම් පිළිබඳ සමාලෝචනයක් සිදුකර මෙම ව්‍යාපෘතිය ලාභදායීව පවත්වාගෙන යාම සඳහා සංස්ථාව විසින් කටයුතු නොතිබුණි.

3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,800 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,331 ක් විය. එමෙන්ම එදිනට සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හා අතිරික්ත පිළිවෙලින් 497 ක 28 ක් වූ අතර ප්‍රාථමික, ද්විතික හා මාණ්ඩලික මට්ටමේ පුරප්පාඩු පිළිවෙලින් 304, 161ක් හා 32ක් වූ අතර අතිරික්තතා පිළිවෙලින් 22 ක් 05 ක් හා එකක් විය.

(ආ) සංස්ථාව විසින් 2018 - 2022 වර්ෂ 05 ක කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංයුක්ත සැලැස්ම තුළ හඳුනාගත් උපාය මාර්ග ලභා කර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද හඳුන්වා දුන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) අනුව ළඟා කර ගත් ප්‍රගතිය ඇගයීමට ලක්කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් කොන්ත්‍රාත් ණයගිමි ශේෂය තුළ පැවති රු.මිලියන 826.68 ක වටිනාකමින් වර්ෂ 2 ත් 5ත් අතර කාලයක සිට නිරවුල් කර නොමැති ණය හිමි ශේෂය රු.මිලියන 201.10 ක් වූ අතර වර්ෂ 5 ට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොමැති ශේෂය රු. මිලියන 24.76 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ ණයගැති හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. මිලියන 1,559.82 ක වෙළඳ ණයගැති ශේෂ වටිනාකමින් වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට අයවීමට පැවති ශේෂය රු. මිලියන 695.63 ක් වූ අතර වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂය රු. මිලියන 128.87 ක් විය. එමෙන්ම සංස්ථාව විසින් විගණනය සඳහා කැඳවන ලද ණයගැති ශේෂ සනාථනයන්ගේ වටිනාකම රු. මිලියන 1,134.86 ක් වූ අතර ඉන් කිසිදු ණය ගැති ශේෂ සනාථනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

		සමූහය		සංස්ථාව	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2021**	**2020**	**2021**	**2020**
	සටහන	**රු. 000**	**රු 000**	**රු. 000**	**රු 000**
ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ආදායම	1	8,605,497	8,959,872	6,792,977	7,304,787
සෘජු පිරිවැය	2	(5,732,050)	(4,660,334)	(4,131,280)	(3,141,086)
දළ ලාභය		**2,873,447**	**4,299,538**	**2,661,697**	**4,163,701**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	104,757	94,212	93,983	76,643
දළ ලාභය සමඟ වෙනත් මෙහෙයුම් ආදායම්		**2,978,204**	**4,393,750**	**2,755,680**	**4,240,344**
පරිපාලන වියදම්		(1,459,847)	(1,319,807)	(1,298,918)	(1,143,593)
ක්‍රමක්ෂය		(342,899)	(403,414)	(318,257)	(379,632)
ප්‍රවර්ධන වියදම්		(7,270)	(2,539)	(6,527)	(1,533)
වෙනත් මෙහෙයුම් වියදම්		(196,864)	(289,191)	(196,864)	(289,191)
මෙහෙයුම්වලින් ලක් ලාභය	4	**971,324**	**2,378,799**	**935,114**	**2,426,395**
මූල්‍ය පිරිවැය	5	(267,923)	(529,534)	(263,682)	(526,750)
මූල්‍ය ආදායම	6	378,226	386,412	368,978	397,162
විලම්බිත ආදායම ක්ෂය කිරීම	16	222,586	203,982	222,586	203,982
බදු පෙර ලාභය		**1,304,213**	**2,439,659**	**1,262,996**	**2,500,789**
බදුකරණය	7	(263,761)	(12,054)	(239,825)	(4,974)
වර්ෂය සඳහා ලාභය		**1,040,452**	**2,427,605**	**1,023,171**	**2,495,815**
ආරෝපණය කළ ලාභය:					
මව් සමාගමේ සමකොටස් හිමිකම		1,036,996	2,441,247	1,023,171	2,495,815
පාලනය නොකරන පොලිය		3,456	(13,642)	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්					
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	18	19,735	(36,990)	5,634	(47,074)
දේපොල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය		33,973	-	-	-
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම්		**53,708**	**(36,990)**	**5,634**	**(47,074)**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**1,094,160**	**2,390,615**	**1,028,805**	**2,448,741**
ආරෝපණය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම :					
මව් සමාගමේ සමකොටස් හිමිකරුවන්		1,081,088	2,402,240	1,028,805	2,448,741
පාලනය නොකරන පොලිය		13,072	(11,625)	-	-

පිටු අංක 108 සිට 124 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		සමූහය		සංස්ථාව	
දෙසැම්බර් 31 වැනි දිනට		**2021**	**2020**	**2021**	**2020**
	සටහන	**රු. 000**	**රු.000**	**රු. 000**	**රු.000**
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත සහ උපකරණ	8	2,354,352	2,535,648	2,237,181	2,099,137
අස්පෘශ්‍ය වත්කම්	9	2,452	1,983	2,286	1,607
දේපල ආයෝජන	10	2,563,493	2,309,545	2,563,493	2,309,545
අනුබද්ධිත ආයතනවල ආයෝජන	11	-	-	2,000	2,000
අනුබද්ධිත ආයතනවලට දුන් ණය	14	-	-	141,233	186,666
විලම්බිත බදු වත්කම්		41,467	137,348	-	94,554
		4,961,764	**4,984,524**	**4,946,193**	**4,693,509**
ජංගම වත්කම්					
තොගය	12	2,861,200	3,106,960	2,742,751	3,031,186
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	13	5,218,110	5,817,270	4,417,284	5,308,395
අයකර ගතයුතු බදුකරණය		5,362	78,495	-	73,133
අනුබද්ධිත ආයතනවලට දුන් ණය	14	-	-	24,000	37,334
කල්පිරීම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය		3,869,781	3,723,449	3,680,002	3,544,358
මුදල් හා මුදල්වලට සමාන දේ	15	3,762,438	4,082,409	3,672,166	3,975,252
		15,716,891	**16,808,583**	**14,536,203**	**15,969,658**
මුළු වත්කම්		**20,678,655**	**21,793,107**	**19,482,396**	**20,663,167**
සමකොටස් හා බැරකම්					
ප්‍රාග්ධන හා සංචිත					
දායක ප්‍රාග්ධනය		1,000	1,000	1,000	1,000
ප්‍රාග්ධන සංචිත		13,461	13,461	13,461	13,461
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		258,690	231,512	212,430	212,430
රඳවාගත් ඉපැයීම්		10,319,711	9,265,800	10,077,786	9,048,981
කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල්		95,143	81,518	95,143	81,518
සුළු කොටස් හිමි අයිතිය		72,546	59,475	-	-
මුළු ප්‍රාග්ධන සංචිත		**10,760,551**	**9,652,766**	**10,399,820**	**9,357,390**
ජංගම නොවන බැරකම්					
අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි		209,063	205,722	209,063	205,722
විලම්බිත බදුකරණ බැරකම		137,038	241,935	137,038	241,935
විලම්බිත ආදායම	16	439,877	598,246	439,877	598,246
පොලියක් දරන ණය සහ ලබා ගැනීම්	17	1,601,154	2,804,016	1,601,154	2,796,235
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	18	509,520	490,984	337,071	337,693
		2,896,652	**4,340,903**	**2,724,203**	**4,179,831**
ජංගම බැරකම්					
පොලියක් දරන ණය සහ ලබා ගැනීම්	17	274,608	907,257	266,859	899,475
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	19	2,168,141	2,260,675	1,666,523	1,635,950
ගෙවිය යුතු බදුකරණය		185,771	29,968	139,360	-
ඉඩම් ගොඩකිරීම සඳහා ප්‍රතිපාදන		557,993	557,993	557,993	557,993
ගෙවිය යුතු ලාභාංශ		910	910	-	-
ලැබූ අත්තිකාරම්	20	3,817,032	4,032,528	3,727,638	4,032,528
බැංකු අයිරා	15	16,997	10,107	-	-
		7,021,452	**7,799,438**	**6,358,373**	**7,125,946**
මුළු බැරකම්		**9,918,104**	**12,140,341**	**9,082,576**	**11,305,777**
මුළු සමකොටස් සහ බැරකම්		**20,678,655**	**21,793,107**	**19,482,396**	**20,663,167**

පිටු අංක 108 සිට 124 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

ජේ.ඒ.පී.කේ. ජයසිංහ
නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මුදල්)

ඉංජි. ශ්‍රීමතී සේනාධීර
සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සහ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුමත කර සහ අත්සන් කරන ලද්දේ:

ඉංජි. හිරාන් බාලසූරිය
කොමදෝරු
සභාපති
2022 දෙසැම්බර් 14

ඉංජි. නිහාල් සිරිවර්ධන
අධ්‍යක්ෂ

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

විස්තරය	දායක ප්‍රාග්ධනය රු'000	ප්‍රාග්ධන සංචිත රු'000	වක්කම් ප්‍රත්‍යාගණන සංචිත රු'000	රඳවාගත් ඉපැයීම් රු'000	කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල් රු'000	පාලනය නොකරන පොලිය රු'000	එකතුව රු.000
2019.12.31 දිනට ශේෂය (මුලින් වාර්තා කළ පරිදි)	**1,000**	**13,461**	**230,787**	**6,839,961**	**69,728**	**71,100**	**7,226,037**
පෙර වර්ෂ සඳහා ගැලපීම්	-	-	725	23,599	-	-	24,324
2019.12.31 දිනට ශේෂය (ගැලපුම් කරන ලද)	**1,000**	**13,461**	**231,512**	**6,863,560**	**69,728**	**71,100**	**7,250,361**
2020 වර්ෂය සඳහා ලාභය/(අලාභය)	-	-	-	2,441,247	-	(13,642)	2,427,605
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	-	-	-	(39,007)	-	2,017	(36,990)
කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල් සඳහා ප්‍රතිපාදන	-	-	-	-	11,790	-	11,790
2020.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**231,512**	**9,265,800**	**81,518**	**59,475**	**9,652,766**
දේපල, පිරියක හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය	**-**	**-**	27,178	-	-	6,795	33,973
2021 වර්ෂය සඳහා ලාභය/(අලාභය)	**-**	**-**	-	1,036,996	-	3,456	1,040,452
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	**-**	**-**	-	16,915	-	2,820	19,735
කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල් සඳහා දායකත්වය	**-**	**-**	**-**	**-**	13,625	-	13,625
2021.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**258,690**	**10,319,711**	**95,143**	**72,546**	**10,760,551**

සංස්ථාව

	දායක ප්‍රාග්ධනය රු.000	ප්‍රාග්ධන සංචිත රු.000	වක්කම් ප්‍රත්‍යාගණන රු.000	රඳවාගත් ඉපැයීම් රු.000	කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල් රු.000	එකතුව රු.000
2019.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**212,430**	**6,600,240**	**69,728**	**6,896,859**
2020 වර්ෂය සඳහා ලාභය/(අලාභය)	-	-	-	2,495,815	-	2,495,815
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	-	-	-	(47,074)	-	(47,074)
කාර්ය මණ්ඩල අරමුදල් සඳහා දායකත්වය	-	-	-	-	11,790	11,790
2020.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**212,430**	**9,048,981**	**81,518**	**9,357,390**
2021 වර්ෂය සඳහා ලාභය/(අලාභය)	**-**	**-**	**-**	1,023,171	-	1,023,171
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	**-**	**-**	**-**	5,634	-	5,634
කාර්ය මණ්ඩල අරමුදල් සඳහා දායකත්වය	**-**	**-**	**-**	-	13,625	13,625
2021.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**212,430**	**10,077,786**	**95,143**	**10,399,820**

පිටු අංක 108 සිට 124 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සමූහය		සංස්ථාව	
	2021	2020	2021	2020
	රු. 000	රු.000	රු. 000	රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය)	1,304,212	2,439,659	1,262,996	2,500,789
ගැලපීම්;				
ක්‍රමක්ෂය සහ ක්ෂයවීම්	350,159	415,170	318,257	386,302
මූල්‍ය පිරිවැය	267,924	529,534	263,682	526,751
මූල්‍ය ආදායම	(378,226)	(386,412)	(368,978)	(397,162)
විලම්බිත ආදායම් ක්‍රමක්ෂය කිරීම	(222,586)	(203,982)	(222,586)	(203,982)
අවිනිශ්චිත ණය සඳහා වෙන්කිරීම්	-71,832	171,886	(24,438)	141,132
කපා හල බොල් ණය	81,501	-	81,501	-
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලත් ලාභය	(136)	(14)	(115)	-
සෙමින් සංසරණය වන තොග සඳහා වෙන්කිරීම්	9,220	(4,730)	9,220	(4,730)
අර්ථදැක්වූ ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන්කිරීම්	92,035	89,375	49,031	48,830
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**1,432,271**	**3,050,486**	**1,368,570**	**2,997,930**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්				
තොග (වැඩිවීම) / අඩුවීම	(17,408)	66,460	25,267	42,106
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් - (වැඩිවීම) / අඩුවීම	504,705	718,771	484,489	821,647
වෛද්‍ය අරමුදල- වැඩිවීම/ (අඩුවීම)	13,625	-1,502	13,625	-1,502
ගෙවිය යුතු වන්දි - වැඩිවීම/ (අඩුවීම)	3,341	-	3,341	-
ලැබූ අත්තිකාරම් - වැඩිවීම / (අඩුවීම)	(304,890)	635,345	(304,890)	635,345
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	12,115	314,933	45,828	262,317
මෙහෙයුම්වලින් ලත් මුදල්	1,643,759	4,784,493	1,636,230	4,757,843
ගෙවූ ආදායම් බදු	(43,814)	(25,413)	(37,649)	(25,250)
ගෙවූ පාරිතෝෂික	(53,764)	(47,717)	(44,019)	(39,918)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මුදල්	**1,546,181**	**4,711,363**	**1,554,562**	**4,692,675**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
දේපල පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම	(79,684)	(71,741)	(69,124)	(65,958)
ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය	(146,332)	(577,457)	(135,644)	(562,882)
ලැබූ පොළී ආදායම	462,986	388,525	450,978	401,370
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලැබීම්	8,679	1,640	2,776	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**245,649**	**(259,033)**	**248,986**	**(227,470)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය				
ලබාගත් ණය	-	1,050,000	-	1,050,000
ණය නැවත ගෙවීම	(1,829,214)	(1,537,876)	(1,827,697)	(1,537,206)
ණය සඳහා ගෙවූ පොලිය	(282,165)	(563,183)	(278,937)	(549,643)
ගෙවූ කල්බදු වාරික	(7,312)	(7,912)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මූල්‍ය	**(2,118,691)**	**(1,058,971)**	**(2,106,634)**	**(1,036,849)**
මුදල් සහ මුදල් හා සමාන දෑවල වැඩිවීම්/(අඩුවීම)	(326,861)	3,393,359	(303,086)	3,428,356
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	4,072,302	678,943	3,975,252	546,896
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 15)	**3,745,441**	**4,072,302**	**3,672,166**	**3,975,252**

පිටු අංක 108 සිට 124 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

සැලකිය යුතු ගිණුම් ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වන අතර ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. සංස්ථාව, 1968 අංක 15 දරන පනතින් 1968 වර්ෂයේ සැප්තැම්බර් මස 22 දින සංස්ථාගත කර ඇත.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2021 දෙසැම්බර් මස 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනවලට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම් දෙකෙහි (එක්ව ගත්කළ ‘‘සමූහය’’ ලෙසින් හඳුන්වන) ගිණුම්වලින් සමන්විත වේ. සංස්ථාව සහ එහි අනුබද්ධිත ආයතනයට දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පවතී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට හඳුනාගත හැකි කිසිදු මව් සමාගමක් නොමැත. සමූහයෙහි අවසන් මව් සමාගම සංස්ථාව වේ

1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළදී සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

ආයතනයේ නම	ව්‍යාපාරවල ස්වභාවය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	අපවහන වැඩි දියුණු කිරීම්, ඉඩම් සංවර්ධනය කිරීම්, නාගරික භූමි අලංකරණ, තෙත් බිම් කළමනාකරණය, අක්-වෙරළ වැලි හැරීම සහ විකිණීම, කසළ කළමනාකරණය, සිවිල් ඉදිකිරීම සහ සම්බන්ධිත ඉංජිනේරු සේවාවන් සැපයීම
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම	සිමෙන්ති ගල් සහ පෙරැදි අයිතම නිෂ්පාදනය කිරීම, අක්වෙරළ වැලි පැකට් කිරීම සහ අළෙවි කිරීම, සිවිල් ඉදිකිරීම්
LRDC සර්විසස් (පෞද්.) සමාගම	ආරක්ෂක සහ මිනිස්බල සේවා සැපයීම

සංස්ථාවේ පරිපාලිත සමාගම් දෙකම සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සමූහයේ ඒකාබද්ධ ගිණුම්කරණ ප්‍රකාශන සකස් කර ඇත.

2.1.2 අගය කිරීමේ පදනම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත

2.1.3 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී මුදල් වර්ගය

සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත

2.1.4 අනුකූලවීමේ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (‘‘මූල්‍ය ප්‍රකාශන’’) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර ඇත

2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව සහ එහි පරිපාලිත සමාගම් පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර මෙහෙයුම් ඇවර කිරීමට හෝ අඩු කිරීමට ඔවුන්ගේ අදහසක් නොමැත

2.1.6 ආයතනික තොරතුරු

‘‘මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම’’ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත– LKAS 01 ට අනුකූලව සංස්ථාව සහ සමූහය විසින් පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරව යොදාගෙන ඇත. වර්තමාන ඉදිරිපත් කිරීම් හා අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

2.1.7 ද්‍රව්‍ය සමූහනය සහ භිලව් කිරීම

ගිණුම්කරණ ප්‍රමිතයකින් අවශ්‍ය කරන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් මිස වත්කම් සහ බැරකම්, ආදායම සහ වියදම් භිලව් කිරීම සිදු කරනු නොලැබේ.
එක් එක් අයිතම ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අදාළ වන්නේ නම් පමණක් සමාන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් එක් කර ඉදිරිපත් කරනු ලැබේ.

2.1.8 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වාර්තා කර ඇති ආදායම, වියදම්, වත්කම් සහ බැරකම් වටිනාකම් සහ අනාවරණය කිරීම් සඳහා බලපෑම් ඇති කරනු ලබන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මෙම තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන හේතුවෙන් වත්කම් හා බැරකම්වල පවතින වටිනාකමට සිදුවන කවර හෝ සැලකිය යුතු ගැලපීමක් ඉදිරි මූල්‍ය වර්ෂයේදී සලකා බලනු ලැබේ.

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉදිරියට.,)

2.2 ඒකාබද්ධ වීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2021 දෙසැම්බර් මස 31 වැනි දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත වේ. අත්පත් කරගත් දින සිට පරිපාලිත සමාගම් ඒකාබද්ධ වන අතර එදින සිට සමූහය විසින් පාලනය ලබා ගන්නා අතර එම පාලනය අවසන් වන දින දක්වා ඒකාබද්ධ වී සිටී

අ) පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සෘජුව පාලනය කිරීම සඳහා සමූහයට බලය පවතින සාමාන්‍යයෙන් ඡන්ද හිමිකමෙන් අඩකට වඩා වැඩි කොටස් හිමිකාරිත්වයක් දරන සියලු ආයතන වේ. සමූහය විසින් වෙනත් ආයතනයක් පාලනය කරනු ලබන්නේද යන්න ඇගයීමේදී, වර්තමානයේදී ක්‍රියාවේ යෙදවිය හැකි හෝ පරිවර්තනය කළ හැකි භව්‍ය ඡන්ද හිමිකාරිත්වයේ පැවතීම සහ බලපෑම සළකා බලනු ලැබේ. පාලනය සමූහයට මාරු කරන ලද දින සිට පරිපාලිත සමාගම් සම්පූර්ණයෙන් ඒකාබද්ධ වේ. එම පාලනය අවසන් වන දිනෙන් ඒවා ඒකාබද්ධතාවයෙන් ඉවත් වේ

ආයතනයේ නම	ඵලදායී අයිතිය
ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO)	80%
LRDC සර්විසස් (පෞද්.) සමාගම	80%

සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මුළු ලාභ සහ අලාභ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත. සංස්ථාවේ මෙන්ම එහි පරිපාලිත සමාගම්වල සියලු වත්කම් සහ බැරකම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත.

ආ) සුළු කොටස් හිමි අයිතිය

සමූහයේ ශුද්ධ වත්කම්වල පිටස්තර කොටස් හිමියන්ගේ බැඳියාව සහ පිටස්තර කොටස් හිමියන් සඳහා යෙදිය හැකි බදු පසු ලාභයෙහි ප්‍රමාණය "පාලනය නොකළ බැඳියාව" යන මාතෘකාව යටතේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සහ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වෙන් වෙන් වශයෙන් දක්වනු ලැබේ.

ඇ) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙනු

අන්තර් සමූහ ගනුදෙනුවලින් පැන නඟින සියලු අන්තර් සමූහ ශේෂයන්, ආදායම සහ වියදම සහ උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ

2.3 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

2.3.1 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගත් හෝ ඉදිකළ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්‍රමක්ෂයට දක්වනු ලැබේ. එමඟින් අපේක්ෂිත භාවිතය සඳහා වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ආරෝපණය කළ හැකි කවර හෝ පිරිවැයක් මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයට ඇතුලත් වේ.

ක්ෂයවීම

දේපල, පිරියත සහ උපකරණවල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීව කාලය තුළ සරල රේඛීය පදනමින් ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් කර ඇති පරිදි ක්ෂය කරනු ලැබේ.

කල්බදු ඉඩම්	කල්බදු කාල පරිච්ඡේදය තුළ
ගොඩනැගිලි-ස්ථීර	වර්ෂ තුළ 20
ගොඩනැගිලි-අර්ධ ස්ථීර	වර්ෂ 10තුළ
අයිතිය හිමිසතු ඉඩම්වල පවතින ව්‍යුහ	වර්ෂ තුළ 10
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	වර්ෂ තුළ 10
කාර්යාල උපකරණ	වර්ෂ තුළ 08
සැහැල්ලු මගී වාහන	වර්ෂ තුළ 05
පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	
- පස් ඉවත් කිරීමේ සහ හැරීමේ උපකරණ	වර්ෂ තුළ 10
- ද්‍රව්‍ය හැසිරවීමේ උපකරණ	වර්ෂ තුළ 10
-වෙනත් පිරියත සහ යන්ත්‍රසූත්‍ර	වර්ෂ තුළ 4
සන්නිවේදන උපකරණ	වර්ෂ තුළ 4
පාපැදි සහ කුඩා වැඩපොළ උපකරණ	වර්ෂ තුළ 2
කන්ටේනර් නිවාස	වර්ෂ තුළ 10

සින්නක්කර ඉඩම්වල පිරිවැය කපා හැරීම සඳහා ක්ෂය කිරීම් සපයා නොමැත.

වත්කමක ක්ෂය, වත්කම භාවිතයට ගැනීම සඳහා පවතින දින සිට ආරම්භ වන අතර වත්කම හඳුනානොගන්නා දිනෙන් අවසන් වේ

2.3.2 ආයෝජන දේපල

ආයෝජන දේපලක් යනු කුලී ආදායමක් උපයා ගැනීම සඳහා තබා ගන්නා දේපල වන අතර සාමාන්‍ය ව්‍යාපාරයක ලෙස අළෙවි කිරීමට හෝ නිෂ්පාදනය සඳහා හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ පරිපාලන කාර්යයන් සඳහා හෝ භාවිතා කරනු ලබන ඒවා නොවේ. ආයෝජන දේපල අත්පත් කර පිරිවැය සහ පසුව සිදුවන සංවර්ධන පිරිවැයට දක්වනු ලැබේ.

2.3.3 තොගය

යල් පිනු සහ සෙමින් සංසරණය වන අයිතම සඳහා ගෙවිය යුතු දීමනා වෙන් කිරීමෙන් පසු පිරිවැයට සහ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකම අඩු කර තොගය තක්සේරු කරනු ලැබේ. සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික තොගය විකිණිය හැකි මිල ගණන ශුද්ධ උපලබ්ධි වටිනාකම වේ.

තොගය පරිභෝජනය කරන විට හෝ විකුණන විට බර තැබූ සාමාන්‍ය පිරිවැය සූත්‍රය භාවිතා කරමින් තොගය පිරිවැය ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ

2.3.4 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සිදු කෙරෙමින් පවතින දීර්ඝ කාලීන ව්‍යාපෘති හා සම්බන්ධ සිදු කෙරෙමින් පවතින වැඩ, ද්‍රව්‍ය සහ ශ්‍රමය සමන්විත වන සෘජු පිරිවැයට සහ ව්‍යාපෘති සඳහා ආරෝපණය කළ හැකි සෘජු පොදු කාර්ය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉදිරියට.,)

2.3.5 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ

අගය අඩු වීම සඳහා වෙන් කිරීම් හැර ඉතිරි අගය ලබා ගැනීම සඳහා වෙළඳ ලැබිය යුතු දෑ ඇස්තමේන්තු කරන ලද වටිනාකමට ඒවා හඳුනාගනු ලැබේ. වෙනත් ලැබිය යුතු දෑ සහ සම්බන්ධිත පාර්ශවවලින් හිඟ මුදල් සාධාරණ අගය අඩු කිරීම අගය අඩු වීම සඳහා වෙන් කිරීමට හඳුනාගනු ලැබේ. ඒවායේ නැවත අයකරගත හැකි මට්ටම සලකා බලමින් බොල් සහ අඩමාන ණය සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

2.3.6 මුදල් සහ මුදල් හා සමාන දෑ

දන්නා මුදල් ප්‍රමාණයක් සඳහා කඩිනමින් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි වෙනස් වීම සඳහා නොසළකා හැරිය හැකි මට්ටමේ අවදානමක් සහිත අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලීතාවයක් සහිත ආයෝජන මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස අර්ථ දක්වනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍යතාවය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ, අත ඇති මුදල් සහ බැංකු අයිරා හැර REPO සහ භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව බැංකු තැන්පතුවලින් සමන්විත වේ.

2.3.7 රජයේ ප්‍රදාන

දීර්ඝ කාලීන වත්කම් ආකාරයෙන් ලැබෙන රජයේ ප්‍රදාන, විලම්බිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර ප්‍රාග්ධන ප්‍රවේශය පදනම් කර ගනිමින් වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ආදායමක් ලෙස වාර්ෂිකව හඳුනාගනු ලැබේ.

මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂය තුළ ලැබුනු රජයේ ප්‍රදාන (දීර්ඝ කාලීන වත්කම් හැර) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි සම්පූර්ණයෙන් හඳුනාගෙන ඇත. සේවා අංශයේ පිරිවැය ඇතුළුව සම්බන්ධිත පිරිවැය ප්‍රදානයට එරෙහිව සංස්ථාව විසින් වියදමක් ලෙස හඳුනාගැනේ.

රජයේ ප්‍රදානයන් හා සම්බන්ධිත කොන්දේසි සහ අවිනිශ්චිතතා සලකා බලනු ලබන අතර අනාවරණය කරනු ලැබේ.

2.4 බැරකම් සහ වෙන් කිරීම්

2.4.1 බැරකම්

